# වාර්ෂික වාර්තාව

# 2014

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

අංක 18, වෝඩ් පෙදෙස, කොළඹ 07

ශ්‍රී ලංකාව.

# උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
# වාර්ෂික වාර්තාව - 2014


| ඇතුලත | පිටු අංකය |
|---|---|
| **හැඳින්වීම හා පසුබිම** | |
| ගරු අමාත්‍යතුමා ........................................ | i |
| ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා........................................ | i |
| ප්‍රධාන නිලධාරින් ........................................ | i |
| අංශ භාර මාණ්ඩලික නිලධාරින් ........................................ | ii |
| අධීක්ෂණය යටතේ ඇති විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන............................ | iii |
| අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතන හා ව්‍යාපෘතිවල ප්‍රධානීන්............... | iii |
| **දැක්ම,මෙහෙවර, අරමුණු, ප්‍රධාන කාර්යය සාධක දර්ශක** | iv |
| **උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අංශ හා ඒවායේ ක්‍රියාකාරකම්** | |
| පාලන අංශය........................................ | 1 |
| ආයතන අංශය........................................ | 11 |
| ප්‍රසම්පාදන අංශය........................................ | 17 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ........................................ | 24 |
| සංවර්ධන අංශය........................................ | 26 |
| රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය........................................ | 47 |
| සැලසුම් අංශය........................................ | 57 |
| ගිණුම් අංශය........................................ | 64 |
| මාධ්‍ය අංශය........................................ | 68 |
| කවිතා Talent ව්‍යාපෘතිය ........................................ | 72 |
| ශිෂ්‍ය කටයුතු හා ශිෂ්‍ය සුභ සාධක අංශය........................................ | 76 |
| අභ්‍යන්තර විගණන අංශය........................................ | 79 |
| ලේකම් කාර්යාලය........................................ | 81 |
| නායකත්ව පුහුණු ව්‍යාපෘතිය........................................ | 84 |
| 21 වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය ........................................ | 91 |
| අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය ........................................ | 96 |
| දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය ........................................ | 102 |

# උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

(2014.01.01 දින සිට 2014.12.31දිනට)

ගරු එස්.බී.දිසානායක මැතිතුමා

උසස් අධ්‍යාපන අමාත්‍ය

ගරු. නන්දිමිත්‍ර ඒකනායක මැතිතුමා

උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය

## ප්‍රධාන නිලධාරීන්

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා

ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

පියසේන රණෙෂ්පුර මහතා

ඩග්ලස් නානායක්කාර මහතා

පී.ජී. ජයසිංහ මහතා

අතිරේක ලේකම්වරු

## මාණ්ඩලික නිලධාරීන්
## (2014.01.01 සිට 2014.12.31 දක්වා)

**පාලන අංශය**

පී.ජී. ජයසිංහ මහතා, අතිරේක ලේකම් (පාලන හා මුදල්)
වයි.එල්.එම්. නවවි මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ඒ.එස්.පී. වීරසූරිය මහත්මිය, සහකාර ලේකම්

**ආයතන අංශය**

පී.ජී. ජයසිංහ මහතා,අතිරේක ලේකම් (පාලන හා මුදල්)
වයි.එල්.එම්. නවවි මහතා,ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
එච්.ඩී.එස්.එන්. හෙට්ටිගේ මහතා,සහකාර ලේකම්

**ප්‍රසම්පාදන අංශය**

පී.ජී. ජයසිංහ මහතා, අතිරේක ලේකම් (පාලන හා මුදල්)
සෝමනාත් ගමගේ මහතා, අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)

**යටිතල පහසුකම් සංවර්ධන අංශය**

පී.ජී. ජයසිංහ මහතා, අතිරේක ලේකම් (පාලන හා මුදල්)

**තොරතුරු තාක්ෂණ අංශය**

පී.ජී. ජයසිංහ මහතා, අතිරේක ලේකම් (පාලන හා මුදල්)
ලලිත් වඩුගේ මහතා, අධ්‍යක්ෂ
එච්.ඩී.එස්.එන්. හෙට්ටිගේ මහතා, සහකාර ලේකම්
(තොරතුරු තාක්ෂණ) (රාජකාරි ආවරණ)
නීති කටයුතු අංශය

**විශේෂ ව්‍යාපෘති අංශය**

පී.ජී. ජයසිංහ මහතා, අතිරේක ලේකම් (පාලන හා මුදල්)
සුනිල් ගුණවර්ධන මහතා, ජ්‍යෙෂ්ඨ උපදේශක( ක්‍රීඩා හා කුසලතා සංවර්ධන)
කීර්ති මාවැල්ලගේ මහතා, ජ්‍යෙෂ්ඨ උපදේශක (ශිෂ්‍ය කටයුතු හා ශිෂ්‍ය සුභසාධන )
සෝමනාත් ගමගේ මහතා, අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන හා යටිතල පහසුකම් සංවර්ධන)
එස්.ටී.නන්දසාර මහතා, ව්‍යාපෘති අධ්‍යක්‍ෂ (Cloud Based Management Information System)

### උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අංශභාර

ඒ.එස්.පී. වීරසූරිය මහත්මිය, සහකාර ලේකම් (පාලන)
එච්.ඩී.එස්.එන්. හෙට්ටිගේ මහතා,සහකාර ලේකම් (ආයතන)

නායකත්ව පුහුණු වැඩසටහන
Cloud Based Management Information System
නේවාසිකාගාර 60 ඉදිකිරීමේ කඩිනම් ව්‍යාපෘතිය

**සංවර්ධන අංශය**

පී. රණේපුර මහතා, අතිරේක ලේකම් (සංවර්ධන)
බී.එම්.එස්. බණ්ඩාර මහත්මිය, අධ්‍යක්ෂ (සංවර්ධන)
කේ.ඒ.පී. පෙරේරා මහත්මිය, සහකාර අධ්‍යක්ෂ (ශිෂ්‍යත්ව)
ජේ.ඒ.ඩී.එස්. ජයසිංහ මෙනවිය,සහකාර අධ්‍යක්‍ෂ (සංවර්ධන)

**රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය**

ඩග්ලස් නානායක්කාර මහතා, අතිරේක ලේකම්,
(රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන)

**ක්‍රීඩා හා කුසලතා සංවර්ධන අංශය**

සුනිල් ගුණවර්ධන මහතා, ජ්‍යෙෂ්ඨ උපදේශක (ක්‍රීඩා හා කුසලතා සංවර්ධන)

**ශිෂ්‍ය කටයුතු හා ශිෂ්‍ය සුභසාධන අංශය**

කීර්ති මාවැල්ලගේ මහතා , ජ්‍යෙෂ්ඨ උපදේශක
(ශිෂ්‍ය කටයුතු හා ශිෂ්‍ය සුභසාධන)

**සැලසුම් අංශය**

ජී.එම්.ආර්.ඩී.අපොන්සු මහතා, අධ්‍යක්ෂ (සැලසුම්)
එච්.පී.ආර්.පී.ප්‍රනාන්දු මහත්මිය,සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
එච්.එල්.ජී.දිල්රුක්ෂි මහත්මිය, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)

**මුදල් අංශය**

ඩබ්.ඩී.එල්.දුෂ්මන්ත මහතා, ප්‍රධාන ගණකාධිකාරී/
ප්‍රධාන මූල්‍ය නිලධාරි
ඩී.කේ.ඩී.ජී.ලක්මාලි මෙනවිය, ගණකාධිකාරී

**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

කේ.වී.එස්. ද සිල්වා මහත්මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක

## උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ඇති විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**විශ්වවිද්‍යාල**

1. කොළඹ විශ්වවිද්‍යාලය
2. පේරාදෙණිය විශ්වවිද්‍යාලය
3. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
4. කැලණිය විශ්වවිද්‍යාලය
5. මොරටුව විශ්වවිද්‍යාලය
6. යාපනය විශ්වවිද්‍යාලය
7. රුහුණ විශ්වවිද්‍යාලය
8. විවෘත විශ්වවිද්‍යාලය
9. රජරට විශ්වවිද්‍යාලය
10. සබරගමුව විශ්වවිද්‍යාලය
11. වයඹ විශ්වවිද්‍යාලය
12. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
13. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
14. නැගෙනහිර විශ්වවිද්‍යාලය
15. ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය

**පශ්චාත් උපාධි ආයතන**

1. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2. කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
3. පාලි හා බෞද්ධ පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය
4. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
5. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
6. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
7. ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය

**උසස් අධ්‍යාපන ආයතන**

1. මානව සම්පත් අභිවර්ධන ආයතනය
2. දේශීය වෛද්‍ය විද්‍යායතනය
3. කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල
4. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද අධ්‍යයන ආයතනය
5. ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයන ආයතනය
6. මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණආයතනය
7. ජීව - රසායන, අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ අධ්‍යයන ආයතනය
8. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා අධ්‍යයන ආයතනය
9. ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය
10. කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා සඳහා වන අධ්‍යාපන ආයතනය

## උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ව්‍යවස්ථාපිත ආයතන හා ව්‍යාපෘතිවල ප්‍රධානීන්

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
පූජ්‍ය ආචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ ස්ථවිරයන් වහන්සේ, මහෝපාධ්‍යාය

බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
පූජ්‍ය මහාචාර්ය ඉත්තදෙමලියේ ඉන්දසර ස්ථවිරයන් වහන්සේ, මහෝපාධ්‍යාය
පූජ්‍ය මහාචාර්ය ගල්ලැල්ලේ සුමනසිරි ස්ථවිරයන් වහන්සේ, මහෝපාධ්‍යාය (2014.10.30 දින සිට)

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
ඩබ්.හිලරි ඊ සිල්වා මහතා, අධ්‍යක්ෂ ජනරාල්

21 වන සියවස සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතිය
මහාචාර්ය එල්.එල්.රත්නායක මහතා, ව්‍යාපෘති අධ්‍යක්ෂ
මහාචාර්ය කේ.ඒ.නන්දසේන මහතා, ව්‍යාපෘති අධ්‍යක්ෂ (2014.10.01 දින සිට)

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය
ජේ.ඒ.සමරකෝන් මහතා, ව්‍යාපෘති අධ්‍යක්ෂ

සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය
කිත්සිරි සන්ධ්‍යා පතිරණ මහතා, ව්‍යාපෘති අධ්‍යක්ෂ

ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය
එස්.වී.නන්දසාර මහතා, අධ්‍යක්ෂ

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දැක්ම**

වසර 2020 වන විට ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ටතම ජාත්‍යන්තර මධ්‍යස්ථානයක් බවට පත්කිරීම.

**මෙහෙවර**

ප්‍රතිඵල අරමුණු කොටගත් ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් ශ්‍රීලංකා උසස් අධ්‍යාපන පද්ධතියේ ශිෂ්‍යයන්, ක්ෂේත්‍රය, කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීම, සහභාගිත්ව ක්‍රියාවලියක් තුළින් සාධනීය සහ කාර්යක්ෂම ආකාරයට ප්‍රතිඵල නිකුත් කිරීම, සුවිශිෂ්ට බුද්ධිමතුන්, වෘත්තිකයන්, පර්යේෂකයන් සහ ව්‍යවසායකයින් නිර්මාණය කිරීම සහ ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත්කිරීම සඳහා නව්‍ය විසඳුම් ලබා දීම.

**අරමුණු:**

- උසස් අධ්‍යාපනය වෙත ප්‍රවේශය සහ අවස්ථා වැඩි කිරීම
- සියළු උසස් අධ්‍යාපන ආයතන ලෝක ශ්‍රේණිගත කිරීම් අගය ඉහළ නැංවීම
- උපාධිධාරීන්ගේ රැකියාවක නිරත වීමේ හැකියාව වැඩි දියුණු කිරීම
- පාර්ශවකරුවන්ගේ තෘප්තිය වැඩි කිරීම
- උසස් අධ්‍යාපන ආයතනයන්ගේ ගෝලීය අනුකූලතාව වැඩි කිරීම
- පර්යේෂණ සහ ප්‍රකාශන පිළිබඳ විශිෂ්ටත්වය
- ගෝලීය සබඳතා සහ හුවමාරු වැඩි දියුණු කිරීම
- භාණ්ඩාගාරය මත යැපෙන ස්වභාවය අඩු කිරීම
- උපාධිධාරීන්ගේ ව්‍යවසායකත්වය වැඩි කිරීම
- උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සාධනීයභාවය සහ කාර්යක්ෂමතාවය වැඩි කිරීම
- ජාතික සංවර්ධනය සහ ශ්‍රී ලංකාවේ දිගුකාලීන දැක්ම කෙරෙහි දායක වීම
- ජාතික ප්‍රතිසංධානය සහ ගෝලීය සාමය වෙත දායක වීම

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

- උසස් අධ්‍යාපනය සඳහා ඇතුළත් වීමේ දළ අනුපාතය
- විශ්වවිද්‍යාලවල ලෝක ශ්‍රේණිගත කිරීම
- උපාධිධාරීන්ගේ රැකියා නියුක්තභාවය
- ප්‍රාග්ධන අයවැය උපයෝගීතාවය
- යටිතල පහසුකම් සංවර්ධනය
- අධ්‍යයන කාර්ය මණ්ඩලය තුළ ආචාර්ය උපාධි දරන අනුපාතය
- ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම්
- විදේශ සිසුන් ඇතුලත් කර ගැනීම
- ව්‍යවසායක උපාධිධාරීන්
- ශ්‍රී ලංකාව තුළ ලොව ප්‍රමුඛ පෙළ විදේශ විශ්වවිද්‍යාල සහ දැනුමේ පුරවර

## පාලන අංශය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය


උසස් අධ්‍යාපනය නංවාලීම පිණිස උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉටු කරනු ලබන කාර්යයන්හි ගුණාත්මකභාවය නංවාලීම සහ පවත්වාගැනීම සඳහා අවශ්‍ය භෞතික වටපිටාව නිර්මාණය කිරීම, අඛණ්ඩ සහ ඵලදායී ආකාරයෙන් සේවා සැපයීම, අනෙකුත් ආයතන සමඟ විධිමත් සම්බන්ධීකරණයක් ඇති කිරීම හා පවත්වාගැනීම, කාර්ය මණ්ඩලයේ සුභසාධක පහසුකම් නංවාලීම සහ අමාත්‍යාංශයේ සමස්ත පරිපාලනය, මෙහෙයවීම පාලන අංශය මඟින් සිදු කරනු ලැබේ.

**පාලන අංශයේ කාර්යභාරය -**

- අමාත්‍යාංශයේ යටිතල පහසුකම් කාර්යක්ෂම සහ සඵලදායී ආකාරයට සැපයීම, ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර හා නඩත්තු සම්බන්ධයෙන් අදාළ ආයතනයන්ගෙන් සේවා ලබාගැනීම සහ පවත්වා ගැනීම.
- දෛනිකව අමාත්‍යාංශය වෙත ලැබෙන හා බැහැර යැවෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම හා එහි සාධනීය බව සහතික කිරීම.
- අමාත්‍යාංශයේ ආරක්ෂක කටයුතු හා පවිත්‍රතා කටයුතු නිසි පරිදි පවත්වා ගැනීම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ රාජකාරි දුරකථන බිල්පත් පියවීම.
- අමාත්‍යාංශයේ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම.
- අමාත්‍යාංශයේ සියලු වාහන ලියාපදිංචි කිරීම, නඩත්තු කිරීම, රක්ෂණය කිරීම, ආදායම් බලපත්‍ර ලබා ගැනීම හා සියලු සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීම.
- මුදල් රෙගුලාසි 104 පරිදි වාහන අනතුරු සම්බන්ධයෙන් පියවර ගැනීම හා අදාල අනතුරු සඳහා රක්ෂණ වන්දි නියමිත පරිදි ලබා ගැනීම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ විදේශ සංචාර සම්බන්ධ විදේශ ගමන් බලපත්‍ර, වීසා, ගමන් වියදම් හා දීමනා ලබාදීම පිළිබඳ කටයුතු හා දිවයිනෙන් බැහැර යාම සඳහා අවසර ගැනීමේ කටයුතු ඉටු කිරීම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ නිවාඩු, අතිකාල හා ගමන් වියදම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ආපදා ණය, දේපල ණය, යතුරු පැදි ණය, උත්සව අත්තිකාරම් ලබා දීම සම්බන්ධ කටයුතු හා අග්‍රහාර රක්ෂණ ඉල්ලුම් කිරීම සම්බන්ධ කටයුතු සිදු කිරීම.
- අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශපත්‍ර සහ දුම්රිය ගමන් බලපත්‍ර (warrants) නිකුත් කිරීම.
- මැතිවරණ පවත්වන අවස්ථාවල දී ඒවාට සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
- අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම හා තීරණ අදාල පාර්ශව වෙත දැන්වීම.
- වෙනත් අමාත්‍යාංශ මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත යවනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න, උපදේශක කාරක සභා යෝජනා, මහජන පෙත්සම්, මානව හිමිකම් කඩවීම් හා ජනාධිපති කාර්යාලය හරහා හා විවිධ පාර්ශ්වයන්ගෙන් ලැබෙන පැමිණිලි, යෝජනා හා ඉල්ලීම් සඳහා සුදුසු පියවර ගැනීම.
- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.
- ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, ලේකම් සහ අමාත්‍යාංශ මාණ්ඩලික නිලධාරීන්ගේ රාජකාරි ගමන්වල දී නවාතැන් පහසුකම් වෙන් කිරීම හා බිල්පත් නිරවුල් කිරීම.

- මාණ්ඩලික නිලධාරීන් සඳහා අත්තිකාරම් ලබා දීම, අත්තිකාරම් පියවීම, ලේඛනගත කිරීම හා ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- සුළු නඩත්තු කටයුතු හා විවිධ සුළු මුදල් ගෙවීම් සම්බන්ධ සුළු මුදල් අග්‍රිමය ලබා ගැනීම හා පියවීම.
- කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් ලබා දීම.
- භාෂා පරිවර්තන වෙනුවෙන් ගෙවීම් කිරීම.
- ගෙවල් කුලී දීමනා ගෙවීම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ සංග්‍රහ වියදම්, විවිධ වියදම් ප්‍රතිපූර්ණය කිරීම හා බිල්පත් නිරවුල් කිරීම.
- ජනාධිපතිවරණය, මහමැතිවරණය, පළාත් සභා මැතිවරණ හා පළාත් පාලන මැතිවරණ ඇතුළු ඡන්ද විමසීම්වලට අදාල මැතිවරණ චක්‍රලේඛ අදාළ පාර්ශව වෙත දැනුම් දීම, එම මැතිවරණවලට අදාලව තැපැල් ඡන්දය දීම සම්බන්ධීකරණය සහ මැතිවරණ රාජකාරි සඳහා නිලධාරීන් පත් කිරීමේ කටයුතු සහ මැතිවරණ රාජකාරී වෙනුවෙන් ගෙවීම් නිරවුල් කිරීමේ කටයුතු.
- පාලන අංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන යාම හා අංශයට අදාල ලිපිද්‍රව්‍ය ඉල්ලුම් කිරීම, භාරගැනීම හා බෙදාහැරීම.
- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් රජයේ ආයතනවලින් ලැබෙන චක්‍රලේඛ හා නියෝග වෙන් වෙන් වශයෙන් ගොනු කිරීම හා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- නායකත්ව පුහුණුව සඳහා වන ගෙවීම් කිරීම, එම වියදම් සාරාංශ සැකසීම
- ලේඛනාගාරය භාරව කටයුතු කිරීම.
- සිංහල-ඉංග්‍රීසි හා ඉංග්‍රීසි-සිංහල භාෂා පරිවර්තන කටයුතු
- පිළිගැනීමේ කවුළුවෙහි කටයුතු සිදු කිරීම, දුරකථන හුවමාරුවට ලැබෙන ඇමතුම් අදාල පාර්ශව වෙත යොමු කිරීම, බාහිර පාර්ශව දුරකථනය ඔස්සේ සම්බන්ධ කර දීම.
- අමාත්‍යාංශ පුස්තකාලය පවත්වා ගෙන යාම
- ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය (NODES), විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතිය (HETC), සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය හා අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතියට අදාළ ආයතන කටයුතු සිදු කිරීම.
- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සියලු කටයුතු

# සංවිධාන සටහන - පාලන අංශය



පාලන අංශයේ එක් එක් රාජකාරී කටයුතු ඒ ඒ නිලධාරියා වෙත බෙදා දී ඇති ආකාරය පහත පරිදි වේ.

<u>සංවර්ධන නිලධාරින්</u>

**පී.එම්.එස්.දයානන්ද මහතා,**

- අමාත්‍යාංශයේ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම.
- අමාත්‍යාංශයේ සියලු වාහන ලියාපදිංචි කිරීම, අලුත්වැඩියා හා නඩත්තු කිරීම සහ රක්ෂණය කිරීම,ආදායම් බලපත්‍ර ලබා ගැනීම හා සියලු සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීම.
- වාහන ලේඛනය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම
- මුදල් රෙගුලාසි 104 පරිදි වාහන අනතුරු සම්බන්ධයෙන් පියවර ගැනීම හා අදාල අනතුරු සඳහා රක්ෂණ වන්දි නියමිත පරිදි ලබා ගැනීම.

**එච්.එන්.පුෂ්පකුමාර මහතා,**

- අමාත්‍යාංශ නිලධාරීන්ගේ රාජකාරි දුරකථන බිල්පත් පියවීම.
- ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, ලේකම් සහ අමාත්‍යාංශ මාණ්ඩලික නිලධාරීන්ගේ රාජකාරි ගමන්වල දී නවාතැන් පහසුකම් වෙන් කිරීම හා බිල්පත් නිරවුල් කිරීම.
- මාණ්ඩලික නිලධාරීන් සඳහා අත්තිකාරම් ලබා දීම, අත්තිකාරම් පියවීම, ලේඛනගත කිරීම හා ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ සංග්‍රහ වියදම්, විවිධ වියදම් ප්‍රතිපූර්ණය කිරීම හා බිල්පත් නිරවුල් කිරීම.
- නායකත්ව පුහුණුව සඳහා වන ගෙවීම් කිරීම, එම වියදම් සාරාංශ සැකසීම.

<u>කළමනාකරණ සහකාර නිලධාරීන්</u>

**ඩී.එම්.සී.එල්.ගුණසේකර මහතා,**

- අමාත්‍යාංශයේ යටිතල පහසුකම් කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයට සැපයීම, ගොඩනැගිලි,යන්ත්‍ර සූත්‍ර හා නඩත්තු සම්බන්ධයෙන් අදාළ ආයතනයන්ගෙන් සේවා ලබාගැනීම සහ පවත්වා ගැනීම
- පාලන අංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන යාම හා අංශයට අදාල ලිපිද්‍රව්‍ය ඉල්ලුම් කිරීම, භාරගැනීම හා බෙදාහැරීම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ නිවාඩු, අතිකාල හා ගමන් වියදම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

**පී.ජී.බී.එම්.කුමාරතිලක මෙය**

- දෛනිකව අමාත්‍යාංශය වෙත ලැබෙන හා බැහැර යැවෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම හා එහි සාධනීය බව සහතික කිරීම.
- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් රජයේ ආයතනවලින් ලැබෙන චක්‍රලේඛ හා නියෝග වෙන් වෙන් වශයෙන් ගොනු කිරීම හා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.

**ඒ.ආර්.කෝට්ටෙගේ මෙනවිය**

- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි වාර්ෂික වාර්තා හා ගිණුම් නියමිත දිනට පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.
- අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම හා තීරණ අදාල පාර්ශව වෙත දැන්වීම.
- වෙනත් අමාත්‍යාංශ මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත යවනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න, උපදේශක කාරක සභා යෝජනා, මහජන පෙත්සම්, මානව හිමිකම් කඩවීම් සම්බන්ධව විවිධ පාර්ශ්වයන්ගෙන් ලැබෙන පැමිණිලි, යෝජනා හා ඉල්ලීම් අදාල පාර්ශව වෙත යැවීම සඳහා පියවර ගැනීම.
- ගෙවල් කුලී දීමනා ගෙවීම.
- මාසික දුම්රිය සීසන් ටිකට්පත් සහ දුම්රිය ගමන් බලපත්‍ර (warrants) නිකුත් කිරීම. කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් ලබා දීම.
- භාෂා පරිවර්තන වෙනුවෙන් ගෙවීම් කිරීම.

**ටී.එම්.පී.වණිගසූරිය මෙනවිය**

- අමාත්‍යාංශයේ ආරක්ෂක කටයුතු හා පවිත්‍රතා කටයුතු නිසි පරිදි පවත්වා ගැනීම.
- අමාත්‍යාංශ නිළධාරීන්ගේ විදේශ සංචාර සම්බන්ධ විදේශගමන් බලපත්‍ර, වීසා, ගමන් වියදම් හා දීමනා ලබාදීම පිළිබඳ කටයුතු හා දිවයිනෙන් බැහැර යාම සඳහා අවසර ගැනීම සම්බන්ධ කටයුතු ඉටු කිරීම.
- ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය (NODES), විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතිය (HETC), සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය හා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතියට අදාළ ආයතනික කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ආපදා ණය, දේපල ණය, යතුරු පැදි ණය, උත්සව අත්තිකාරම් ණය ලබා දීම සම්බන්ධ කටයුතු හා අග්‍රහාර රක්ෂණ කටයුතු සිදු කිරීම.
- මැතිවරණ පවත්වන අවස්ථාවල දී ඒවාට සම්බන්ධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම

**භාෂා පරිවර්තක - හිමේෂා පෙරේරා මහත්මිය**

- සිංහල-ඉංග්‍රීසි හා ඉංග්‍රීසි-සිංහල භාෂා පරිවර්තන කටයුතු

**<u>පිළිගැනීමේ නිලධාරින්</u>**

**සී.පී.රන්දෙනි මහත්මිය**

- පිළිගැනීමේ කවුළුවෙහි කටයුතු සිදු කිරීම, දුරකථන හුවමාරුවට ලැබෙන ඇමතුම් අදාල පාර්ශව වෙත යොමු කිරීම, බාහිර පාර්ශව දුරකථනය ඔස්සේ සම්බන්ධ කර දීම.
- අමාත්‍යාංශ පුස්තකාලය පවත්වා ගෙන යාම

**එස්.ටී.සොනාලි මෙනවිය**

- නායකත්ව පුහුණුවට අදාල දුරකථන ඇමතුම් සඳහා පිළිතුරු ලබා දීම
- ක්ෂණික දුරකථන ඇමතුම් අංක 1918 ඔස්සේ ලැබෙන ඇමතුම් සඳහා පිළිතුරු ලබා දීම.
- පිළිගැනීමේ කවුළුවෙහි කටයුතු සඳහා සහය වීම

**ලේඛනාගාර භාරකරු**

- ලේඛණාගාරය භාරව කටයුතු කිරීම.

**පණිවිඩකරු - ජේ.ඒ.සුනිල් ආනන්ද මහතා**

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තැපැල් මල්ල රැගෙන ඒම, කාර්යාලයෙන් බැහැර යැවෙන ලිපි හා පාර්සල් අදාළ ආයතනවලට හා නියමිත නිලධාරීන්ට භාර දීම.

**කාර්යාල කාර්ය සහයක (තැපැල්) - කේ.ඒ.බී.නිරෝෂන් මහතා**

- පාලන අංශයට අදාල, ලිපි ගොනු, විවිධ ලිපි, චක්‍රලේඛ හා නියෝග මාණ්ඩලික නිළධාරීන්, කාර්ය මණ්ඩල නිළධාරීන් සහ වෙනත් අංශ වෙත බෙදා හැරීම.
- අමාත්‍යාංශය වෙත දෛනිකව ලියාපදිංචි තැපෑලෙන්, සාමාන්‍ය තැපෑලෙන් සහ අතින් ගෙනවිත් භාරදෙන සියලුම ලිපි ලේඛණ හා පාර්සල් භාර ගෙන කළමනාකරණ සහකාර (තැපැල්) වෙත යොමු කිරීම හා එම ලිපි ලේඛණගත කිරීමෙන් පසු අදාල අංශ වෙත බෙදා හැරීම.
- අමාත්‍යාංශයේ විවිධ අංශ වලින් දෛනිකව ලියාපදිංචි තැපෑලෙන්, සාමාන්‍ය තැපෑලෙන් බැහැරට යැවීමට ලැබෙන ලිපි සඳහා නියමිත මුද්දර ගාස්තු තැපැල් මුද්‍රාව මගින් සලකුණු කර සියලු ලිපිලේඛණ හා පාර්සල් දිනපතා ප.ව 3.00ට පෙර තැපැල් කිරීම සහ ලියාපදිංචි තැපෑලට අයත් රිසිට්පත් ගොනුගත කිරීම.
- ඡායාපිටපත් යන්ත්‍රය සහ රිසෝග්‍රාෆ් යන්ත්‍රය හා ෆැක්ස් යන්ත්‍ර ක්‍රියාකරු ලෙස කටයුතු කිරීම.

**පාලන අංශයේ 2014 වර්ෂයේ මූලික කාර්යභාරයන්හි විස්තර පහත පරිදි වේ.**

2014 වර්ෂය තුල උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කිරීම, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ යෝජනා සඳහා පිළිතුරු සැපයීම. පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාවේ යෝජනා සඳහා පිළිතුරු සැපයීම හා පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම

| | | |
|---|---|---|
| 01 | අමාත්‍ය මණ්ඩල කාර්යාලයට යොමු කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ ප්‍රමාණය | 55 |
| 02 | පිළිතුරු සපයා ඇති උපදේශක කාරක සභා යෝජනා | 4 |
| 03 | පිළිතුරු සපයා ඇති පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභා යෝජනා | 3 |
| 04 | පිළිතුරු සපයා ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න | 18 |

2014 වර්ෂය තුළ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවලට අදාළ වාර්ෂික ගිණුම් හා පාලන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

| | |
|---|---|
| සාකච්ඡා කිරීම සඳහා අමාත්‍යාංශය වෙත භාර දී ඇති වාර්ෂික වාර්තා කෙටුම්පත් | 46 |
| අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර ඇති සංශෝධිත වාර්ෂික වාර්තා කෙටුම්පත් | 30 |
| පාර්ලිමේන්තුව වෙත භාර දී ඇති වාර්ෂික වාර්තා | 27 |
| අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සඳහා ලබා දී ඇති වාර්ෂික වාර්තා | 01 |

පරිගණක යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වායු සමීකරණ යන්ත්‍ර ආදිය පිළිබඳ තොරතුරු

| | | යන්ත්‍ර ප්‍රමාණය |
|---|---|---|
| 01. | පරිගණක යන්ත්‍ර | 95 |
| 02. | පරිගණක මුද්‍රණ යන්ත්‍ර | 42 |
| 03. | වායු සමීකරණ යන්ත්‍ර | 61 |
| 04. | ඡායාපිටපත් යන්ත්‍ර | 24 |
| 05. | ෆැක්ස් යන්ත්‍ර | 26 |
| 06. | රූපවාහිනි යන්ත්‍ර | 07 |
| 07. | ස්කෑනර් යන්ත්‍ර | 03 |
| 08. | ශීතකරණ | 03 |
| 09. | ඩුප්ලෝ යන්ත්‍ර | 02 |
| 10 | ශ්‍රෙඩර් යන්ත්‍ර | 01 |
| 11 | මුද්දර යන්ත්‍ර | 01 |

**<u>2014 වර්ෂයේ දී අමාත්‍යාංශයේ නඩත්තු කටයුතු සිදු කිරීම්</u>**

| කාර්යය | වටිනාකම |
|---|---|
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් | රු.417,991.91 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් නඩත්තු වියදම් | රු.417,151.10 |

**2014 වර්ෂයේ දී ජලය හා විදුලිය සැපයුම් ලබා ගැනීම**

| කාර්යය | 2013 | 2014 |
|---|---|---|
| විදුලිය | රු. 5,517,289.08 | රු.6,538,305.79 |
| ජලය | රු. 709,943.24 | රු.612,541.21 |

**2014 වර්ෂය තුල අමාත්‍යාංශයේ ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා පිළිබඳ තොරතුරු**

| කාර්යය | වියදම |
|---|---|
| ආරක්ෂක සේවාව සඳහා දරන ලද වියදම | රු.2,307,248.00 |
| සනීපාරක්ෂක සේවා සඳහා දරන ලද වියදම | රු.2,660,750.33 |

**2014 වර්ෂය තුල අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ විදේශ ගමන් සඳහා දරන ලද වියදම් පිළිබඳ විස්තර**

| | |
|---|---|
| ගරු අමාත්‍ය හා ගරු නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය | රු.6,374,865.85 |
| අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා | රු.4,735,221.16 |

**2014 වර්ෂය තුල අමාත්‍යාංශයේ අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ලබා දී ඇති ණය හා අත්තිකාරම් පිළිබඳ විස්තර**

| ණය/අත්තිකාරම් වර්ගය | නිලධාරින් සංඛ්‍යාව | ලබා දී ඇති මුදල |
|---|---|---|
| ආපදා ණය | 44 | රු.4,3847,160.50 |
| විශේෂ අත්තිකාරම් | 16 | රු.40,000.00 |
| උත්සව අත්තිකාරම් | 81 | රු. 405,000.00 |

2014 වර්ෂය තුල අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සහ එම කාර්යමණ්ඩල නිළධාරීන්ගේ දුරකථන බිල්පත් ගෙවීම සහ අමාත්‍යාංශ මාණ්ඩලික නිලධාරීන්ගේ දුරකථන බිල්පත් ගෙවීම

| විස්තරය | දුරකථන අංක සංඛ්‍යාව | ගෙවීම් කරන ලද බිල්පත් සංඛ්‍යාව |
|---|---|---|
| කාර්යාල දුරකථන | 49 | 588 |
| ෆැක්ස් | 14 | 168 |
| රාජකාරී නිවාස දුරකථන | 30 | 360 |
| ජංගම දුරකථන හා අන්තර්ජාල සම්බන්ධතා | 42 | 504 |
| අමාත්‍යාංශ අන්තර්ජාල සම්බන්ධතා | 2 | 24 |

**2014 වර්ෂයේදි උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබෙන තැපැල බෙදාහැරීම, පිටතට යවන තැපැල පිළිබඳ විස්තර**

- ලැබුණු ලිපි ප්‍රමාණය -18,849
- පිටතට යවන ලද ලිපි

| | ප්‍රමාණය | මුළු වියදම රුපියල් |
|---|---|---|
| සාමාන්‍ය තැපැල | 10,174 | රු.109,756.00 |
| ලියාපදිංචි තැපැල | 5877 | රු.252,105.00 |
| සාමාන්‍ය ගුවන් තැපැල | 42 | 3,160.00 |
| ලියාපදිංචි ගුවන් තැපැල | 01 | 175.00 |
| සාමාන්‍ය පාර්සල් තැපැල | 27 | 6,890.00 |
| ලියාපදිංචි පාර්සල් තැපැල | 01 | 600.00 |

**අමාත්‍යාංශයේ තැපැල් හා සන්නිවේදන වියදම්**

| කාර්යය | 2013 | 2014 |
|---|---|---|
| තැපැල් හා සන්නිවේදන වියදම් | රු.7,235,306.77 | රු.9,035,710.32 |

**2014 වර්ෂය තුල අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ නිවාඩු පිළිබඳ විස්තර**

| | සංයුතිය | ලබා ගත් නිවාඩු |
|---|---|---|
| මාණ්ඩලික නිලධාරීන් | 18 | 473 1/2 |
| සංවර්ධන සහකාර | 7 | 267 |
| සංවර්ධන නිලධාරීන් | 50 | 1295 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 31 | 771 1/2 |
| කාර්යාල කාර්ය සහයක | 21 | 414 |
| රියදුරු | 19 | 323 |
| වෙනත් නිලධාරීන් | 3 | 86 |
| එකතුව | **149** | **3630** |

- 2014 වර්ෂයේ රාජකාරී දින ගණන =241
- 2014 වර්ෂයේ මිනිස් පැය = 241 x 149 x 8 = 287,272
- නිවාඩු පැය = 3630 x 8 = 29,040
- ඵලදායි මිනිස් පැය ගණන = 287,272 - 29,040 = 258,232
- ඵලදායි මිනිස් පැය ප්‍රතිශතය = 89.89%

**2014 වර්ෂයේදි අමාත්‍යාංශයට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම**

| | කාර්යය | 2014 වර්ෂයේ වියදම (රු.) |
|---|---|---|
| 1. | වාහන අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම | 7,777,284.55 |
| 2. | සංචිත වාහන සඳහා සහ නිල වාහන හිමි නිලධාරීන් සඳහා අතිරේක ඉන්ධන ලබා දීම හා ඉන්ධන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම | 20,651,358.00 |
| 3. | වාහන රක්ෂණය කිරීම හා අදාළ බලපත්‍ර ලබා දීම සම්බන්ධ කටයුතු | 21,869,642.00 |
| 4. | දුම් පරීක්ෂණ | 23,033.00 |
| 5. | වාහන සඳහා ටයර්, ටියුබ්, බැටරි හා අනෙකුත් උපාංග සපයා දීම | 3,559,397.50 |
| 6. | කුළී වාහන ලබා ගැනීම | 7,295,580.00 |
| | **එකතුව** | **32,747,652.50** |

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සතු වාහන පිළිබඳ විස්තර**

**කාර් රථ**

| වාහන අංකය | වර්ගය |
|---|---|
| WP KL 6086 | බී.එම්.ඩබ්ලියු |
| WP KX 3743 | බී.එම්.ඩබ්ලියු |
| WP KL 4349 | බී.එම්.ඩබ්ලියු |
| WP KR 5637 | ටොයොටා යාරිස් |
| WP KF 7918 | සුසුකි ලියානා |
| WP KB 6995 | පර්ජෝ |
| WP KR 5688 | ටොයොටා යාරිස් |
| WP KR 3013 | ටොයොටා කොරොල්ලා |
| WP KE 1431 | මිට්සුබිෂි ලාන්සර් |
| WP KR5654 | ටොයොටා යාරිස් |
| WP KR 5634 | ටොයොටා යාරිස් |
| WP KR 5658 | ටොයොටා යාරිස් |
| WP KF 1358 | හොන්ඩා මෝටර් කාර් |
| WP KP 6534 | නිසාන් සනී |
| 301-1497 | නිසාන් සනී |
| WP KF 5456 | නිසාන් සනී |

**ජීප් රථ**

| වාහන අංකය | වර්ගය |
|---|---|
| WP KI 8673 | ටොයොටා ලෑන්ඩ් ක්‍රෑසර් |
| WP GC 0286 | ටොයොටා ලෑන්ඩ් ක්‍රෑසර් |
| WP GK 4912 | ටොයොටා ප්‍රාඩෝ |
| WP GB 8458 | ටොයොටා ලෑන්ඩ් ක්‍රෑසර් |
| WP KV 0284 | බී.එම්.ඩබ්ලියු |
| WP KI 4908 | මිට්සුබිෂි පැජරෝ |
| WP KE 6427 | මයික්‍රො රෙක්ස්ටන් |
| WP KQ 0031 | ටොයොටා ප්‍රාඩෝ |
| WP KE 4329 | ස්පොටේජ් ජීප් |
| WP KU 8202 | නිසාන් පෙට්‍රල් ජීප් |

**වෙනත් වාහන**

| | |
|---|---|
| WP NB 1416 | ටොයොටා හයිඑස් වෑන් |
| AAE 1916 | ත්‍රී රෝද රථය |

**කැබ් රථ**

| වාහන අංකය | වර්ගය |
|---|---|
| WP PC 2696 | ටොයොටා හයිලක්ස් ඩී කැබ් |
| WP PF2141 | ටොයොටා ඩබල් කැබ් |
| 250-5007 | මිට්සුබිෂි ඩබල් කැබ් |
| WP PD 7794 | ටොයොටා හයිලක්ස් ඩී කැබ් |
| 58-8579 | මිට්සුබිෂි ඩබල් කැබ් |
| WP PB 3458 | ඩබල් කැබ් |

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති සඳහා ලබා දී ඇති වාහන**

| වාහන අංකය | වර්ගය | ව්‍යාපෘතිය |
|---|---|---|
| KE 3349 | මොන්ටෙරෝ ජීප් | සුනාමි පුනරුත්ථාපන ව්‍යාපෘතිය |
| 301 3644 | වොල්වො කාර් | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය |
| KX -8259 | ටොයොටා කොරොල්ලා 141 | NCAS |

**කුළී පදනම මත ලබා ගෙන ඇති වාහන**

| | | | |
|---|---|---|---|
| **1.** KT-6724 | **2.** 19-1932 | **3.** HD-6355 | **4.** PU-6897 |
| **5.** KF 5464 | **6.** KL-8861 | **7.** 32-4306 | **8.** KB 4389 |
| **9.** JQ 1496 | **10.** JG 7755 | **11.** HT 8591 | **12.** KU 7044 |
| **13.** KH 4394 | **14.** KJ 3399 | | |

## ආයතන අංශය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

උසස් අධ්‍යාපනය නංවාලීම පිණිස උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අපේක්ෂිත අභිමතාර්ථ වෙත ළඟාවීමට අවශ්‍ය ගුණාත්මකභාවයෙන් යුක්ත ප්‍රශස්ථ සේවක මණ්ඩලයක් පවත්වා ගැනිම, අමාත්‍යාංශයට අයත් අනෙකුත් සියලුම ආයතන සමඟ විධිමත් සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම ආයතන අංශය මඟින් සිදු කරනු ලැබේ.

**ආයතන අංශයේ කාර්යභාරය**

- අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්, අනුයුක්ත කිරීම්, ස්ථාන මාරුවීම් උසස්වීම් හා විශ්‍රාම ගැන්වීම්
- ගරු අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්, අනුයුක්ත කිරීම් හා සේවය අවසන් කිරීම්
- බඳවා ගැනීම් පරිපාටි සකස් කිරීම
- කාර්යමණ්ඩලය සඳහා පුහුණුවීමේ අවස්ථා ලබා දීම
- විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන නවක සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- දැයට කිරුළ වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු විශ්වවිද්‍යාල ආචාර්යවරු සඳහා සහනදායී මෝටර් බලපත්‍ර නිකුත් කිරීම
- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල අනධ්‍යන කාර්ය මණ්ඩල පත් කිරීම

**2014.12.31 දිනට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව**

| | සේවක වර්ගය | තනතුරු | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | ලේකම් | 1 | 1 | - |
| | | අතිරේකලේකම් (පාලන හා මුදල්) | 1 | 1 | - |
| | | අතිරේකලේකම් (සංවර්ධන හා ශිෂ්‍යත්ව) | 1 | 1 | - |
| | | අතිරේකලේකම් (රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල / වෘත්තීය අධ්‍යාපන ආයතන) | 1 | 1 | - |
| | | ප්‍රධාන මූල්‍ය නිලධාරී * | 1 | | 1 |
| | | ප්‍රධාන ගණකාධිකාරි | 1 | 1 | - |
| | | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 1 | 1 | - |
| | | අධ්‍යක්ෂ (සංවර්ධන හා ශිෂ්‍යත්ව) | 1 | 1 | - |
| | | අධ්‍යක්ෂ (ශ්‍රී. ලං. ප. සේ) | 1 | 1 | - |
| | | අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 | - |
| | | අධ්‍යක්ෂ (යටිතල පහසුකම්) * | 1 | - | 1 |
| | | අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) * | 1 | 1 | 1 |
| | | අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 1 | 1 | - |
| | | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | - |
| | | ගණකාධිකාරි | 1 | 1 | |
| | | නි.අධ්‍යක්ෂ / ස. අධ්‍යක්ෂ (සැලසුම්) | 2 | 2 | - |
| | | සහකාර ලේකම් (පාලන) | 1 | 1 | |
| | | සහකාර ලේකම් (ප්‍රසම්පාදන) | 1 | 1 | |
| | | නි.අධ්‍යක්ෂ / ස. අධ්‍යක්ෂ (සංවර්ධන හා ශිෂ්‍යත්ව / කුසලතා සංවර්ධන) | 2 | 2 | - |
| | | නි.අධ්‍යක්ෂ / ස. අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ) | 1 | 1 | |
| | | නීති නිලධාරි ** | 1 | 1 | - |
| | | ඉංජිනේරු (සිවිල්) * | 1 | - | 1 |

| | සේවක වර්ගය | තනතුරු | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (ii) | තෘතියික | පරිපාලන නිලධාරි * | 1 | - | 1 |
| | | භාෂා පරිවර්තක | 1 | 1 | |
| | | සංවර්ධන නිලධාරී * | 60 | 42 | 18 |
| | | සංවර්ධන සහකාර ** | 11 | 6 | 5 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර * | 36 | 19 | 17 |
| (iii) | ද්විතියික | කාර්මික නිලධාරි * | 1 | - | 1 |
| | | ප්‍රවෘත්ති නිලධාරි | 1 | 1 | - |
| | | සැපයුම් සහකාර | 1 | 1 | - |
| | | තොරතුරු තාක්ෂණ නිලධාරි * | 2 | - | 2 |
| | | සංඛ්‍යා ලේඛන නිලධාරි | 1 | 1 | - |
| | | පිළිගැනීමේ නිලධාරී | 1 | 1 | - |
| (iv) | ප්‍රාථමික | කාර්යාල කාර්ය සහයක ** | 20 | 15 | 5 |
| | | රියදුරු ** | 19 | 18 | 1 |
| | | කැමරා ක්‍රියාකරු සහායක | 1 | 1 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික/ කොන්ත්‍රාත් පදනම /ආදේශක) | ජ්‍යෙෂ්ඨ උපදේශක (ක්‍රීඩා හා කුසලතා සංවර්ධන) | 1 | 1 | - |
| | | ජ්‍යෙෂ්ඨ උපදේශක (ශිෂ්‍ය කටයුතුහා සුභසාධක) | 1 | 1 | - |
| | | ලේකම් - සම්බන්ධීකරණ ලේකම් | 1 | 1 | - |
| | | උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ උපදේශක | 2 | 2 | - |
| | | නිශ්චල ඡායාරූප ශිල්පි ** | 1 | - | 1 |
| | | කැමරා ශිල්පි ** | 1 | - | 1 |
| | **උප එකතුව** | | **187** | **131** | **56** |

* සුදුසු නිලධාරියකු /නිලධාරිනියක අනුයුක්ත කරන ලෙස අදාල අමාත්‍යාංශ වලින් ඉල්ලා ඇත.

** සුදුසු නිලධාරියකු බඳවා ගැනීමට කටයුතු කර ඇත.

**<u>සමාලෝචිත වර්ෂය තුළදී කාර්ය මණ්ඩලයට එක්වූ හා ස්ථාන මාරුවී ගිය නිලධාරින් පිළිබඳ විස්තර</u>**

| **සේවක වර්ගය** | **කාර්ය මණ්ඩලයට එක්වූ නිලධාරින්** | **ස්ථාන මාරුවී ගිය නිලධාරින්** |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 3 | - |
| තෘතියික මට්ටම | - | - |
| ද්විතියික මට්ටම | 16 | 13 |
| ප්‍රාථමික මට්ටම | 1 | 1 |
| වෙනත් (අනියම් / තාවකාලික/ කොන්ත්‍රාත් පදනම /ආදේශක) | - | - |

මීට අමතරව අංක EST-4/PEMNT/03/0225 හා 2014.11.12 දාතම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි මෙම අමාත්‍යාංශයට අනුයුක්තව ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවයේ පහත තනතුරු වල නිලධාරින් විසින් තම සේවා කාලය දින 180 සම්පූර්ණ කර තිබූ බැවින් සේවය ස්ථිර කර ඇත.

කළමනාකරණ සහකාර සේවය සඳහා නිලධාරින් - 06

රියදුරු සේවය සඳහා නිලධාරි - 01

කාර්යාල සේවක සේවය සඳහා නිලධාරින් - <u>02</u>

**එකතුව** **<u>09</u>**

**විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි කාර්යමණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබා දීම පිළිබඳ විස්තර**

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යයන් පුළුල් වීමත් සමඟ විශ්වවිද්‍යාල පද්ධතිය වෙත පැවරෙන කාර්යයන් ඉටු කිරීමට ඒවායේ පවතින අතිවිශාල පුරප්පාඩු ප්‍රමාණය ඉමහත් බාධාවක් වී ඇති බැවින්, මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කොට, ඒවායේ පුරප්පාඩු පිළිබඳව අධ්‍යයනය කොට, අත්‍යවශ්‍ය පුරප්පාඩු පමණක් පිරවීමට මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත තිබූ බලතල අංක DMS/E1/54/7/313/1 සහ 2011.11.15 දින දරණ ලිපිය මඟින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත පවරන ලදි.

ඒ අනුව විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විසින් පුරප්පාඩු පිරවීම සඳහා විටින් විට කරන ලද ඉල්ලීම් සලකා බලා පහත සඳහන් පරිදි පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දී ඇත.

**2014-01-01 සිට 2014-12-31 දින දක්වා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබා දී ඇති තනතුරු සංඛ්‍යාව**

| අනු අංකය | විශ්වවිද්‍යාලය/උසස්අධ්‍යාපන ආයතනය | අනුමත කරන ලද තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 25 |
| 2 | කොළඹ විශ්වවිද්‍යාලය | 64 |
| 3 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 54 |
| 4 | කැලණිය විශ්වවිද්‍යාලය | 56 |
| 5 | මොරටුව විශ්වවිද්‍යාලය | 60 |
| 6 | යාපනය විශ්වවිද්‍යාලය | 85 |
| 7 | රුහුණ විශ්වවිද්‍යාලය | 58 |
| 8 | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 42 |
| 9 | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය | 45 |
| 10 | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 25 |
| 11 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | 16 |
| 12 | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 53 |
| 13 | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 13 |
| 14 | ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 4 |
| 15 | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 9 |
| 16 | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | 4 |
| 17 | පශ්චාත් ඉංග්‍රීසි උපාධි ආයතනය | 1 |
| 18 | පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 3 |
| 19 | බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය | 1 |
| 20 | මානවශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය | 1 |
| 21 | ජෛව රසායන විද්‍යා අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය | 4 |
| 22 | විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) | 1 |
| 23 | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 5 |
| 24 | මානව සම්පත් අභිවර්ධන ආයතනය | 1 |
| 25 | ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය | 7 |
| 26 | තාක්ෂණ ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය | 1 |
| 27 | ශ්‍රී පාලි මණ්ඩපය | 2 |
| 28 | වවුනියා මණ්ඩපය | 3 |
| | **මුළු එකතුව** | **643** |

**2014 වර්ෂයේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල හා අනෙකුත් උපාධි ආයතන සඳහා සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීම.**
**(වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2013)**

| අනු අංකය | විශ්වවිද්‍යාලය/ආයතනය | ලැබුණු අයදුම්පත් | ප්‍රතික්ෂේපිත අයදුම්පත් | නිකුත් කල මෝටර් බලපත්‍ර |
|---|---|---|---|---|
| 01. | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 56 | 02 | 54 |
| 02. | කොළඹ විශ්වවිද්‍යාලය | 50 | 04 | 46 |
| 03. | කැලණිය විශ්වවිද්‍යාලය | 37 | | 37 |
| 04. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 34 | 01 | 33 |
| 05. | යාපනය විශ්වවිද්‍යාලය | 31 | | 31 |
| 06. | මොරටුව විශ්වවිද්‍යාලය | 31 | 01 | 30 |
| 07. | විවෘත විශ්වවිද්‍යාලය | 30 | 01 | 29 |
| 08. | සබරගමුව විශ්වවිද්‍යාලය | 25 | | 25 |
| 09. | රුහුණ විශ්වවිද්‍යාලය | 23 | | 23 |
| 10. | නැගෙනහිර විශ්වවිද්‍යාලය | 19 | | 19 |
| 11. | රජරට විශ්වවිද්‍යාලය | 16 | | 16 |
| 12. | සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය | 14 | | 14 |
| 13. | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | 14 | | 14 |
| 14. | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 12 | | 12 |
| 15. | වයඹ විශ්වවිද්‍යාලය | 09 | | 09 |
| 16. | අග්නිදිග විශ්වවිද්‍යාලය | 08 | | 08 |
| 17. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 04 | | 04 |
| 18. | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 03 | | 03 |
| 19. | ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය | 01 | | 01 |
| 20. | තාක්ෂණ ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය | 02 | 01 | 01 |
| 21. | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 01 | | 01 |
| 22. | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය | 01 | | 01 |
| 23. | ජෛව රසායණ විද්‍යා, අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ ආයතනය | 01 | | 01 |
| 24. | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය | 01 | | 01 |
| 25. | ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | 01 | | 01 |
| | මුළු ගණන | **424** | **10** | **414** |

## ප්‍රසම්පාදන අංශය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන හා මුදල්) ගේ අධීක්ෂණය මත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය 1 පන්තියේ නිලධාරි එස්.එල්.එච්.ගමගේ මහතා යටතේ ප්‍රසම්පාදන අංශය ක්‍රියාත්මක වේ.

<u>කාර්ය මණ්ඩලය</u>

2014 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රසම්පාදන අංශයේ කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

| නම | තනතුර |
|---|---|
| එස්.එල්.එච්.ගමගේ මයා | අධ්‍යක්ෂක (ප්‍රසම්පාදන) |
| එම්.ඒ.සී.එස්.ගුණවර්ධන මයා | ප්‍රසම්පාදන සහකාර |
| එච්.එම්.ඒ.ප්‍රේමරත්න මිය | සංවර්ධන නිලධාරි |
| ඊ.ඩී. සාරිකා මිය | සංවර්ධන නිලධාරි |
| ඩබ්ලිව්.එම්.පී.මධුෂාණි මෙනවිය | සංවර්ධන නිලධාරි |
| එම්.පී. හසංගා මෙනවිය | සංවර්ධන නිලධාරි |
| ටී.එස්.එස්.දිසානායක මෙනවිය | සංවර්ධන නිලධාරි |
| එච්.ඒ. තිසේරා මයා | කා.කා.සේ |

අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) ඇතුළු කාර්ය මණ්ඩලය විසින් අදාල වර්ෂය තුල ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

- 2015 වසරේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඉදිරිපත් කර අනුමත කර ගැනීම.
- ප්‍රසම්පාදන කාර්යන් ඇරඹීම සඳහා අතිරේක ලේකම් (පාලන හා මුදල්) හා ලේකම්ගෙන් පූර්ව බලය ලබා ගැනීම.
- 2006 ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය, මාර්ගෝපදේශ සංග්‍රහ, මුදල් රෙගුලාසි හා 2014 වර්ෂයට අදාල ඇස්තමේන්තු ප්‍රතිපාදන අනුව අමාත්‍යාංශයේ සියලුම අංශයන් සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් ඇණවුම් කර සැපයීම.

ඒ අනුව 2014 වර්ෂයට අදාලව ප්‍රසම්පාදන අංශය විසින් ඉටු කරන ලද සියලු කටයුතු වැඩ, භාණ්ඩ හා සැපයුම් හා උපදේශන සේවා වශයෙන් ගොනු කර දැක්විය හැකිය.

වැඩ

- අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය විසින් 2014 වර්ෂයේ ප්‍රසම්පාදිත ගොඩනැඟිලි ඇතුළු අනෙකුත් ඉදිකිරීම් සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ.

| | විශ්වවිද්‍යාලයේ නම | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තු පිරිවැය ( රු. මිලියන ) |
|---|---|---|---|
| 01 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | වෛද්‍ය විද්‍යා පීඨය සඳහා නව මහල් ගොඩනැඟිල්ලක් ඉදිකිරීම- අදියර IV | රු. මිලියන 1363 |
| 02 | | කළමණාකරන අධ්‍යයන හා වානිජ පීඨය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම - අදියර II, III | රු. මිලියන 82 |
| 03 | | ව්‍යාවහාරික විද්‍යා පීඨය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකර යටිතළ පහසුකම් සංවර්ධනය කිරීම (අදියර II යටතේ) | රු. මිලියන 110 |
| 04 | | ව්‍යාවහාරික විද්‍යා පීඨය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකර යටිතළ පහසුකම් සංවර්ධනය කිරීම ( අදියර II යටතේ) | රු. මිලියන 229 |
| 05 | මොරටුව විශ්වවිද්‍යාලය | ගෘහ නිර්මාණ ශිල්පීය පීඨය සඳහා ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීම - අදියර IV | රු. මිලියන 98 |
| 06 | | තොරතුරු තාක්ෂණ පීඨය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම- අදියර II | රු. මිලියන 128 |
| 07 | | ඉංජිනේරු පීඨය සඳහා බහුකාර්ය ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 160 |
| 08 | | ගෘහ නිර්මාණ ශිල්පීය පීඨය සඳහා දේශන ශාලාවක් ඉදිකිරීම | රු. මිලියන 144 |
| 09 | | ශිෂ්‍ය මධ්‍යස්ථානයක් සහ ආපනශාලා ගොඩනැඟිල්ල වැඩිදියුණු කිරීම | රු. මිලියන 48 |
| 10 | | පරිපාලන ගොඩනැඟිලි දිගුවක් ඉදිකිරීම | රු. මිලියන 199 |
| 11 | | ගෘහ නිර්මාණ ශිල්පීය පීඨය සඳහා ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීම - අදියර III | රු. මිලියන 80 |
| 12 | ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | පුස්තකාලය වෙනුවෙන් ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 298 |
| 13 | පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය | වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය සඳහා අට මහල් ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 143 |
| 14 | කැලණිය විශ්වවිද්‍යාලය | විද්‍යා පීඨය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 226 |
| 15 | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථාන ගොඩනැඟිල්ලක් ඉදිකිරීම. | රු. මිලියන 158 |
| 16 | | මානව පීඨය සඳහා පස් මහල් ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීම | රු. මිලියන 88 |
| 17 | | විභාග හා දේශන ශාලා වෙනුවෙන් සය මහල් ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු මිලියන 246 |
| 18 | | වෛද්‍ය පීඨය සඳහා නේවාසිකාගාර සංකීර්ණයක් ඉදිකිරීම | රු. මිලියන 115 |
| 19 | | බහුකාර්ය ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 64 |

| | | | |
|---|---|---|---|
| 20 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | කෘෂිකර්ම පීඨය සංවර්ධන කිරීම | රු. මිලියන 797 |
| 21 | | සංඛ්‍යානය හා පරිගණක විද්‍යා දෙපාර්තමේන්තුව සඳහා සිව් මහල් ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 156 |
| 22 | | දන්ත වෛද්‍ය පීඨය සඳහා පස් මහල් ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 185 |
| 23 | | අදියර II යටතේ ඉංජිනේරු පීඨය සඳහා රසායන හා සැකසුම් ඉංජිනේරු ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 76 |
| 24 | | කළමණාකරන අධ්‍යයන පීඨය හා කලා පීඨය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 83 |
| 25 | | මහල් 03 කින් සමන්විත නේවාසිකාගාර ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 70 |
| 26 | | වෛද්‍ය පීඨය සඳහා ශල්‍ය ඒකකය වැඩිදියුණු කිරීම | රු. මිලියන 72 |
| 27 | වයඹ විශ්වවිද්‍යාලය | ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 316 |
| 28 | | මාකඳුර පරිශ්‍රයේ නේවාසිකාගාර ගොඩනැඟිල්ල ඉදිකිරීම | රු. මිලියන 72 |
| 29 | | ශිෂ්‍යාවන් සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම | රු.මිලියන 72 |
| 30 | | මාකඳුර පරිශ්‍රයේ ජලජ සම්පත්, ධීවර හා පෝෂණ පීඨය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 170 |
| 31 | | පරිපාලන ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 87 |
| 32 | ත්‍රිකුණාමල මණ්ඩපය | ව්‍යවහාරික පීඨය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 332 |
| 33 | | තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 254 |
| 34 | | පුස්තකාලය සඳහා ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීම | රු. මිලියන 271 |
| 35 | | ආපනශාලා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 104 |
| 36 | | ශිෂ්‍යයන් 100 සඳහා ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකිරීම | රු. මිලියන 73 |
| 37 | | ශිෂ්‍යාවන් 100 සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම | රු. මිලියන 73 |
| 38 | | විනෝදාස්වාද කටයුතු සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 34 |
| 39 | විවෘත විශ්වවිද්‍යාලය | ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය සඳහා ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 80 |
| 40 | කොළඹ විශ්වවිද්‍යාලය | උපාධි අධ්‍යයන පීඨය සඳහා සත් මහල් ගොඩනැඟිල්ලක් ඉදිකිරීම - අදියර III | රු. මිලියන 229 |
| 41 | | උපාධි අධ්‍යයන පීඨය සඳහා පිරිවැයක් වූ සත් මහල් ගොඩනැඟිල්ලක් ඉදිකිරීම. | රු. මිලියන 125 |
| 42 | | වෛද්‍ය පීඨය සඳහා පුස්තකාල සහ ඉගෙනුම් පහසුකම් සහිත ගොඩනැඟිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 723 |
| 43 | | අධ්‍යාපන පීඨයේ දැනට පවතින ගොඩනැඟිල්ල දිගු ඉදිකිරීම | රු. මිලියන 113 |

| | | | |
|---|---|---|---|
| 44 | රජරට විශ්වවිද්‍යාලය | සය මහල් ගොඩනැගිල්ලක් කෘෂිකර්ම පීඨය සඳහා ඉදිකිරීම | රු. මිලියන 100 |
| 45 | | ශිෂ්‍යාවන් සඳහා තුන් මහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 110 |
| 46 | ගම්පහ වික්‍රමආරච්චි වෛද්‍ය ආයතනය | සිව් මහල් පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 57 |
| 47 | | සිව් මහල් අධ්‍යයන ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 98 |
| 48 | පරිගණක පාසල, කොළඹ විශ්වවිද්‍යාලය | බහුකාර්ය කටයුතු සඳහා දේශන ශාලා ඇතුළු නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 226 |
| 49 | යාපන විශ්විද්‍යාලය | කළමණාකරන අධ්‍යයන හා වානිජ පීඨය වෙනුවෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 67 |
| 50 | | කළමණාකරන අධ්‍යයන හා වානිජ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 147 |
| 51 | | කළමණාකරන අධ්‍යයන හා වානිජ පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 94 |
| 52 | | සිද්ධි වෛද්‍ය ඒකකය සඳහා පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 79 |
| 53 | | ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 1,504 |
| 54 | සෞන්දර්ය විශ්වවිද්‍යාලය | සංගීත පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 111 |
| 55 | රුහුණු විශ්වවිද්‍යාලය | කළමණාකරන හා මූල්‍ය පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 236 |
| 56 | | විද්‍යා පීඨය සඳහා පරිගණක විද්‍යා සහ පරිගණක ඒකකයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 180 |
| 57 | | ඉංජිනේරු පීඨය සඳහා පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 84 |
| 58 | නැගෙනහිර විශ්වවිද්‍යාලය | සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා නේවාසිකාගාරයක් ඉදිකිරීම | රු. මිලියන 277 |
| 59 | | වෘත්තිමය ඒකකය සඳහා තුන් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | රු. මිලියන 185 |
| | | **මුළු වටිනාකම** | රු.මිලියන 12101 |

**ඉටු කරන ලද අනෙකුත් ප්‍රධාන කාර්යයන්**

- කඩිනම් නේවාසිකාගාර ඉදිකිරීම් ව්‍යාපෘතියේ පලමු අදියරේ ඉදිකරනු ලබන නේවාසිකාගාර 30 වෙන් වෙන් වශයෙන් අධීක්‍ෂණය කිරිම, ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම මඟින් කඩිනම් කිරීමට කටයුතු කිරීම

- ඉදිකර අවසන් නේවාසිකාගාර විශ්වවිද්‍යාල වලට භාරදීම සහ ශිෂ්‍ය අයිතියට පැවරීමේ කටයුතු කිරීම

- දෙවන අදියරේ නේවාසිකාගාර ඉදිකිරීම් 30 ට අදාල ගිවිසුම් සකස් කිරීම ප්‍රදානය කිරීම්, භූමිය තෝරාදීම් හා ප්‍රගති සමාලෝචන කටයුතු ඉටු කිරීම

- පලමු අදියර හා දෙවන අදියරට අදාල නේවාසිකාගාර 60 සඳහා බිල්පත් පියවීම් කටයුතු (අදාල වර්ෂයේදී පියවන ලද බිල්පත් වටිනාකම රුපියල් මිලියන 5600 කි)

- විශ්වවිද්‍යාල ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාල තොරතුරු යාවත්කාලින කිරීම.

- අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සංවිධානය කිරීම, රැස්වීම් වාර්තා සකස් කිරීම, ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම හා ප්‍රසම්පාදන කමිටු රැස්වීම්වලට සහභාගි වූ සාමාජිකයන්ට අදාල ගෙවීම් කටයුතු සඳහා වවුචර පත් සකස් කර, අදාල අනුමැතිය සඳහා යොමු කිරීම.

- අමාත්‍යාංශය යටතේ ඇති විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන හා අනෙකුත් අනුබද්ධිත ආයතන සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.

- අමාත්‍යාංශ ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වලට අවශ්‍ය ප්‍රසම්පාදන ලියකියවිලි ලබාදීම.

- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ඉදිකීරිම් කටයුතු සඳහා ප්‍රසම්පාදන කටයුතු ඇතුලත්ව කොන්ත්‍රාත් ප්‍රදානය කල පසු ඒවායේ ඉදිකිරීම් ප්‍රගතිය වීමසිම හා ප්‍රගති වාර්තාව සකස් කිරීම. ඒ මඟින් ඉදිකීරිම් අධික්ෂණය හා පරිපාලනය කිරීම (නේවාසිකාගාර 60 ක් කඩිනමින් ඉදිකීරිමේ ව්‍යාපෘතිය ඇතුලත්ව )

**<u>භාණ්ඩ, සැපයුම් හා සේවා</u>**

භාණ්ඩ, සැපයුම් හා සේවා සම්බන්ධයෙන් 2014 වර්ෂයේ දී ඉටු කරන ලද කාර්යයන්,

- අමාත්‍යාංශයේ සියලුම අංශයන් සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් ඇණවුම්කර සැපයීම හා 2014 වර්ෂයට අදාල ඇස්තමේන්තු ප්‍රතිපාදන හා ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කිරීම.
- භාණ්ඩ අවශ්‍යතාවයේ ඉල්ලීම ප්‍රසම්පාදන අංශයට ලැබුණු පසු අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සහ දුරකථන නාමාවලියේ ඇති (Rainbow Pages) සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- පහත දැක්වෙන ප්‍රසම්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
    - නායකත්ව පුහුණු 2014 වැඩසටහනට අදාල ප්‍රසම්පාදන කටයුතු
    - කවිතා ටැලන්ට් 2013/14 වැඩසටහන සඳහා ප්‍රසම්පාදන කටයුතු
- තාක්ෂණ ඇගයීම් කමිටු පත් කිරීම සඳහා අවශ්‍ය දැනුමැති වෘත්තිකයින්, විශේෂිය දැනුමැති පුද්ගලයන්ගේ නම් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශ සුළු හා ප්‍රධාන ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වලට අවශ්‍ය ප්‍රසම්පාදන ලියකියවිලි ලබාදීම.
- ලංසු ලියකියවිලි සකස් කිරීම.
- ලංසු ලබාගැනීම සඳහා දැන්වීම පලකිරීම, මිල ගණන් කැඳවීම් කිරීම.
- ලංසු විවෘත කිරීමේ කමිටු පත්කරගැනීම හා නියමිත දින, නියමිත වේලාවට ලංසු විවෘත කිරීමට සහය ලබාදීම.
- ලංසු උපලේඛන ගත කර අදාල තාක්ෂණ ඇගයීම් කමිටු වෙත ඉදිරිපත් කිරීම.
- තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන් ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර අවසන් තීරණ ලබා ගැනීම.
- ප්‍රසම්පාදනයන් සඳහා අනුමැතිය ලද පසු භාණ්ඩ ඇණවුම් කර ලබා ගැනීම.
- ඇණවුම් කරන ලද භාණ්ඩ හා උපකරණ නියමිත දිනට ගෙන්වාගෙන ගබඩාව වෙත යොමු කිරීම.
- ගබඩාවෙන් සැපයුම්කරුගේ බිල්පත හා භාණ්ඩ ලැබීම් තුණ්ඩුව ප්‍රසම්පාදන අංශයට ලැබීමෙන් පසු භාණ්ඩ අවශ්‍යතාවයේ ඉල්ලීමේ පිටපත සමඟ අනුමැතියේ පිටපතක් සමඟ ගෙවීම් සඳහා සහකාර ලේකම් (පාලන) අංශය වෙත යොමු කිරීම.
- අදාල භාණ්ඩ පිළිබඳ ලැබෙන වගකීම් සහතිකපත් සහකාර ලේකම් (පාලන) අංශය වෙත යොමු කිරීම.
- සුළු මුදලින් මිලදීගැනීම් සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු කිරීම.
- සංග්‍රහ කටයුතු සඳහා අත්තිකාරම් ලබා ගෙන වියදම් පියවීම.
- උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්/ අතිරේක ලේකම් (පාලන හා මුදල්) විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.

**<u>උපදේශන සේවා</u>**

බොහෝ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ව්‍යාපෘතින්හි ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කල පසු අදාල ඉදිකිරීම් ආරම්භ කිරීම හා අවසන් කිරීම සඳහා දිර්ඝ කාලයක් ගත වන අවස්ථා‍ද, එම ව්‍යාපෘති කාලය මෙන්ම පිරිවැය ද දෙගුණ වූ අවස්ථා නිරීක්ෂණය විය. ඒ පිළිබඳ සොයා බැලීමේදී පෙනි ගියේ උපදේශකවරයෙකු තෝරා ගැනීමේ සුළු කාර්යයකදී පවා ඉතා විශාල කාලයක් ගත කර ඇති බවයි.

ඊට පිලියමක් ලෙස අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල පද්ධතියේ ඉදිකිරීම් වර්ගීකරණය කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව යෝජනා හා මිල ගණන් කැඳවා විශ්වවිද්‍යාල සඳහා අනුමත වන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා උපදේශකවරුන්ගෙන් ලැයිස්තුවක් සකස් කර විශ්වවිද්‍යාල වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව එවැනි ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදනය වෙනුවෙන් අධික කාලයක් වැය කොට විශ්වවිද්‍යාල සඳහා උපදේශකවරු පත්කර ගැනීම වෙනුවට වැඩි කාලයක් ගත නොකට මෙම ලැයිස්තුවෙන් උපදේශකවරුන් තෝරා ගෙන කඩිනමින් නිර්මාණ වැඩ කටයුතු ආරම්භ කිරීමට අවකාශ ලැබුනි.

## තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ අංශය – උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

2012 වර්ෂයේ ස්ථාපනය කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ අංශයේ කාර්යභාරය 2014 වසර තුල තවදුරටත් පුළුල් වී ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ තොරතුරු තාක්‍ෂණ උපාංග නඩත්තු කටයුතු වලට පමණක් සීමා වූ මෙම අංශය, අමාත්‍යාංශයේ රාජකාරි කටයුතුවල කාර්යක්‍ෂමතාවය වැඩි කිරීමේ තොරතුරු තාක්‍ෂණ විසදුම් ලබාදීම දක්වා පුළුල් වී ඇත. ඒ අනුව තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ අංශයේ කාර්යභාරය එහි සාමාන්‍ය රාජකාරි වලට අමතරව, පහත දක්වා ඇති පරිදි ප්‍රධාන අංශ කීපයකට වෙන්කර දැක්විය හැක.

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ කාර්යභාරය**

- අමාත්‍යාංශය තුල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාවන් සැපයීම
- මාර්ගගත නිවාඩු කලමණාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සංවිධානය කිරීම.
- අමාත්‍යාංශයේ අන්තර්ජාල පහසුකම් පුළුල් කිරීම. (Expanding Bandwidth of Internet Leased Line)
- මාර්ගගත ශිෂ්‍යයත්ව කලමණාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සංවිධානය කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන නවක සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සංවිධානය කිරීම
- අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම
- ස්මාර්ට්ශීට් (smartsheet) මෘදුකාංගය භාවිතය මගින් අමාත්‍යාංශයේ සැලසුම් සකස් කිරීම හා පසුවිපරම් කිරීම.

- **අමාත්‍යාංශය තුල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාවන් සැපයීම**

අමාත්‍යාංශය තුල එදිනෙදා සිදුවන පරිඝණක දෝෂ, අන්තර්ජාල බිඳ වැටීම් පිළිසකර කිරීම හා නව පරිඝණක වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී භාවිතා කරන්නන් මුහුණපාන ගැටළු සඳහා උපදෙස් සහ අදාල පුහුණුව ලබා දීම. අනෙකුත් තාක්ෂණික මෙවලම් (මුද්‍රණ යන්ත්‍ර, fax යන්ත්‍ර, photocopy යන්ත්‍ර, multimedia devices) ස්ථාපනය කිරීම, භාවිතයේදී ඇතිවන දෝෂ පිළිසකර කර දීම හා භාවිතයට අවශ්‍ය උපදෙස් ලබා දීම. පරිගණක සඳහා අවශ්‍ය වන මෘදුකාංග බාගත කිරීම හා අවශ්‍ය අවස්ථා වලදී ඒවා ස්ථාපනය කරදීම. දෘඩාංග සවි කිරීම, හා දෝෂ නිරාකරණය කිරීම. අන්තර්ජාල තදබදය අවම කිරීම හා නිරීක්ෂණය කිරීම. අනවශ්‍ය ආකාරයෙන් වෙබ් අඩවි භාවිතා කිරීම අවහිර කිරීම. පරිගණක සඳහා වෛරස් ආරක්ෂණ මෘදුකාංග ස්ථාපනය කර යාවත්කාලීනව පවත්වාගෙන යාම යනාදී සේවාවන් රැසක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මඟින් සපයනු ලබයි.

- **මාර්ගගත නිවාඩු කලමණාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සංවිධානය කිරීම.**

ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල වල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා පෞද්ගලික හා රාජකාරී විදේශ සංචාර වලදී අදාල නිවාඩු අයදුම් කිරීමට මාර්ගගත නිවාඩු කළමණාකරන පද්ධතියක් හඳුන්වාදෙන ලදී. මෙහිදී වඩා කාර්යක්ෂම, පහසු හා කඩිනමින් සේවය ලබා දීමේ අරමුණින් මෙය සංවර්ධන අංශය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර එහි අඛණ්ඩ නිරීක්ෂණය, ගැටළු නිරාකරණය, පද්ධතිය සකස් කළ ආයතනය හා භාවිතා කරන අංශය අතර

සම්බන්ධීකරන කටයුතු පවත්වාගෙන යාම, භාවිතය සම්බන්ධයෙන් ගැටළු පැන නගින අවස්ථාවලදී අදාල පුහුණුව හා උපදෙස් ලබාදීම තොරතුරු තාක්ෂණ අංශය මගින් සිදු කරනු ලැබේ.

- **අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම**

තොරතුරු තාක්ෂණ අංශය මගින් අමාත්‍යාංශ වෙබ් අඩවිය එදිනෙදා යාවත්කාලීන කරනු ලබයි. එහිදී මුල් පිටෙහි ශීර්ෂකය සඳහා නව පුවත් හා විශේෂ ඡායාරූප ඇතුලත් කිරීම, විශේෂාංග පළ කිරීම, නව දේශීය හා විදේශීය උපාධි හා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සම්බන්ධ නිවේදන පළ කිරීම, අමාත්‍යාංශය විසින් පවත්වන ලද නව වැඩසටහන් පිළිබඳ විස්තර හා ඡායාරූප පළ කිරීම, අමාත්‍යාංශ පුවත්පත් නිවේදන පළ කිරීම ආදිය සිදුකරනු ලබයි.

- **විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන නවක සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සංවිධානය කිරීම**

පාසල් අධ්‍යාපනය අවසන් කොට උසස් අධ්‍යාපනය ආරම්භ කිරීමට සැරසෙන සිසුන්ගේ නායකත්ව ගුණාංග වර්ධනය කිරීම මෙම පුහුණු පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වේ. එහිදී Z අගය මත ඒ ඒ විෂය ධාරා අනුව අනුපිළිවෙලින් තෝරා ගත් සිසුන් කණ්ඩායම් කිහිපයක් යටතේ අදාල පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කරනු ලැබේ. මෙම සිසුන් අදාල මධ්‍යස්ථාන වෙත තේරීම, පුහුණු මධ්‍යස්ථාන සඳහා අදාල සිසු ලැයිස්තු සකස් කිරීම ආදි කාර්යයන් සිදු කරනු ලබන්නේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මගිනි. 2014 වර්ෂයේ 23,080 ක් පමණ වන විශ්වවිද්‍යාල වලට තෝරා ගත් සිසුන් පුහුණු මධ්‍යස්ථාන 20 ක් සඳහා අනුයුක්ත කිරීම මෙම අංශය මගින් සිදුකරන ලදී. එලෙසම එම සිසුන්ට අදාළ සියලු ලිපි ලේඛණ සකස් කිරීම, මුද්‍රණය කිරීම හා ලිපි යැවීමද මෙම අංශය මගින් සිදු කරන ලදී.

- **අන්තර්ජාල පහසුකම් පුළුල් කිරීම. (Expanding Bandwidth of Internet Leased Line)**

කලින් 1MBPS වේගයක් පැවති අන්තර්ජාලය 5 MBPS දක්වා වැඩි කර ඉතා වේගවත් කාර්යක්ෂම අන්තර්රජාල සේවාවක් ලබා දී ඇත. එහිදී LEARN ආයතනය මගින් Internet Leased Line පහසුකම් සපයන ලදී.

- Smartsheet Cloud Based මෘදුකාංගය ස්ථාපනය කිරීම.

  මෙම මෘදුකාංගය මාර්ග ගත මෘදුකාංගයක් බැවින් අමාත්‍යාංශයේ කළමනාකාරීත්වයට අන්තර්ජාල සම්බන්ධතාවයන් හරහා ඕනෑම අවස්ථාවක සම්බන්ධ වී අදාළ සැලසුම සංශෝධනය කිරීම හා පසු විපරම් කිරීමට භාවිතා කළ හැක. එලෙසම විශ්වවිද්‍යාල වලින් දත්ත හා තොරතුරු අන්තර්ජාලය ඔස්සේ ලබා ගැනීම මෙමගින් ඉතා කාර්යක්ෂමව කළ හැක. අන්තර්ජාල සම්බන්ධතාවයක් ඇති ඕනෑම තැනක සිට සියලුම තොරතුරු බලා ගැනීමට හැකිවීම නිසා එය කළමනාකරණ තීරණ ගැනීම සඳහා වඩාත් ඵලදායිවේ. මෙම පද්ධතිය ඉදිරියේදී අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා රාජ්‍ය විශ්වවිද්‍යාලවලට පුළුල් කිරීමට බලාපොරොත්තු වේ.


## සංවර්ධන අංශය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විවිධ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා පිහිටුවා ඇති අංශ අතරින් සංවර්ධන අංශය ද විශේෂ කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

**සේවාලාභීන්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය
- සියළුම රජයේ විශ්වවිද්‍යාල/මණ්ඩප/උසස් අධ්‍යාපන ආයතනයන්හි කාර්ය මණ්ඩලය
- විශ්වවිද්‍යාලවල මණ්ඩප/උසස් අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන දේශීය හා විදේශීය සිසුන්
- උසස් අධ්‍යාපන ආයතන හා සම්බන්ධ ව්‍යාපෘති කාර්ය මණ්ඩල හා ඒවායේ සේවය කරන විදේශීය සම්පත්දායකයින්
- විදේශ රටවල පූර්ව හා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා අයදුම්කරනු ලබන පිරිස්
- වෙනත් රජයේ ආයතන හා විදේශීය ආයතන

## කාර්යය මණ්ඩලය



අතිරේක ලේකම් (සංවර්ධන) -01
අධ්‍යක්ෂ (සංවර්ධන) - 01
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන හා ශිෂ්‍යත්ව) - 01
සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)- 01
සංවර්ධන නිලධාරී= 01
රාජ්‍ය කළමනාකරණ සහකාර III =
කාර්යාල කාර්ය සේවකIII= 01
රාජ්‍ය කළමනාකරණ සහකාර I = 02
සංවර්ධන සහකාර = 04
සංවර්ධන නිලධාරී = 05
රාජ්‍ය කළමනාකරණ සහකාර II = 01
රාජ්‍ය කළමනාකරණ සහකාර III = 02
කළමනාකාර සහකාර = 01
(NODES) වලින් අනුයුක්ත
කාර්යාල කාර්ය සේවක III = 01

**සංවර්ධන අංශය - නිලධාරි සංඛ්‍යාව**

| අනු අංකය | තනතුරු නාමය | 2014.01.01 දිනට සේවක සංඛ්‍යාව | 2014.12.31 දිනට සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | අතිරේක ලේකම් ( සංවර්ධන) | 01 | 01 |
| 02. | අධ්‍යක්ෂ ( සංවර්ධන) | 01 | 01 |
| 03. | සහකාර අධ්‍යක්ෂ ( සංවර්ධන හා ශිෂ්‍යත්ව) | 01 | 01 |
| 04. | සහකාර අධ්‍යක්ෂ ( සංවර්ධන) | 01 | 01 |
| 05. | රාජ්‍ය කළමනාකාර සහකාර සේවය 1 | 02 | 02 |
| 06. | සංවර්ධන සහකාර | 04 | 04 |
| 07. | සංවර්ධන නිලධාරි | 06 | 05 |
| 09. | රාජ්‍ය කළමනාකාර සහකාර සේවය 11 | 01 | 01 |
| 10 | රාජ්‍ය කළමනාකාර සහකාර සේවය 111<br>කළමනාකාර සහකාර 111<br>(NODES) වලින් අනුයුක්ත | 02<br>01 | 02<br>01 |
| 11. | කා.කා.ස. | 02 | 02 |
| | **එකතුව** | **22** | **21** |

**සංවර්ධන අංශයේ කාර්යභාරය**

- විශ්වවිද්‍යාලයන්හි කුලපතිවරුන් හා උපකුලපතිවරුන් පත්කිරීම සම්බන්ධ කටයුතු

- සියලුම විශ්වවිද්‍යාල හා එම විශ්වවිද්‍යාලයන්ට අයත් පශ්චාත් උපාධි ආයතන වෙතින් ලැබෙන විදේශ නිවාඩු ඉල්ලුම්පත් සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ හා ගරු අමාත්‍යතුමාගේ අවසරය ලබා දීමට අදාල කටයුතු

- විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනයන්හි කාර්ය මණ්ඩල එම ආයතන විසින් උපයන ලද අරමුදල් (Generated Funds) හා දේශිය අරමුදල් ප්‍රයෝජනයට ගෙන විදේශ චාරිකා සඳහා සහභාගිවීමේ දි වැයවන ප්‍රතිපාදනවලට අවශ්‍ය අනුමැතිය ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් හෝ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා දීමට කටයුතු කිරීම.

- විශ්වවිද්‍යාල කාර්යය මණ්ඩල නිලධාරීන් සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 431 අනුව යානපත්‍ර සඳහා අනුමැතිය ලබා දීමට අදාල කටයුතු.

- විශ්වවිද්‍යාලයන්ට අවශ්‍ය රසායන ද්‍රව්‍ය, විද්‍යුත් උපකරණ කට්ටල හා විවිධ උපාංග ගුවන් මඟින් ආනයනය කිරීම සඳහා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 368 අනුව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාදීමට අදාල කටයුතු

- විශ්වවිද්‍යාලයන්ට අවශ්‍ය රසායන ද්‍රව්‍ය, විද්‍යුත් උපකරණ කට්ටල හා විවිධ උපාංග ආනයනය කිරිමේදී එවැනි භාණ්ඩ සඳහා තීරුබදු සහ වැට්බදු නිදහස් කිරීම සම්බන්ධයෙන් ලැබෙන ඉල්ලීම් සඳහා 2012.11.08 දිනැති අංක 1783/18 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව අනුමැතිය ලබා ගැනිම සඳහා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට අදාල සියළුම කටයුතු (බඳවා ගැනීම් හැර)

- 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාලපනත යටතේ නව පාඨමාලා ආරම්භ කිරීම, පාඨමාලා වෙනස්කිරීම, නව පීඨ හා අංශ ආරම්භ කිරීම ආදී නියමයන් හා නියමාවලි පළකිරීම

- විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයට අදාළ ගැටළු පිළිබඳ ජනාධිපති කාර්යාලයෙන් හා වෙනත් ආයතන වලින් ලැබෙන ලිපි සම්බන්ධව කටයුතු කිරීම

- විදේශීය සිසුන් සඳහා ලබාදෙන ශ්‍රී ලංකා රජයේ ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධ සියළුම කටයුතු

- පොදු රාජ්‍ය මණ්ඩල ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධ සියලු කටයුතු

- විදේශීය රටවලින් සහ උපාධි ප්‍රදාන ආයතනවලින් ලැබෙන පූර්ව උපාධි හා පශ්චාත්උපාධි ශිෂ්‍යත්ව සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරිම සම්බන්ධ සියලු කටයුතු (දැන්වීම් පළකිරීම, ඉල්ලුම්පත් නිර්නායක අනුව තේරීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සහ තෝරාගත් අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් නිර්දේශ කොට එම රටවල්වලට / ආයතනවලට යොමු කිරීම)

- ශ්‍රී ලංකා රජයේ විශ්වවිද්‍යාලයන්හි හා උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන කටයුතුවල යෙදෙන විදේශ ශිෂ්‍යයන්ට හා මෙරට විශ්වවිද්‍යාලවලට පැමිණෙන කථිකාචාර්යවරුන් සඳහා මෙරටට ඇතුලුවීමේ සහ විසා දිර්ඝ කර ගැනීම සම්බන්ධයෙන් ලැබෙන ලිපි නිර්දේශ කර ආගමන විගමන පාලක වෙත ඉදිරිපත් කිරීමේ කටයුතු

- විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ලැබෙන කෙටි කාලීන පුහුණු පාඨමාලා පිළිබඳ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල කාර්ය මණ්ඩල දැනුවත් කිරීම හා උසස් අධ්‍යාපන ආයතන මඟින් ඉදිරිපත් කෙරෙන නාම යෝජනා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරිම

- ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර අත්සන් කරන ලද හා කරනු ලැබීමට නියමිත අවබෝධතා ගිවිසුම් සම්බන්ධයෙන් කටයුතු කිරීම

- රජයේ විශ්වවිද්‍යාල වලට අදාල ඉඩම් සම්බන්ධ සියළු කටයුතු

- ත්‍රි භාෂා ශ්‍රී ලංකා වැඩසටහනට අදාල කටයුතු

- උපාධි සහතික පිළිගැනීම හා සමාන කිරීම සම්බන්ධයෙන් ලැබෙන ලිපි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම/අදාල ආයතනයන්ට ඉදිරිපත් කර පිළිතුරු ලබාදීමට කටයුතු කිරීම

- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සම්බන්ධසියලුම කටයුතු

- කවිතා වැඩසටහනට අදාල ගෙවිම සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ කටයුතු

# රාජකාරි පැවරීම්

| | | |
|---|---|---|
| නිලධාරිනියගේ නම | : | බී.එම්.එස්.බණ්ඩාර මහත්මිය |
| තනතුර | : | අධ්‍යක්ෂ (සංවර්ධන අංශය) |
| අංශය සේවා කාලය | : | 2008.04.04 සිට 2015.01.31 දක්වා |

01. කුලපති /උපකුලපති පත්කිරීම
02. කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් පත් කිරිම
03. අවබෝධතා ගිවිසුම් වලට අදාල කටයුතු
04. විදේශ සිසුන් සඳහා විසා නිකුත් කිරිම
05. දිවයිනෙන් බැහැර විම සඳහා විශ්වවිද්‍යාලවල හා ආයතනවල නිලධාරින්ට අවසරය ලබා දිම
06. විශ්වවිද්‍යාල විසින් උපයන අරමුදල් මඟින් ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර ලබාගැනීමේ කටයුතු
07. බදු/එකතු කිරීමේ අගය මත බදු/රේගු බදු වලින් නිදහස් කිරීමේ කටයුතු
08. රාජ්‍ය විශ්වවිද්‍යාල, හා උසස් අධ්‍යාපන වලට අයත් ඉඩම් පිළිබඳ කටයුතු
09. රාජ්‍ය විශ්වවිද්‍යාල, හා උසස් අධ්‍යාපන වලට අදාල ගැටළු
10. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය හා සම්බන්ධ සියළු කටයුතු
11. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සම්බන්ධ කටයුතු
12. පවරනු ලබන වෙනත් රාජකාරි

- නිලධාරියාගේ නම : කේ. ඒ. පි. පෙරේරා මහත්මිය
- නිලධාරියාගේ තනතුර : සහකාර අධ්‍යක්ෂ II ( ශිෂ්‍යත්ව හා සංවර්ධන)
- අංශයේ සේවා කාලය : 2011.05.02 සිට මේ දක්වා

**ඉටු කරනු ලබන රාජකාරි**

01. ශ්‍රී ලංකා රජයේ ජනාධිපති ශිෂ්‍යත්ව 100 වැඩ සටහන

02 විදේශ රටවලින් ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව සම්බන්ධ සියලු කටයුතු

03. විදේශ රටවලින් පිරිනමන පුහුණුවීම්, සම්මන්ත්‍රණ

04. විදේශ සිසුන් සඳහා වීසා නිකුත් කිරිම

05. දිවයිනෙන් බැහැර විම සඳහා පහත සඳහන් විශ්වවිද්‍යාල වල හා ආයතන වල නිලධාරීන්ට අවසරය ලබා දීම

1. කොළඹ විශ්වවිද්‍යාලය
2. කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතනය හා පරිගණක තාක්ෂණ ආයතනය
3. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
4. කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය
5. මොරටුව විශ්වවිද්‍යාලය / තාක්ෂණ ආයතනය
6. රුහුණ විශ්වවිද්‍යාලය
7. ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය
8 ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
9. ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
10. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

06. උපයන මුදල් මඟින් කෙරෙන ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීමේ කටයුතු

07. අවබෝධතා ගිවිසුම

08. පවරනු ලබන වෙනත් රාජකාරි

- නිලධාරියාගේ නම : ජේ.ඒ.ඩී.එස්. ජයසිංහ මෙනවිය
- නිලධාරියාගේ තනතුර : සහකාර අධ්‍යක්ෂ II (සංවර්ධන)
- අංශයේ සේවා කාලය : 2012.01.02 සිට මේ දක්වා

**ඉටු කරනු ලබන රාජකාරි**

01. රාජ්‍ය විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වලට අයත් ඉඩම් පිළිබඳ කටයුතු
02. විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතන වලට අදාල ගැටළු
03. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය හා සම්බන්ධ සියළුම කටයුතු
04. කුලපති /උපකුලපති පත්කිරිම
05. කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් පත්කිරිම
06. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සම්බන්ධ කටයුතු
07. බදු/එකතු කිරීමේ අගය මත බදු/රේගු බදු වලින් නිදහස් කිරීමේ කටයුතු
08. දිවයිනෙන් බැහැර විම සඳහා පහත සඳහන් විශ්වවිද්‍යාල වල හා ආයතන වල නිලධාරීන්ට අවසරය ලබා දීම
    1. පේරාදෙණිය විශ්වවිද්‍යාලය
    2. යාපනය විශ්වවිද්‍යාලය
    3. රජරට විශ්වවිද්‍යාලය
    4. කැලණිය විශ්වවිද්යාලය
    5. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
    6. පශ්වාත් උපාධි ආයතනය
    7. පුරාවිද්‍යා පශ්වාත් උපාධි ආයතනය
    8. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
    9. විවෘත විශ්වවිද්‍යාලය
    10. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
    11. කෘෂිකර්ම පශ්වාත් උපාධි ආයතනය
    12. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
09. උපයන මුදල් මඟින් කෙරෙන ගුවන් ගමන් ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීමේ කටයුතු
10. පවරනු ලබන වෙනත් රාජකාරි

**<u>අතිරේක ලේකම් (සංවර්ධන) කාර්යාලයේ රාජකාරි ලැයිස්තුව</u>**

- අතිරේක ලේකම් (සංවර්ධන) විසින් සංවිධානය කරනු ලබන රැස්වීම් කටයුතු සඳහා සහාය දැක්වීම
- විදේශ ශිෂ්‍යත්ව වලට සිසුන් තෝරා ගැනීම සහ ඒ සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ සඳහා සහාය වීම හා සම්බන්ධීකරණය.
- අතිරේක ලේකම් (සංවර්ධන) කාර්යාලයට ලැබෙන ලිපි හා අතිරේක ලේකම් (සංවර්ධන) කාර්යාලයෙන් යැවෙන ලිපි සම්බන්ධව කටයුතු කිරීම.
- අතිරේක ලේකම් කාර්යාලයේ කළමනාකරණ කටයුතු සඳහා සහාය වීම
- අවස්ථානුකූලව අතිරේක ලේකම් (සංවර්ධන) විසින් පවරනු ලබන අනෙකුත් සියළුම රාජකාරි ඉටු කිරීම

**<u>අතිරේක ලේකම් (සංවර්ධන) කාර්යාලයේ කාර්ය මණ්ඩලය</u>**

- එස්.ජී.කේ.ඩී.අයි.එස්.ජයමාලි මිය - සංවර්ධන නිලධාරි
- කේ.එස්.ජී.පෙරේරා මෙනවිය - රාජ්‍ය කළමනාකරණ සහකාර (iii)
- උදයංග ජයවර්ධන මහතා - කාර්යාල කාර්ය සේවක (iii)

**<u>විශ්වවිද්‍යාලවල 2014 වසරේදී සිටි කුලපතිවරුන්, උපකුලපතිවරුන් පිළිබඳ විස්තර</u>**

| අනු අංකය | විශ්වවිද්‍යාලය | කුලපති | උප කුලපති | පත්වීම් දිනය | ධූරකාලය |
|---|---|---|---|---|---|
| 01. | බෞද්ධ හා පාලි වි.වි | පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ හිමි | - | 2014.01.16 | 2019.01.15 |
| 02. | යාපනය වි.වි | මහාචාර්ය එස්. පත්මනාදන් | - | 2014.03.17 | 2019.03.16 |
| 03. | රජරට වි.වි | ආචාර්ය ලීල් ගුනසේකර | - | 2014.04.24 | 2019.04.23 |
| 04. | කැලණිය වි.වි | - | මහාචාර්ය වයි.එම්.සුනන්ද මද්දුම බණ්ඩාර | 2014.03.19 | 2017.03.18 |
| 05. | යාපනය වි.වි | - | මහාචාර්ය වී.අරසරත්නම් මහත්මිය | 2014.04.24 | 2017.04.23 |
| 06. | සබරගමුව වි.වි | - | මහාචාර්ය චන්දන පී. උඩවත්ත | 2014.05.13 | 2017.05.12 |
| 07. | මොරටුව වි.වි | - | මහාචාර්ය ඒ.කේ.ඩබ්. ජයවර්ධන | 2014.10.14 | 2017.10.13 |
| 08. | ඌව වෙල්ලස්ස වි.වි | - | ආචාර්ය ජී.චන්ද්‍රසේන | 2014.10.18 | 2017.10.17 |
| 09. | සෞන්දර්ය හා කලා වි.වි | - | මහාචාර්ය ඒ. කළුආරච්චි | 2014.10.20 | 2017.10.19 |
| 10. | බෞද්ධ හා පාලි වි.වි | - | මහාචාර්ය පූජ්‍ය ගල්ලෑල්ලේ සුමනසිරි හිමි | 2014.10.30 | 2017.10.29 |
| 11. | ශ්‍රී ජයවර්ධනපුර වි.වි | - | මහාචාර්ය එස්.පී.පී.අමරතුංග | 2014.11.17 | 2017.11.16 |

## ශ්‍රී ලාංකික සිසුන් සඳහා විදේශ ශිෂ්‍යත්ව

විදේශීය රටවල උසස් අධ්‍යාපනය සඳහා ඉඩ ප්‍රස්ථා ලබා දෙමින් පූර්ව හා පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම වාර්ෂිකව මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන ප්‍රමුඛතම කාර්යයකි.

විදේශිය ශිෂ්‍යත්ව සඳහා රටවල් කිහිපයක් මඟින් වාර්ෂිකව ශිෂ්‍යත්ව ප්‍රදානයන් සිදු කරනු ලබන අතර ඒ පිළිබඳ තොරතුරුභාෂාත්‍රයෙන්ම ප්‍රසිද්ධ පුවත්පත් මඟින් හා අමාත්‍යාංශ වෙබ් අඩවිය වන www.mohe.gov.lk මඟින් ප්‍රචාරය කර අයදුම්පත් කැඳවනු ලබයි. අයදුම්පත් අතරින් සුදුසු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර තෝරා ගන්නා ලද අයදුම්කරුවන් අදාල රටවල් සඳහා නාම යෝජනා කරනු ලැබේ. මෙම ශිෂ්‍යත්ව සඳහා සුදුස්සන් තේරීම විවෘත හා විනිවිදභාවයකින් යුතුව විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් සමන්විත ප්‍රවීණ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සිදු කරයි. අවසාන තෝරා ගැනීම සිදු කරන්නේ අදාළ ශිෂ්‍යත්වය පිරිනමන රට හෝ අදාල නියෝජිතායතනයයි. 2014වර්ෂයේ විදේශීය ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව සඳහා සිසුන් 217 දෙනෙකුටද පශ්චාත් උපාධි සඳහා සිසුන් 64 දෙනෙකුටද ශිෂ්‍යත්ව අවස්ථා අමාත්‍යාංශය මඟින් ලබා දී ඇත.2011-2014 දක්වා ප්‍රථම සහ පශ්චාත් උපාධි සඳහා තෝරා ගන්නා ලද මුළු සිසුන් සංඛ්‍යා වගුව 6.1 හා වගුව 6.2 වලින් දැක්වේ.

පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව අවස්ථා 2011-2014

| අනු අං. | රට | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| 1 | ඉන්දියාව | 13 | 42 | 37 | 31 |
| 2 | චීනය | 17 | 3 | 11 | 16 |
| 3 | ජපානය | 6 | 6 | 9 | 9 |
| 4 | නවසීලන්තය | 2 | 1 | 1 | 1 |
| 5 | එක්සත් රාජධානිය | 6 | 6 | 7 | 7 |
| | එකතුව | **44** | **58** | **65** | **64** |

ප්‍රථම උපාධි ශිෂ්‍යත්ව අවස්ථා 2011-2014

| අනු අං. | රට | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| 1 | බංග්ලාදේශය | 3 | - | 5 | 7 |
| 2 | ඉන්දියාව | 42 | 122 | 115 | 133 |
| 3 | චීනය | 10 | 9 | 13 | 18 |
| 4 | බෲනායි | 2 | 2 | - | - |
| 5 | කොරියාව | 2 | 1 | 1 | 2 |
| 6 | කියුබාව | 4 | 4 | - | 2 |
| 7 | රුසියාව | 18 | 25 | 20 | 37 |
| 8 | පකිස්ථානය | 5 | 8 | 9 | 10 |
| 9 | සර්බියාව | 2 | 1 | 1 | 1 |
| 10 | මැසිඩෝනියාව | - | 2 | - | 1 |
| 11 | වියට්නාමය | - | 3 | 5 | 5 |
| 12 | ජපානය | - | 2 | 5 | 1 |
| | එකතුව | **88** | **179** | **174** | **217** |


## ශ්‍රී ලංකා රජයේ විදේශීය සිසුන් සඳහා වන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන

වාර්ෂිකව විවිධ රටවල් විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ශ්‍රී ලාංකික සිසුන් සඳහා පූර්ව හා පශ්චාද් උපාධි ශිෂ්‍යත්ව දෙසීයකට අධික ප්‍රමාණයක් ප්‍රදානය කරනු ලබයි. එබැවින් විදේශීය සිසුන් සඳහා ශ්‍රී ලංකාව තුල උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම අරමුණු කල "ශ්‍රී ලංකා රජයේ විදේශිය සිසුන් සඳහා වන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන " උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2011 වසරේ දී ආරම්භ කරන ලදී.

මෙම ශිෂ්‍යත්ව සඳහා විදේශ සිසුන්ට අවස්ථා ලබා දීම මගින් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය පිළිබඳව විදෙස් රටවල ප්‍රචාරය කිරීමත් ඒ තුලින් රාජ්‍ය විශ්වවිද්‍යාල වෙත මුදල් ගෙවීමේ පදනම මත විදේශීය සිසුන් වැඩි වශයෙන් ආකර්ශනය කර ගැනීමත් අරමුණු කොට ඇත.

මේ යටතේ වාර්ෂිකව පිරිනමා ඇති ශිෂ්‍යත්ව සංඛ්‍යාව පහත පරිදි වන අතර දැනට රටවල් 22 කට අයත් ශිෂ්‍යත්ව ලාභී මුළු විදෙස් සිසුන් සංඛ්‍යාව 96 කි. රාජ්‍ය විශ්වවිද්‍යාල 12 ක් හා ඊට අනුබද්ධ ආයතන මේ වන විට ජනාධිපති ශිෂ්‍යත්ව ලාභීන් හට පූර්ව හා පශ්චාද් උපාධි ශිෂ්‍යත්ව පිරිනමන අතර මේ වන විට නේපාල, භූතාන , නයිජීරියානු හා කොරියානු සිසුන් 6 දෙනෙකු තම අධ්‍යයන පාඨමාලා සාර්ථකව නිම කර ඇත.

අධ්‍යයන වර්ෂ සඳහා ලියාපදිංචි සිසුන්



2014/15 අධ්‍යයන වර්ෂය සඳහා පූර්ව හා පශ්චාද් උපාධි අයදුම් පත් 188ක් ලද අතර ඒ අතරින් සුදුසුකම් ලත් සිසුහු 30 දෙනෙකු මේ වන විට විශ්වවිද්‍යාල වල ලියාපදිංචි වී අධ්‍යයන කටයුතු වල නියැලෙති. තවත් සිසුන් 16 දෙනෙකු පමණ ඉදිරියේදී ලියාපදිංචි වීමට නියමිතය.

2014/15 අධ්‍යයන වර්ෂය සඳහා විදෙස් සිසුන්ගේ ලියාපදිංචිය හා ඉදිරියේදී ලියාපදිංචි වීමට නියමිත සිසුන්(2015.05.05දිනට)

| | රට | ලියාපදිංචි සිසුන් | ලියාපදිංචි වීමට නියමිත සිසුන් |
|---|---|---|---|
| 1 | බංගලාදේශය | 1 | 1 |
| 2 | භූතානය | 3 | - |
| 3 | ඉන්දුනීසියාව | 2 | - |
| 4 | ජපානය | 1 | - |
| 5 | කෙන්යාව | 1 | 1 |
| 6 | ලැට්වියාව | 1 | - |
| 7 | මාලදිවයින | 5 | - |
| 8 | මියන්මාරය | - | 2 |
| 9 | නේපාලය | 5 | 1 |
| 10 | නයිජීරියාව | 3 | 3 |
| 11 | පකිස්තානය | 4 | 6 |
| 12 | රුසියාව | - | 1 |
| 13 | ස්වාසිලන්තය | 1 | 1 |
| 14 | ටැන්සානියාව | 2 | - |
| 15 | උගන්ඩාව | 1 | - |
| | **එකතුව** | **30** | **16** |

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල පූර්ව හා පශ්චාද් උපාධි පාඨමාලා සඳහා 2014/15 අධ්‍යයන වර්ෂයට විදේශීය ශිෂ්‍යයන්ගේ ලියාපදිංචි වීම පහත පරිදි වේ. ඔවුන්ගෙන් ඉදිරියේදී ලියාපදිංචි වීමට නියමිත සිසුන් 16 ක් ද වෙති.

2014/15 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල හා අනුබද්ධ ආයතනයන්හි සිසුන් ලියාපදිංචිය
(2015.05.05 දිනට)

| | විශ්වවිද්‍යාලය | සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | පූර්ව උපාධි | පශ්චාද් උපාධි | මුළු සිසුන් |
| 1 | කොළඹ විශ්වවිද්‍යාලය | 7 | 2 | 9 |
| 2 | **IBMBB ආයතනය** | - | 1 | 1 |
| 3 | මොරටුව විශ්වවිද්‍යාලය | 3 | - | 3 |
| 4 | කළමණාකරණපශ්චාද්උපාධිආයතනය,ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | - | 2 | 2 |
| 5 | රුහුණු විශ්වවිද්‍යාලය | 1 | - | 1 |
| 6 | කැළණිය විශ්වවිද්‍යාලය | 3 | - | 3 |
| 7 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2 | - | 2 |
| 8 | යාපනය විශ්වවිද්‍යාලය | 4 | - | 4 |
| 9 | වවුනියා මණ්ඩපය යාපනය විශ්වවිද්‍යාලය | 3 | - | 3 |
| 10 | නැගෙනහිර විශ්වවිද්‍යාලය | 2 | - | 2 |
| | **එකතුව** | **26** | **4** | **30** |

## විදේශ නිවාඩු

විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා විදේශ නිවාඩු අනුමැතිය ලබා දීම පිළිබඳ විස්තර - 2014.01.01 සිට 2014.12.31

| විශ්වවිද්‍යාලය/ආයතන | රාජකාරි නිවාඩු | පෞද්ගලික නිවාඩු | එකතුව |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 25 | 3 | 28 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 19 | 11 | 30 |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 21 | 5 | 26 |
| කොළඹ විශ්වවිද්‍යාලය | 436 | 199 | 635 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 464 | 111 | 575 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 355 | 128 | 483 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 261 | 112 | 373 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 161 | 103 | 264 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 172 | 48 | 220 |
| යාපනය විශ්වවිද්‍යාලය | 90 | 76 | 166 |
| ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය | 59 | 34 | 93 |
| විවෘත විශ්වවිද්‍යාලය | 91 | 49 | 140 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 65 | 14 | 79 |
| ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 43 | 43 | 86 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 38 | 31 | 69 |
| රජරට විශ්වවිද්‍යාලය | 52 | 07 | 59 |
| වයඹ විශ්වවිද්‍යාලය | 50 | 08 | 58 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 25 | 03 | 28 |
| වවුනියා මණ්ඩපය | 04 | 0 | 04 |
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | 33 | 04 | 37 |
| ස්වාමි විපුලානන්ද ආයතනය | 03 | 01 | 04 |
| බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය | 01 | 01 | 02 |
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 09 | 01 | 10 |
| ඉංග්‍රීසි පශ්චාද් උපාධි ආයතනය | 02 | 02 | 04 |
| කෘෂි කර්ම පශ්චාද් උපාධි ආයතනය | 04 | 01 | 05 |
| පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය | 02 | 02 | 04 |
| විද්‍යා පශ්චාද් උපාධි ආයතනය | 0 | 01 | 01 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 7 | 10 | 17 |
| **එකතුව** | **2492** | **1008** | **3500** |

**වීසා නිකුත් කිරීම හා දීර්ස කිරීම**

2014/15 අධ්‍යයන වර්ෂය සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල වල උසස් අධ්‍යාපන කටයුතු සඳහා පැමිණෙන විදේශීය සිසුන් වෙනුවෙන් විසා නිකුත් කිරීමේ හා වීසා දීර්ස කිරීමේ කටයුතු සඳහානිර්දේශආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පහත පරිදි ලබා දී ඇත. මියන්මාරය, ජර්මනිය, භූතානය, වියට්නාමය හා චීනය ආදී රට වලින් සිසුන් බහුල වශයෙන් අධ්‍යයන කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන අතර වෛද්‍ය විද්‍යාව, කලා උපාධිය හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි පාඨමාලා ඔවුන් හදාරන විෂය ක්ෂේත්‍රයන් අතර ජනප්‍රිය විෂය ධාරා වේ.

ඇතුලු වීමේ වීසා හා වීසා දීර්ස කිරීම -2014

| අනු අංකය | විශ්වවිද්‍යාලය | ඇතුලු වීමේ වීසා | වීසා දීර්ස කිරීම |
|---|---|---|---|
| 01. | කැලණිය විශ්වවිද්‍යාලය | 31 | 184 |
| 02. | බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය | 106 | 309 |
| 03. | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 09 | 150 |
| 04. | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 17 | 195 |
| 05. | මොරටුව විශ්වවිද්‍යාලය | - | 19 |
| 06. | රුහුණ විශ්වවිද්‍යාලය | 178 | 76 |
| 07. | කොළඹ විශ්වවිද්‍යාලය | 41 | 103 |
| 08. | රජරට විශ්වවිද්‍යාලය | 05 | 6 |
| 09. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | - | 17 |
| 10. | යාපනය විශ්වවිද්‍යාලය | 02 | 1 |
| 11. | සබරගමුව විශ්වවිද්‍යාලය | - | 3 |
| 12. | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | - | 2 |
| 13. | අග්නිදිග විශ්වවිද්‍යාලය | - | 8 |
| **එකතුව** | | **390** | **1073** |

විවිධ උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල වල ලියාපදිංචිවූ විදේශීය ශිෂ්‍ය සංඛ්‍යා - 2014

| | උපාධි පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | විශ්වවිද්‍යාලය |
|---|---|---|---|
| පූර්ව උපාධි පාඨමාලා | වෛද්‍ය විද්‍යාව | 206 | රුහුණ විශ්වවිද්‍යාලය,<br>කොළඹ විශ්වවිද්‍යාලය,<br>කැළණිය විශ්වවිද්‍යාලය,<br>රජරට විශ්වවිද්‍යාලය,<br>යාපනය විශ්වවිද්‍යාලය |
| | කලා උපාධිය | 8 | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,<br>කොළඹ විශ්වවිද්‍යාලය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| | වෙනත් | 07 | කැළණිය විශ්වවිද්‍යාලය,<br>කොළඹ විශ්වවිද්‍යාලය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය,<br>රජරට විශ්වවිද්‍යාලය,<br>යාපනය විශ්වවිද්‍යාලය |
| පශ්චාත් උපාධි පාඨමාලා | පාලි හා බෞද්ධ අධ්‍යයනය | 122 | බෞද්ධ හා පාලි පශ්චාත් උපාධි ආයතනය,<br>කැළණිය විශ්වවිද්‍යාලය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය,<br>බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය |
| | කලා පශ්චාත් උපාධිය | 14 | රුහුණ විශ්වවිද්‍යාලය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය,<br>බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය |
| | වෙනත් | 33 | කැළණිය විශ්වවිද්‍යාලය,<br>කොළඹ විශ්වවිද්‍යාලය,<br>බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |

## අවබෝධතා ගිවිසුම්

2014.01.01 සිට 2014.12.31 වර්ෂය තුලදී අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම් (MOU) පිළිබඳ තොරතුරු

- 2014 වර්ෂය තුලදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කටාර් රාජ්‍යයේ ආණ්ඩුව අතර පමණක් අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් තබන ලදී.

අවබෝධතා ගිවිසුම් පිළිබඳ විස්තර

| | අවබෝධතා ගිවිසුම | අත්සන් කල දිනය | වලංගු කාලය | යෝජිත කාර්යයන් | ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කටාර් රාජ්‍යයේ ආණ්ඩුව අතර අධ්‍යාපනය උසස් අධ්‍යාපනය සහ විද්‍යාත්මක පර්යේෂණ ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධතා ගිවිසුම | **2014.02.21** | වසර 3ක කාලයක් සඳහා | • පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයන්ගේඉගැන්වීම් යටතේ වන උසස් අධ්‍යාපනය හෝ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා වන ශිෂ්‍යත්ව හෝ අර්ධකාලින ශිෂ්‍යත්ව සඳහා වන වෙන් කිරීම් <br> • පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයන්හි ඉගැන්වීම් යටතේ වන උසස් අධ්‍යාපන කටයුතු සඳහා වන ස්ථාපිත කිරීම වෙනුවෙන් වන වෙන් කිරීම් සඳහා හැකියාවන් පරික්ෂා කිරීම | 2014 වර්ෂයේ සිට ක්‍රියාවට නංවා ඇත. |

2014 වර්ෂයට පෙර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම් 2014 වර්ෂයේදීද බලාත්මක වූ අතර වලංගු ගිවිසුම් ප්‍රකාරව මාලදිවයින, වියට්නාමය, චීනය යන රාජ්‍යයන් හා ශ්‍රී ලංකාව එහි ප්‍රතිලාභ භුක්ති විඳින ලදී.

# උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

## සංවර්ධන අංශය - රාජකාරී ලැයිස්තු

| අනු අංකය | නම | විෂය අංකය | තනතුර | සේවා කාලය (සංවර්ධන අංශය) | රාජකාරී ලැයිස්තුව |
|---|---|---|---|---|---|
| 1 | නීතා සෙනෙවිරත්න මිය | UD/01 | රා.ක.ස.1 | 2010.06.13- මේ දක්වා | විශ්වවිද්‍යාල ඉඩම් විෂය සම්බන්ධ ලිපිගොනු වල සියළු කටයුතු හා අධීක්ෂණය<br>ශාඛාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය ලබාගැනීම හා බෙදා හැරීම<br>ශාඛාවේ කාර්ය මණ්ඩලයේ අධික්ෂණය හා තැපැල<br>ශාඛාවේ පැමිණිමේ ලේඛනය හා නිවාඩු ලේඛනය පවත්වාගෙන යෑම<br>කවිතා වැඩසටහන හා සම්බන්ධ කටයුතු අධීක්ෂණය කිරිම<br>විශ්වවිද්‍යාල ගැටළු සම්බන්ධයෙන් අදාල ලිපිගොනු අධික්ෂණය |
| 2 | ආර්. මධුෂාණි බණ්ඩාර මිය | UD/02 | ක.ස NODES | 2012.01.10 සිට මේ දක්වා | ත්‍රි භාෂා ශ්‍රී ලංකා වැඩසටහන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සම්බන්ධ සියළුම කටයුතු උපාධි සහතික පිළිගැනීම හා සමාන කිරීමේ කටයුතු |
| 3 | අමල් අබේසේකර මහතා | UD/03 | රා.ක.ස.1 | 2011.01.01 සිට 2015.04.21 දක්වා | බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට අදාල කටයුතු<br>1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ වන නියමයන් හා නියමාවලි පළකිරීම<br>විශ්වවිද්‍යාල හා ඊට අනුබද්ධ ආයතනවල කළමනාකරණ මණ්ඩල හා පාලක සභාවල සාමාජිකයින් සඳහා නාම යෝජනා කිරීම<br>මෙරට රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා පැමිණෙන විදෙස් සිසුන් හා කථිකාචාර්යවරුන්ගේ වීසා |
| 4 | ඩබ්.ඩී. එම්. සෝවිස් මෙය | UD/04 | සං.නි | 2012.09.03 සිට 2014.09.25 දක්වා | කවිතා වැඩසටහනට අදාල ගෙවීම් සම්බන්ධ කටයුතු<br>විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයට අදාළ ගැටළු පිළිබඳ ජනාධිපති කාර්යාලයෙන් හා වෙනත් ආයතන වලින් ලැබෙන ලිපි සම්බන්ධව කටයුතු කිරීම |

| අනු අංකය | නම | විෂය අංකය | තනතුර | සේවා කාලය (සංවර්ධන අංශය) | රාජකාරී ලැයිස්තුව |
|---|---|---|---|---|---|
| 5 | රසාංගිකා ගුණවර්ධන මිය | UD/05 | රා.ක.ස 11 | 2009.11.10 සිට 2015.02.02 දක්වා | විදේශ නිවාඩු ඉල්ලුම්පත් අනුමැතිය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කිරීම<br>- මොරටුව විශ්වවිද්‍යාලය<br>- තාක්ෂණ ආයතනය<br>- පරිගණක තාක්ෂණ ආයතනය<br>දේශීය අරමුදල් හා විශ්වවිද්‍යාලය උපයන අරමුදල් යොදාගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම |
| 6 | එම්.ඒ.ආර් දීප්තිකා මිය | UD/06 | සං.ස. | 2011.08.07 සිට මේ දක්වා<br>(2013.09.23 සිට 2014.04.07 දක්වා ප්‍රසූත නිවාඩු) | විශ්වවිද්‍යාලයන්හි කුලපතිවරුන් හා උපකුලපතිවරුන් පත් කිරීම<br>කොළඹ විශ්වවිද්‍යාලය හා එම විශ්වවිද්‍යාලයට අයත් පශ්චාත් උපාධි ආයතනවෙතින් ලැබෙන විදේශ නිවාඩු ඉල්ලුම්පත් අනුමැතිය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කිරීම<br>නඩු, මානව හිමිකම්, හා ඔම්බුඩ්ස්මන් ආදියෙන් ලැබෙන ලිපිවලට පිළිතුරු යැවීම<br>දේශීය අරමුදල් හා විශ්වවිද්‍යාලය උපයන අරමුදල් යොදාගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම |
| 7 | සුරංග වර්ණසුරිය මහතා | UD/07 | සං.ස | 2012.03.26 සිට 2014.02.මේ දක්වා | විදේශ නිවාඩු ඉල්ලුම්පත් අනුමැතිය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කිරීම<br>- කැලණිය විශ්වවිද්‍යාලය<br>- විවෘත විශ්වවිද්‍යාලය<br>- ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාතනය<br>- බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය<br>- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය<br>- කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය<br>- පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය<br>- පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය<br>- බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය<br>දේශීය අරමුදල් හා විශ්වවිද්‍යාලය උපයන අරමුදල් යොදාගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම |

| අනු අංකය | නම | විෂය අංකය | තනතුර | සේවා කාලය (සංවර්ධන අංශය) | රාජකාරී ලැයිස්තුව |
|---|---|---|---|---|---|
| 8 | මේනෂා ද සොයිසා මෙය | UD/08 | සං.ස | 2011.07.01 සිට මේ දක්වා | ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර අත්සන් කරනු ලබන ද්විපාර්ශ්වික ගිවිසුම් වලට අදාල කටයුතු<br>රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල වලට අදාල ඉඩම් කටයුතු<br>විදේශ නිවාඩු ඉල්ලුම්පත් අනුමැතිය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කිරීම<br>- පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>- යාපනය විශ්වවිද්‍යාලය<br>- රජරට විශ්වවිද්‍යාලය<br>දේශීය අරමුදල් හා විශ්වවිද්‍යාලය උපයන අරමුදල් යොදාගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම |
| 9 | එස්.එන්.එම්. සෙනෙවිරත්න මිය | UD/09 | සං.නි | 2013.11.23 සිට මේ දක්වා | **විදේශ නිවාඩු ඉල්ලුම්පත් අනුමැතිය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කිරීම**<br>- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>- කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය<br>- රුහුණ විශ්වවිද්‍යාලය<br>- ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය<br>- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය<br>- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය<br>- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය<br>- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය<br>දේශීය අරමුදල් හා විශ්වවිද්‍යාලය උපයන අරමුදල් යොදාගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම |
| 10 | එස්.පී.එන්. අමරතුංග මයා | FA/03 | සං.ස | 2011.08.01 සිට මේ දක්වා | විදේශ රටවලින් ලැබෙන පූර්ව උපාධි ශිෂ්‍යත්ව ප්‍රදාන සම්බන්ධ සියලු කටයුතු |

| අනු අංකය | නම | විෂය අංකය | තනතුර | සේවා කාලය (සංවර්ධන අංශය) | රාජකාරී ලැයිස්තුව |
|---|---|---|---|---|---|
| 11 | ටී.එම්. අසංක සංජීව මහතා | FA/01 | සං.නි | 2012.09.03 සිට මේ දක්වා | විදේශීය පශ්චාත් උපාධි ලබා දීමට අදාල කටයුතු<br>විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ලැබෙන කෙටි කාලීන පුහුණු පාඨමාලා පිළිබඳ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල කාර්ය මණ්ඩල දැනුවත් කිරීම හා අදාල ආයතන මඟින් ඉදිරිපත් කෙරෙන නාමයෝජනා නැවත විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කිරීම |
| 12 | හර්ෂි කුමාරපේලි මිය | FA/02 | සං.ස | 2009.04.27 සිට මේ දක්වා | ශ්‍රී ලංකා රජයේ විදේශ සිසුන් සඳහා වන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පහත සඳහන් විශ්වවිද්‍යාල වලට අදාල සියලු කටයුතු<br>- කොළඹ විශ්වවිද්‍යාලය - පරිගණක තාක්ෂණ විද්‍යාතනය<br>- කැලණිය විශ්වවිද්‍යාලය<br>- පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය<br>- පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය<br>- මොරටුව විශ්වවිද්‍යාලය<br>- පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>- කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය |
| 13 | අනුෂ්කා අබේකෝන් මිය | FA/04 | සං.නි | 2014.01.01 සිට මේ දක්වා | විදේශ සිසුන් සඳහා වන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පහත සඳහන් විශ්වවිද්‍යාල වලට අදාල සියලු කටයුතු<br>- යාපනය විශ්වවිද්‍යාලය<br>- රුහුණ විශ්වවිද්‍යාලය<br>- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය<br>- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 14 | ඉන්දීවරී ජයකොඩි මිය | UD/ | සං.නි | 2013.08.08 සිට මේ දක්වා (2014.05.22-සිට 2015.03.10 දක්වා නිවාඩු) | UD 06 දීප්තිකා මියගේ ප්‍රසූත නිවාඩු කාලය තුල රාජකාරී ආවරණය |

## රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

### හැඳින්වීම

සාක්ෂරතාව අතින් ආසියාවේ ඉහළම තත්ත්වයක සිටින ශ්‍රී ලාංකික සමාජය තුළ පවතින අධ්‍යාපනය පිළිබඳ ධනාත්මක ආකල්ප ඉහළ යාමත් සමඟ උසස් අධ්‍යාපනය සඳහා වූ දැඩි ඉල්ලුම රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපන ආයතන තුළින් ඉටු කිරීමේ අපසුතාවයක් පවතී. ඒ සඳහා විකල්ප ප්‍රවේශයක් ලෙස රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය තුළින් අධ්‍යයන අවස්ථා සැපයීමේ සාපේක්ෂ වැදගත්කම සලකා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල කටයුතු නියාමනය කිරීම සෘජුවම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතට ගන්නා ලදි. ඒ අනුව 2013 ජනවාරි මස රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය පිහිටුවා 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි 25 ඒ වගන්තියේ පවතින ප්‍රතිපාදන අනුව එහි නිශ්චිත බලධාරියා වශයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා පත්කර එම අංශය අතිරේක ලේකම් වරයෙකු යටතේ ක්‍රියාත්මක කරමින් පවතී.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි 70ඇ හා 70 ඈ වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 137 වැනි වගන්තිය යටතේ සාදන ලද 2013 අගෝස්තු 22 වන බ්‍රහස්පතින්දා අංක 1824 / 21 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇති 2013 අංක 1 දරණ රීතිය හා සම්බන්ධව නිශ්චිතව හඳුනාගත් උපාධියක්/උපාධි ප්‍රදානය කිරීමේ ආයතන වශයෙන් යම් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක් පිළිගැනීම සඳහා, එම ආයතන විසින් එවනු ලබන අයදුම් පත් සමාලෝචනය කිරීමේ සිට එසේ පිළිගත්තේ නම් අදාල නියෝගය නිකුත් කිරීම දක්වා ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් මෙම අංශය විසින් ඉටු කරනු ලබයි. ඉහත සඳහන් කරන ලද රීතිවල නිශ්චිතව දක්වා ඇති කාර්යයන් පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා ප්‍රතීතනය සහ තත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව ( එස්. සී .ඒ .කිව්. ඒ ) පිහිටුවන ලදි. එම කමිටුව විසින් අදාල ප්‍රතිපත්ති හා අවශ්‍ය පරිපාලන නිර්දේශයන් පනවා ඇති රීතීන් වලට අනුකූලව ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබේ. 2014 දෙසැම්බර් 02 වන අඟහරුවාදා අංක 1891/9 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇති 2013 අංක 1 දරණ නිශ්චිත බලධරයාගේ රීතිවල, 31 වන රීතිය සංශෝධනය වීම 2014 වර්ෂයේදී සිදු කරනු ලැබුණි.

රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය විසින් සිදු කරමින් පවතින කාර්යයන්

01. ප්‍රතීතනය හා තත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටු රැස්වීම් සංවිධානය කිරීම, පැවැත්වීම හා ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම.

02. උපාධි පිරිනැමීම සඳහා වූ බලතල ඉල්ලා ආයතන විසින් එවා ඇති අයදුම්පත්වල මූලික සමාලෝචන කටයුතු හා ඒ හා සම්බන්ධ වෙනත් කටයුතු.

03. උපාධි පිරිනැමීම සඳහා වූ බලතල ඉල්ලා එවා ඇති අයදුම්පත් ඉදිරිපත් කරන ලද ආයතනවල සමාලෝචන කටයුතු සඳහා සමාලෝචන කමිටු පත්කිරීම, සමාලෝචනය කිරීම හා ඇගයීම් සිදුකිරීම.

04. උපාධි පිරිනැමීමට බලතල ලැබූ ආයතනවල විස්තර හා ඒවායේ කටයුතු පිළිබඳව තොරතුරු පද්ධතියක් පවත්වාගෙනයාම හා පසු විපරම් කටයුතු හා යාවත්කාලීන කිරීම.

05. පනතේ සඳහන් උපාධි ප්‍රදාන ආයතන පිළිපැදිය යුතු වෙනත් අවශ්‍යතා උපාධි ප්‍රදාන ආයතන විසින් ඉටු කිරීම තහවරු කිරීම.

06. විදේශ උසස් අධ්‍යාපන ආයතන මඟින් සහතික පිරිනමනු ලැබීම පිණිස දේශීය උසස් අධ්‍යාපන ආයතනයන් මඟින් පවත්වාගෙන යන පාඨමාලා සම්බන්ධ තොරතුරු පද්ධතියක් පවත්වාගෙනයාම හා යාවත්කාලීන කිරීම

07. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධ නිර්දේශයන් ක්‍රියාවට නැංවීමට අදාළ සංවිධාන කටයුතු කිරීම.

08. උසස් අධ්‍යාපන ආයතනවල විදේශ සිසුන්ගේ වීසාපත් නිර්දේශයන් සම්බන්ධ කටයුතු ඉටු කිරීම.

09. දේශීය සිසුන් විදේශ රටවල උසස් අධ්‍යාපනය සඳහා යාම පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.

10. කමිටු හා අනෙකුත් අවශ්‍යතා සඳහා ගෙවීම් කටයුතු හා සම්බන්ධ කාර්යයන් ඉටුකිරීම.

11. අමාත්‍යාංශයේ පාලන හා සැලසුම් අංශ සමඟ එක්ව කාර්යාල පාලනය හා ඒ හා සම්බන්ධ කටයුතු සිදු කිරීම. හා වාර්තා කරනය.

**01. ප්‍රතීතනය සහ තත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටු**

උක්ත රීතින් අනුව ලැබෙන උපාධි ප්‍රදානය කිරීමේ අවසරය ලබා ගැනීම සඳහා වන අයදුම්පත් පරික්ෂා කොට වාර්තා කිරීම පිණිස ආයතනික සමාලෝචන කමිටුව හා විෂය සමාලෝචන කමිටුව යනුවෙන් සමාලෝචන කමිටු දෙකක් පිහිටුවා ඇත. එවා ඇති අයදුම්පත්වල ප්‍රදානය කිරීමේ බලතල ඉල්ලා සිටින උපාධිය අනුව සමාලෝචන කමිටුවේ සංයුතිය වෙනස් වේ. මෙම කමිටු පත්කරනු ලබන්නේ විෂය පිළිබඳ හසල අවබෝධයක් ඇති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / මහාචාර්ය වරුන් හා ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත වන පරිදිය.
1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ කොන්දේසි හා නියෝග යටතේ ඇමතිවරයා විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිශ්චිත බලධරයා වශයෙන් පත්කිරීමෙන් අනතුරුව නිශ්චිත බලධරයා විසින් උපාධි හා උපාධි ප්‍රදානය කිරීමේ ආයතන නිර්දේශ කිරීම පිණිස පිහිටවූ ප්‍රතීතනය සහ තත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුවට පහත සඳහන් සමාජිකයන් පත්කොට ඇත.

1. අචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා - නිශ්චිත බලධරයා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (කමිටු සභාපති)

2. ඩග්ලස් නානායක්කාර මහතා (ශ්‍රී.ල.ප.සේ විශේෂ ශ්‍රේණිය) අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (කමිටු සමාජික)

3. මහාචාර්ය රංජිත් සේනාරත්න මහතා, උප සභාපති - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (කමිටු සමාජික)

4. මහාචාර්ය රොහාන් රාජපක්ෂ මහතා, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, රුහුණු විශ්වවිද්‍යාලය (කමිටු සමාජික)

5. අචාර්ය ආර්.එම්.කේ. රත්නායක මහතා, අධ්‍යක්ෂ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ NCAS ව්‍යාපෘතිය (කමිටු සමාජික)

6. පමෝදා රාජකීය මිය, නීති නිලධාරිනී, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (කමිටු සමාජික)

අදාල වර්ෂය තුල ප්‍රතීතනය සහ තත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව රැස්වීම් වාර 9ක් පවත්වා ඇත. පහත දක්වා ඇති විධි විධාන යටතේ ප්‍රතීතනය සහ තත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කමිටුව විසින් එහි කාර්යයන් ඉටු කරනු ලබයි.

a) රාජ්‍ය නොවන උසස් අධ්‍යාපනයට අදාල ප්‍රතිපත්තිමය තීරණයන් සඳහා නිශ්චිත බලධරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම.

b) සමාලෝචන මණ්ඩල පත්කිරීම සඳහා නිශ්චිත බලධරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම.

c) සමාලෝචන මණ්ඩල විසින් ලබාදුන් නිර්දේශ වාර්ථා පිළිබඳ නිශ්චිත බලධරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම.

d) රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල හා උසස් වෘත්තීය අධ්‍යාපන ආයතන අංශයේ ප්‍රගති සමාලෝචනය මාසිකව සිදු කිරීම.

e) නිශ්චිත බලධරයා විසින් යොමු කරනු ලබන විවිධ පැතිකඩයන්ගෙන් පැන නගින ගැටලු පිළිබඳව අධ්‍යනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම.

2014 වර්ශය තුල උපාධි ප්‍රදාන වරප්‍රදාන සඳහා ඉල්ලුම්කර ඇති ආයතන 17ක අයදුම්පත් සමාලෝචනය සිදුකරමින් පැවතුන අතර එයින් අයදුම්පත් 9ක් පෙර වර්ශයේ සමාලෝචනය ක්‍රියාවලිය ආරම්භ කල අයදුම්පත්ය. අයදුම්පත් 8 ක් 2014 වර්ශය තුල උපාධි ප්‍රදාන වරප්‍රදාන සඳහා අයදුම් කල අයදුම්පත්වේ. උපාධි ප්‍රදාන වරප්‍රදාන සඳහා වූ සියළුම අයදුම්කාර ආයතන ඉල්ලුම් කර ඇති පාඨමාලා ගණන ආසන්න වශයෙන් 77( ආචාර්ය උපාධි, උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා හා ඩිප්ලෝමා) පමණවේ.

වගුව-1.1 2014 වර්ෂය තුල පිළිගෙන තිබෙන උපාධි හා උපාධි ප්‍රදාන ආයතනයන්.

| ආයතනය | පාඨමාලා. | ලබාදුන් දිනය |
|---|---|---|
| සණස කැම්පස් ලිමිටඩ් (SANASA Campus) | බැංකුකරණය සහ මුල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | ගැසට් පත්‍රය (අති විශේෂ) අංක. 1890/12 දින 21/01/2014 |
| | රක්ෂණ සහ අවදානම් කළමනාකරණය පිළිබඳ (විශේෂ) උපාධිය | |
| | ප්‍රාදේශීය විද්‍යා සහ සැළසුම් පිළිබඳ (විශේෂ) උපාධිය | |
| හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (Horizon Campus) | ව්‍යාපාර කළමනාකරණය විද්‍යාව පිළිබඳ උපාධිය (මානව සම්පත් කළමනාකරණය) | ගැසට් පත්‍රය (අති විශේෂ) අංක. 1846/18 දින 26/11/2014 |

2014 වර්ෂය තුල කාට්සු ඉන්ටර්නැෂනල් යුනිවර්සිටි (KAATSU) ආයතනය සඳහා ආයතනික සමාලෝචනය හා විෂය සමාලෝචනය සම්පූර්ණ කල අතර ගැසට් කිරීමේ ක්‍රියාවලිය සිදුකෙරෙමින් පැවතුනි.
තවද පහත දැක්වෙන ආයතනයන් වෙත සමාලෝචන කමිටු වාර්ථා නිර්දේශ සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලෙස යොමු කරන ලදි.

1. ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ටෙක්නොලොජි (ICBT Campus)- (ආයතනික සමාලෝචනය)

2. ඇක්වයිනාස් යුනිවර්සිටි කොලේජ් (Aquinas University College) - (කෘෂි කර්මාන්ත කළමනාකරණය (කෘෂිකර්මය) පිළිබඳ විද්‍යාවේදී උපාධිය)

3. කළම්බු ස්කූල් ඔෆ් කන්ස්ට්‍රක්ෂන් ටෙක්නොලොජි (CSCT))- (ආයතනික සමාලෝචනය)

4. ඉන්ස්ටිටියුට් ඔෆ් බැන්කස් (IBSL))- (ආයතනික සමාලෝචනය)

තවදුරටත් ඉහත අයදුම්පත් වලින් මුලික සමාලෝචන අවසන් කල පහත සඳහන් අයදුම්පත් සඳහා ආයතනික සමාලෝචනය හෝ විෂය සමාලෝචනය කමිටු සුදුසු පරිදි පත් කරන ලදි.

1. රැෆල්ස් යුනිවර්සිටි (Raffles University)

2. සවුත් ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින්(SAITM)

3. සීගීස් කැම්පස් (SEAGIS CAMPUS)

4. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව පාසල (NSBM)

5. නාගානන්ද ජාත්‍යාන්තර බෞද්ධ විශ්ව විද්‍යාලය (Nagananda International Buddhist Academy)

6. ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය (SIBA)

එමෙන්ම 2014 වසර තුල ලැබුනු අයදුම්පත් වලින් පහත අයදුම් පත් සඳහා මුලික සමාලෝචනය සිදු කරන ලදි.

1. කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉන්ජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය (CINEC)

2. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ට්) ලිමිටඩ් (SLIIT)

3. නලීමියා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉස්ලාමික් ස්ටඩීස් (Naleemiah Institute of Islamic Studies)

4. වික්ටෝරියා හයර් එඩියුකේෂන් කැම්පස් (Victoria Higher Education Campus)

## 02. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පද්ධති පවත්වාගෙනයාම.

2.1 උපාධි ප්‍රදානය කිරීමේ බලතල ලබාගත් ආයතන වල කටයුතු අධීක්ෂණය කිරීමට අරමුණු කර ගනිමින් එම ආයතන වල පාඨමාලාවන්, ශිෂ්‍යයින් පිළිබඳ විස්තර ඇතුලත් කර මෙම අංශය මඟින් තොරතුරු පද්ධතියක් පවත්වාගෙනයාම හා පසු විපරම් කටයුතු හා එහි යාවත්කාලීන කිරීම 2014 වර්ෂයේදීද සිදු කර ඇත.

උපාධි ප්‍රදානය කිරීමේ බලතල ලබාගත් ආයතන වල 2014 වර්ෂයේ ඉගෙනුම ලද ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.
වගුව - 2.1 උපාධි ප්‍රදානය කිරීමේ බලතල ලබාගත් උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් සංඛ්‍යාව

| | ආයතනය | ශිෂ්‍ය සංඛ්‍යාව (උපාධි ප්‍රදානය සඳහා අවසර ලත් පාඨමාලා) | ශිෂ්‍ය සංඛ්‍යාව (අනෙකුත් පාඨමාලා) | ශිෂ්‍ය සංඛ්‍යාව (විදේශ විශ්ව විද්‍යාල මඟින් පිරිනමන පාඨමාලා) |
|---|---|---|---|---|
| 01 | ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ස්ටඩීස් | වර්තමානයේ ක්‍රියාකාරීවයේ නොමැත. | | |
| 02 | මිනුම් හා සිතියම් ආයතනය | 2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගෙන නොමැත. | 45 | - |
| 03 | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT) | 5608 | - | - |
| 04 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) | 134 | 1188 | - |
| 05 | ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය | 214 | 130 | - |
| 06 | ජාතික සමාජ සංවර්ධන ආයතනය | 387 | 569 | - |
| 07 | ඇක්වයිනාස් උසස් අධ්‍යාපන විද්‍යායතනය | 454 | 27 | 195 |
| 08 | සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය(SAITM) | 664 | 34 | 555 |
| 09 | ජාතික ව්‍යාපාර කළමනාකාරිත්වය පාසල (NSBM) | 664 | 20927 | 1919 |
| 10 | කලම්බු ඉන්ටර්නැෂනල් නෝටිකල් ඇන්ඩ් ඉන්ජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය (CINEC) | 210 | - | 660 |
| 11 | ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය(SIBA) | 132 | 5 | 31 |

| | | | | |
|---|---|---|---|---|
| 12 | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ අයතනය (ICASL) | 23 | 50310 | 90 |
| 13 | සණස කැම්පස් ලිමිටඩ් | 49 | - | - |
| 14 | හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (Horizon Campus) | උපාධි ප්‍රදානය කිරීමේ බලතල 2014.11.26 දින ලබා දී ඇත. | 17 | 183 |
| | **මුළු ගණන** | **8539** | **73252** | **3633** |

## 2.2 රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපන අවස්ථා

රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය උසස් අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා ඒ සඳහා ඇති උසස් අධ්‍යාපන අවස්ථාවන් පිළිබඳව දත්ත එකතු කිරීම ආරම්භ කර ඇත. මෙය විදේශ උසස් අධ්‍යාපන ආයතනවලින් පිරිනමන සහතික සඳහා දේශීය උසස් අධ්‍යාපන ආයතන මඟින් අධ්‍යාපනය ලබාගැනීමට එම ආයතනවල දැනට ලියාපදිංචි සිසුන් ගණන සහ එම ආයතනවල විස්තර යන දත්තයන්ගෙන් සමන්විත වේ. එසේම මෙහිදී වෘත්තීය පාඨමාලා පිළිබඳ දත්තයන්ද එකතු කරනු ලබයි. 2014 වර්ෂයේදී පැවති එම දත්තවල සාරාංශයක් පහත දැක්වේ.

වගුව - 2.2 උපාධි ප්‍රදානය කිරීමේ බලතල ලබානොගත් උසස් අධ්‍යාපන ආයතන 62 ක් සඳහා සිසුන් සංඛ්‍යාව

| පාඨමාලා වර්ගය | පාඨමාලා ගණන | | සිසුන් ගණන | | මුළු සිසුන් ගණන |
|---|---|---|---|---|---|
| | දේශීය සහතික සඳහා පවත්වන පාඨමාලා | විදේශීයසහතික සඳහා පවත්වන පාඨමාලා | දේශීය සහතික සඳහා පවත්වන පාඨමාලා | විදේශීය සහතික සඳහා පවත්වන පාඨමාලා | |
| පදනම්/සහතිකපත්‍ර/වෘත්තීය පාඨමාලා | 35 | 14 | 3091 | 17794 | 20885 |
| ඩිප්ලෝමා | 103 | 89 | 6817 | 3402 | 10219 |
| උපාධිපාඨමාලා | 35 | 14 | 3091 | 17794 | 20885 |
| පශ්චාත්උපාධි පාඨමාලා | 14 | 6 | 861 | 210 | 1071 |
| ශාස්ත්‍රපති/විද්‍යාපති | 6 | 34 | 570 | 1503 | 2073 |
| ආචාර්ය උපාධි | 1 | 1 | 6 | 62 | 68 |
| මුළු ගණන | **186** | **234** | **12353** | **25912** | **38265** |

**03.** **<u>උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.</u>**

උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධ නිර්දේශ ලෙස ඉදිරිපත් කරන ලද,

නිර්දේශ 01 - කුසලතා මත පදනම්ව ඇතුලත් කර ගැනීමේ ක්‍රමයක් හඳුන්වාදීමේ දැක්මකින් යුතුව පංගු ක්‍රමය පිළිබඳව සමාලෝචනය කිරීමට අධ්‍යනය විශේෂඥයින්ගේ කමිටුවක් පත් කිරීම.

නිර්දේශ 02 - රජයේ විශ්වවිද්‍යාලවල ජනවාර්ගිකව මිශ්‍ර ශිෂ්‍ය ගහණයක් සිටින බවත්, එමෙන්ම භාෂා තුනෙන්ම පාඨමාලා පිරිනැමෙන බව හා ඒවා පිළිබඳව තේරීමක් කිරීමට අවස්ථාව තිබෙන බවත් සහතික කිරීම.

නිර්දේශ 02 අනුව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පත් කරන ලද විශේෂඥ කමිටුව විසින් පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී.

1. විශ්ව විද්‍යාල අතර ශිෂ්‍ය හා අධ්‍යයන කාර්යමණ්ඩල හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. විශ්ව විද්‍යාල වලට ශිෂ්‍යයන් ඇතුලත් කිරීමේදී සිය මවුභාෂාව නොවන විට අතිරේකව දක්ෂතාවය ඇති සිංහල/දෙමල භාෂා ප්‍රවීනත්වයටපූර්වතාවයක් ලබාදීම.
3. සියළුම විශ්ව විද්‍යාල වල ඉගැන්වෙන ත්‍රෛභාෂා උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීම.
4. ජාතික ඒකාබද්ධතාවය පිලිබඳ විෂය සෑම උපාධි පාඨමාලාවකම ප්‍රධාන විෂයක් ලෙස ඇතුලත් කිරීම.
5. අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) සඳහා සිංහල හා දෙමළ භාෂා දෙකෙන්ම අදාල විභාගයන් සඳහා පෙනී සිටීමට අදාල වන විභාග කොන්දේසි වෙනස් කිරීම.
6. බහු වාර්ගික පාසල් පිහිටුවීම ප්‍රවර්ධනය කිරීම.

දන්වා යවන ලද උක්ත නිර්දේශයන් සම්බන්ධ ප්‍රගතිය පිළිබඳ නිරන්තර වාර්තා ලබා ගැනීමට එක් එක් විශ්වවිද්‍යාල වලට නියෝජිතයෙක් බැගින් පත් කර ඒවා ජනාධිපති ලේකම් කාර්යාලයට වාරිකව දන්වා යැවීමේ කටයුතු 2014 වර්ෂය තුල අඛණ්ඩව සිදු කරන ලදි.

**04.** **<u>රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල විදේශ සිසුන් සඳහා වීසා බලපත්‍ර නිර්දේශ කිරීමේ කටයුතු</u>**

විදේශ රටවලින් මෙරට රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල උසස් අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන සිසුන් සඳහා ඇතුල්වීමේ සහ රැඳී සිටීමේ වීසා බලපත්‍ර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශ කර, ආගමන හා විගමන දෙපාර්තුමේන්තුවට යැවීමේ කටයුතු 2014 වර්ෂයේද සිදු කරනු ලැබ ඇත. මේ සඳහා වීසා නිර්දේශය අයදුම් කරන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල තොරතුරු ඇතුලත් නීතිමය ලියකියවිලිවල සහතික කළ පිටපත් මෙම අංශය භාරයේ තබා ගැනේ. නිර්දේශ ලබා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අනුමත ආකෘති පත්‍රය හා නියම කර ඇති ලියකියවිලි භාර දිය යුතු වේ. ඒ අනුව 2014 වර්ෂයේදී සිසුන් 152 ක් සඳහා වීසා බලපත්‍ර නිර්දේශ කිරීම මෙම අංශය මඟින් සිදු කර ඇත.

වගුව - 4.1 2014 වර්ෂය තුල ඇතුලත් වීමේ හා රැදී සිටීමේ වීසා ලබාගත් සිසුන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| අනු අංකය | **පැමිණි විදේශ රට** | **සිසුන් සංඛ්‍යාව** |
|---|---|---|
| 01 | ඇෆ්ගනිස්තානය | 3 |
| 02 | ඕස්ට්‍රේලියාව | 2 |
| 03 | බංගලාදේශය | 7 |
| 04 | භූතානය | 1 |
| 05 | බ්‍රසිලය | 1 |
| 06 | කැනඩාව | 1 |
| 07 | චීනය | 1 |
| 08 | කොන්ගොව | 1 |
| 09 | ජර්මනිය | 1 |
| 10 | ෆුජි | 1 |
| 11 | ගානා | 1 |
| 12 | ඉන්දියාව | 10 |
| 13 | ජපානය | 3 |
| 14 | කසකස්තානය | 1 |
| 15 | කෙන්යාව | 2 |
| 16 | කොරියාව | 16 |
| 17 | මැලේසියාව | 9 |
| 18 | මියන්මාරය | 1 |
| 19 | නේපාලය | 4 |
| 20 | නයිජීරියාව | 29 |
| 21 | ඕමානය | 13 |
| 22 | පකිස්තානය | 5 |
| 23 | පෘතුගාලය | 1 |
| 24 | රුසියාව | 2 |
| 25 | ස්පාඤ්ඤය | 1 |
| 26 | තුර්කිය | 16 |
| 27 | උගන්ඩාව | 4 |
| 28 | එංගලන්තය | 10 |
| 29 | සීෂෙල්ස් | 1 |
| 30 | දකුණු අප්‍රිකාව | 1 |
| 31 | වියට්නාමය | 3 |
|  | **එකතුව** | **152** |

**05. ශ්‍රී ලාංකික සිසුන් උසස් අධ්‍යාපනය සඳහා විදේශ රටවලට යෑම පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම.**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලාංකීය සිසුන් උසස් අධ්‍යාපනය සඳහා විදේශ රටවලට යාම පිළිඳව දත්ත ලබා ගැනීමේ වැදගත්කම සළකා බලමින් විදේශ කටයුතු අමාත්‍යාංශය හා සම්බන්ධීකරණය වෙමින් මෙරට සිටින විදේශ තානාපති හා කොන්සල් මඟින් අවශ්‍ය දත්ත ලබා ගැනීම සිදුකරමින් පවති. විදේශ තානාපති හා කොන්සල් කාර්යාල මඟින් එවන ලද දත්ත වලට අනුව ආසන්න වශයෙන් 10000 ක පමණ ශ්‍රී ලාංකීය සිසුන් සංඛ්‍යාවක් 2014 වර්ෂය තුල උසස් අධ්‍යාපනය සඳහා විදේශ ගතව ඇත.

**06. ශ්‍රී ලංකාවේ වෘත්තීය කළමනාකරණ ගණකාධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා පහසුකම් සැලසීම**

2014 සැප්තැම්බර් 04 වන දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුවගණකාධිකරණය වැනි වෘත්තීයමය ක්ෂේත්‍රයන් වෙනුවෙන් තිබෙන අධ්‍යාපන හා වෘත්තීය ආයතනවලින් පිරිනමණු ලබන සහතික හා ඊට අදාල සුදුසුකම් පිළිබඳ පොදු නිර්ණායක සැකසීම සහ ඒවා එක් සුදුසුකම් රාමුවක් තුළට ඇතුලත් කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ගැනීම පිණිස උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එම ක්ෂේත්‍රයේ පළපුරුදු රජයේ විශ්වවිද්‍යාලවල විද්වත් මණ්ඩලයකින්, ගණකාධිකරණය වෘත්තීයමය ක්ෂේත්‍රයේ පාඨමාලා පවත්වාගෙන යනු ලබන උසස් අධ්‍යාපන ආයතනවල නියෝජිතයින්ගේ සහ අදාල රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් වාර 4ක් පවත්වන ලදී.

**07. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩලය**

රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය හා 2014 වසර තුල සේවයේ නිරතව සිටි කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.
අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා පුරප්පාඩු පිළිවෙලින් 2014 ඔක්තෝම්බර් හා 2014 සැප්තැම්බර් මාසවලදී සම්පූර්ණ විය.

වගුව - 7.1 කාර්ය මණ්ඩලය සංයුතිය

| **තනතුර** | **අනුමත කාර්ය මණ්ඩලය** | **කාර්ය මණ්ඩලය 31.12.2014** |
|---|---|---|
| අතිරේක ලේකම් | 01 | 01 |
| අධ්‍යක්ෂ | 01 | 01 |
| සහකාර අධ්‍යක්ෂ | 01 | 01 |
| සංවර්ධන නිලධාරී<br>කළමනාකරණ සහාකාර | 06 | 04 |
| කාර්යාල කාර්ය සහයක | 01 | 01 |

## සැලසුම් අංශය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය


ශ්‍රී ලංකාව දැනුමේ කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමේ අරමුණින් සිදුකල රාජ්‍ය වැඩපිළිවෙලේ දී උසස් අධ්‍යාපනයට සුවිශේෂී ස්ථානයක් හිමිවිය. 2014 වර්ෂයේ අයවැය පිළියෙල කිරීමේ දී මෙම අභිමතාර්ථය මුදුන් පමුණුවා ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.එසේම කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ දැමීම, යටිතල පහසුකම් සංවර්ධනය, උපාධිධාරීන්ගේ ගුණාත්මක භාවය හා රැකියා නියුක්තිය වැඩි කිරීම, උසස් අධ්‍යාපනයේ ප්‍රවේශ හා අවස්ථා වැඩිකිරීම, ශ්‍රී ලාංකික උසස් අධ්‍යාපන පද්ධතිය ඉහල ජාත්‍යන්තර මට්ටමට පත් කිරීම සහ පර්යේෂණ හා නවෝත්පාදන වැඩි කිරීම යනාදී ප්‍රධාන අරමුණු යටතේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ කටයුතු විධිමත් කර ඇත.

අමාත්‍යාංශයේ මෙම ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීමේ දී සැලසුම් අංශය විසින් සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දේශීය හා විදේශීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, නියාමනය කිරීම සහ ඒවායේ ප්‍රතිඵල අදාල ආයතන වෙත වාර්තා කිරීම, අයවැය ප්‍රතිපාදන ඇස්තමේන්තු සැකසීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම, අමාත්‍යාංශයේ ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් සකස් කිරීම, අමාත්‍යාංශය යටතේ ඇති අනිකුත් ආයතනවල සැලසුම් ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම හා වාර්ෂික කාර්යයදාම සමාලෝචන වාර්තාව සැකසීම මින් ප්‍රධාන කාර්යයන් වේ.

**අයවැය ඇස්තමේන්තු සැකසීම සැලසුම් කිරීම**

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අමාත්‍යාංශයට ප්‍රධාන වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වශයෙන් මූලාශ්‍ර දෙකක් යටතේ රාජ්‍ය ප්‍රතිපාදන ලබාදෙනු ලැබේ. සැලසුම් අංශයේ එක් ප්‍රධාන කාර්යක් වන්නේ රාජ්‍ය ප්‍රතිපාදනයන්ගේ වියදම් විශ්ලේෂණය කර ඉදිරි වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා සැලසුම් සකස් කිරීමයි. 2014 වර්ෂයේ දී රාජ්‍ය උසස් අධ්‍යාපනය ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපාදන රුපියල් බිලියන 39.9 ක් වූ අතර එහි සත්‍ය වියදම ලෙස රුපියල් බිලියන 40.9 ක් විය. 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රාජ්‍ය ප්‍රතිපාදනයන්ගේ විග්‍රහයක් පහත රූප සටහනින් දක්වා ඇත

රු.මි. උසස් අධ්‍යාපනය සඳහා අයවැය ප්‍රතිපාදන සහ වියදම 2008-2014




*මෙම වියදම තුළ 2013 වර්ෂයේ හිඟ බිල්පත් ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරන ලද මුදල් ද ඇතුළත්ය.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම් සභාවේ සෘජු අධීක්ෂණය යටතේ පවත්නා විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන් මෙන්ම අමාත්‍යාංශයේ සෘජු පාලනය යටතේ පවත්නා විශ්වවිද්‍යාල දෙක සහ උසස් තාක්ෂණ ආයතනය ද ඉහත වියදම් විග්‍රහය ඇතුළත් වේ.

අමාත්‍යාංශයේ සැලසුම් අංශය මඟින් අයවැය ප්‍රතිපාදන වල වියදම් අධීක්ෂණය සිදු කරනු ලබන අතර මෙම අධීක්ෂණයේ පසුවිපරම් ලෙස ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම ද ප්‍රධාන කාර්යක් ලෙස සිදු කෙරේ.

<u>අධීක්ෂණය කරනු ලබන ව්‍යාපෘති</u>

උසස් අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ව්‍යාපෘතින්ගේ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල අදාළ කාල රාමුව හා වැය ඇස්තමේන්තුව තුළ ලඟාකර ගැනීම කෙතරම් දුරට සාර්ථක ද යන්න කාර්තුමය වශයෙන් කෙරෙන ව්‍යාපෘති සම්බන්ධ නියාමනය ද සැලසුම් අංශය යටතේ කෙරෙන තවත් ප්‍රධාන කර්තව්‍යයකි. මේ යටතේ දේශීය ප්‍රතිපාදනයන් යටතේ ව්‍යාපෘති157 ක් හා විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 10 ක් 2014 වර්ෂයේ අධීක්ෂණයට ලක් විය.

2014 වර්ෂයේ ක්‍රියාත්මක වු සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ කෙටි විග්‍රහයක් පහතින් දක්වා ඇත.

| ආයතනය | ව්‍යාපෘතිසංඛ්‍යාව | රාජ්‍ය ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි. |
|---|---|---|---|
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම් සභාව | **155** | **6,566.68** | **4,649.36** |
| අමාත්‍යාංශය | **12** | **6,330.26** | **6,282.77** |
| දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති | 02 | 4,753.00 | 4,778.8 |
| විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති | 10 | 1,577.26 | 1,503.97 |
| මුළුසංඛ්‍යාව | **167** | **12,896.94** | **10,932.13** |

එක් එක් ආයතන මට්ටමින් කාර්තුමය වශයෙන් තොරතුරු ගෙන්වා රාජ්‍ය ආයෝජන සඳහා වෙන් කරන ලද සම්පත් කාර්යක්ෂමව ඵලදායී අයුරින් යොදවාගෙන ඇත්දැයි කාර්තුමය වශයෙන් නියාමනය කිරීම මේ යටතේ සිදු කෙරේ. එම තොරතුරු උසස් අධ්‍යාපන අමාත්‍යාංශීය වෙබ් අඩවියේ මෙන්ම මුදල් අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති කළමණාකරන හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යන වෙබ් අඩවියේ ද කාර්තුමය වශයෙන් යාවත්කාලීන කර ඇත.

මෙකී අධීක්ෂණයේ තවත් අවස්ථාවක් ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හා මුදල් අමාත්‍යාංශය වෙත ලබා දිය යුතු වාර්තා පිළියෙළ කිරීම ද මෙම අංශයට පැවරී ඇත.

අමාත්‍යාංශීය ඍජු පාලනය යටතේ පවතින විදේශ ව්‍යාපෘති සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා සම්බන්ධවී ඉදිරි වර්ෂයන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සලසාදීම මෙන්ම නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යොමු කිරීම ද සැලසුම් අංශය යටතේ සිදුවේ.

**විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය**

ප්‍රාදේශීය සහ විශ්වවිද්‍යාල ප්‍රජාවන්ට අන්‍යෝන්‍ය ප්‍රතිලාභ අත් කර දීම සඳහා විශ්වවිද්‍යාලයේ හා ඒ ආසන්න වටපිටාවේ සංවර්ධනය ඉලක්ක කර ඇති නැවුම් සැලසුම් ප්‍රවේශයක් වූ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීම මෙම අංශයේ කටයුත්තකි.

මේ යටතේ ශ්‍රී ජයවර්ධනපුර, රුහුණ, මොරටුව යන විශ්වවිද්‍යාල 3 හි ව්‍යාපෘති ක්‍රියාත්මක වන අතර කමිටු හා එක්ව අධීක්ෂණ කටයුතු කරනු ලැබේ.

මෙම විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘති තුනට අමතරව, වයඹ විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය හා ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය ද මෙම සංකල්පය අනුව සිය ආයතන සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර අදාළ යෝජනා දැනටමත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

**2014 වර්ෂයේදී සැලසුම් අංශය විසින් පහත වැඩමුළු හා සමුළු පැවැත්වීමේ කටයුතු සංවිධානය කරන ලදී.**

- **2014 ජනවාරි 16 දින - උසස් අධ්‍යාපන පද්ධතියේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහළ නැංවීම පිළිබඳ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මුදල් අමාත්‍යාංශයේ පැවැත්වූ සාකච්ඡාව.**

  මෙහිදී එක් එක් ආයතනවල ක්‍රියාකාරී සැලැසුම් හා සංයුක්ත සැලැසුම්වල ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා වූ අතර මුදල් අමාත්‍යාංශය විසින් තවදුරටත් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් කරන ලදී.

- **2014 ජනවාරි 29 දින - 2014 ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පැවැත්වූ සාකච්ඡාව.**

  මෙහිදී එක් එක් විශ්වවිද්‍යාල සහ ආයතන විසින් 2014 ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කරන ලදී. උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමා විසින් ක්‍රියාකාරී සැලසුම් වැඩි දියුණු කළයුතු ආකාරයත් අවශ්‍ය ඉලක්ක කරා ළඟා විය හැකි පරිදි සැලසුම් සකස් කළ යුතු බවත් පෙන්වා දෙන ලදී.

- **2014 මැයි 08 සහ 09 දෙදින - පළමු කාර්තු ප්‍රගතිය හා කළමණාකරණ පද්ධතිය ප්‍රතිව්‍යුහගතකරණ පිළිබඳ සාකච්ජාව.**

  මෙහි පළමු සාකච්ජාව මැයි මස 08 වන දින මුදල් අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් එම අමාත්‍යාංශයේදී ද දෙවන සාකච්ජාව මැයි මස 09 වන දින මිලෝදා ආයතනයේදී ද පවත්වන ලදී. එහිදී අමාත්‍යාංශය විසින් 2014 අයවැය ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී. තවදුරටත් 2014 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම, නේවාසිකාගාර ව්‍යාපෘතිය, ප්‍රසම්පාදන කටයුතු, කාර්ය මණ්ඩල පුරප්පාඩු පිළිබඳව ප්‍රධාන වශයෙන් සාකච්ජා වට ලක්විය.

- **ආසියා හා ශාන්තිකර උසස් අධ්‍යාපනයේ සුදුසුකම් පිළිගැනීම පිළිබඳ කලාපීය කමිටුවේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - ගලදාරි හෝටලය, 2014 අගෝස්තු 4 හා 5**

  ආසියා හා ශාන්තිකර උසස් අධ්‍යාපනයේ සුදුසුකම් පිළිගැනීම පිළිබඳ කලාපීය කමිටුවේ ජාත්‍යන්තර සම්මේලනයේ 13 වැනි සැසි වාරය රටවල් 29ක නියෝජිතයින් 52ක ගේ සහභාගිත්වයෙන් 2014 අගෝස්තු 4 හා 5 දෙදින ගලදාරි හෝටලයේ දී පැවැත්විණි. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව, ආසියා ශාන්තිකර කලාපයේ සමාන පැවරීම් සහිත වෙනත් රටවල් සමඟ සැසඳීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මෙය අවස්ථාවක් කර ගනු ලැබිණ.

- **SAARC කළාපයේ දැනුම මූලික ආර්ථිකයන් සහ ආර්ථික වර්ධනය සඳහා උසස් අධ්‍යාපනයේ නවෝත්පාදනය පිළිබඳ වැඩමුළුව**

  උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, SAARC මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (HETC) සහයෝගීතාවයෙන් "සාක් කලාපයේ දැනුම මූලික ආර්ථිකයන් සහ ආර්ථික වර්ධනය සඳහා උසස් අධ්‍යාපනයේ නවෝත්පාදනයන්" මැයෙන් 2014 ඔක්තෝබර් 10 සිට 12 දක්වා ග්ලෝබල් ටවර් හෝටලයේදී තෙදින වැඩමුළුවක් ලේකම් කාර්යාලය හා එක්ව පවත්වන ලදී. ආර්ථික සංවර්ධනය පිළිබඳ කළාපීය සහායෝගීතාවය සඳහා අපේ දැනුම හා පළපුරුද්ද බෙදාගැනීම සඳහා අමාත්‍යාංශය මෙය අවස්ථාවක් කරගනු ලැබුවේය.

**අමාත්‍යාංශයේ වාර්ෂික කාර්යයදාම සමාලෝචනය පිළියෙල කිරීම**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වාර්ෂිකව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු කාර්යයදාම සමාලෝචන වාර්තාව පිළියෙළ කිරීම සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයක් වේ. මේ සඳහා අමාත්‍යාංශය යටතේ ඇති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, බෞද්ධ විශ්වවිද්‍යාල 02, උසස් තාක්ෂණ ආයතනය හා විදේශ ව්‍යාපෘති වලින් අදාල වාර්තා ලබා ගෙන ඒවා විශ්ලේෂණය කර, 2014 වර්ෂයේ ද කාර්යයදාම සමාලෝචන වාර්තාව පිළියෙල කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සැලසුම් අංශය විසින් සිදු කරන ලදී.

මෙම අංශය විසින් 2014 වසර තුලදී කරන ලද ක්‍රියාකාරකම්හි සාරාංශයක් පහත පරිදි වේ.

1. **දේශීය හා විදේශීය ව්‍යාපෘති නියාමනය කිරීම**

- දේශීය ඉදිකිරීම් ව්‍යාපෘතිවල හා විදේශීය ව්‍යාපෘතිවල කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සංවිධානය කිරීම හා ප්‍රගති වාර්තා පිළියෙල කිරීම.
- ඉහත ව්‍යාපෘති පිළිබඳ දත්ත අමාත්‍යාංශ වෙබ් අඩවියට සහ මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියට ඇතුළත් කිරීම
- ව්‍යාපෘති දත්ත විශ්ලේශණය කිරීම, ගැටළු හඳුනා ගැනීම සහ පසු විපරම් කිරීම
- ජනාධිපති ලේකම් කාර්යාලය විසින් දන්වා එවන ලද ව්‍යාපෘතියන්හි සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- විදේශීය ව්‍යාපෘතිවලට අදාලව විවිධ ආයතන විසින් ඉල්ලනු ලබන වාර්තා පිළියෙල කිරීම.
- නගර සංවර්ධන ව්‍යාපෘතියට අදාලව අනුකූලව විවිධ වාර්තා සකස් කිරීම
- විදේශීය ව්‍යාපෘතිවලට අදාල මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම.
- විදේශීය අරමුදල් ව්‍යාපෘතිවල නියාමනය කිරීමට වරින් වර පැමිණෙන විදේශ දූත පිරිස් සමඟ පැවැත්විය යුතු රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම.
- අමාත්‍යාංශයේ කැබිනට් පත්‍රිකාවල ප්‍රගතිය නියාමනය කිරීම

2. **අයවැය වාර්තා පිළියෙල කිරීම**

- වාර්ෂික අයවැය වාර්තාව සකස් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ලබාගැනීමේ හා වාර්ෂික අයවැය වාර්තාව පිළියෙල කිරීම
- මුදල් අමාත්‍යාංශය හා අනිකුත් ආයතන අතර අයවැය සාකච්ඡා පැවැත්වීම සංවිධානය කිරීම
- අනුමත වූ වාර්ෂික අයවැය යෝජනාවල ප්‍රගතිය සකස් කිරීම

3. **ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් සැකසීම හා අධීක්ෂණය**

- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම
- අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම යාවත්කාලීන කිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතන වල ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් සකස් කිරීම අධීක්ෂණය, නියාමනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය වැඩමුළු සංවිධානය කිරීම
- පවරන ලද ජාතික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී අමාත්‍යාංශය නියෝජනය කරමින් දායකත්වය ලබාදීම

## 4. විවිධ ආයතන විසින් වරින් වර ඉල්ලනු ලබන වාර්තා පිළියෙල කිරීම

- ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්ෂිකව ලබාදිය යුතු වාර්තා සකස් කිරීම
- මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා සකස් කිරීමට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල දත්ත ලබා දීම.
- විවිධ ආයතන විසින් හා අමාත්‍යාංශ මගින් දේශීය හා විදේශීය ව්‍යාපෘති පිළිබඳව වරින් වර ඉල්ලනු ලබන වාර්තා පිළියෙල කිරීම
- උගත් පාඩම් කොමිසම සඳහා වාර්තා සකස් කිරීමේදී දත්ත ලබා දීම
- ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ඉල්ලා එවන ලද තොරතුරු ලබා දීම
- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සඳහා හඳුනාගත් ප්‍රධාන ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු ලබාදීම

## 5. දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා පවත්වාගෙන යාම

- ප්‍රධාන කාර්යය සාධක දර්ශක (KPI) සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම හා දත්ත පද්ධති පවත්වාගෙන යාම විශ්ලේෂණය කිරීම
- අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා අවශ්‍ය දත්ත එකතු කිරීම, යාවත්කාලීන කිරීම සහ වාර්තා පිළියෙල කිරීම
  - 2014 වසරේ දී විශ්වවිද්‍යාලවල පවතින භාෂා විද්‍යාගාර පහසුකම් සහ අන්තර්ජාල හා Wi-Fi පහසුකම් පිළිබඳ දත්ත රැස් කිරීම
  - මෙරට විශ්වවිද්‍යාලවල තුල අධ්‍යාපනය ලබන විදේශීය සිසුන් පිළිබඳ දත්ත රැස්කිරීම.

## 6. අනෙකුත් කාර්යයන්

- අමාත්‍යාංශයේ ක්‍රියාකාරී දින දර්ශනය සකස් කිරීම
- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව පර්යේෂණ යෝජනා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ රාජකාරී කටයුතු අධීක්ෂණය කිරීම
- ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ වාර්තාව යාවත්කාලීන කිරීම
- සාර්ක් සමාජ ප්‍රඥප්තිය සකස් කිරීමේ කාර්යයට සහභාගී වීම
- ජ්‍යෙෂ්ඨ අමාත්‍ය කාර්යාලයට ජාතික මානව සම්පත් සහ සේවා නියුක්ති ප්‍රතිපත්ති සැකසීමේදී අමාත්‍යාංශ දායකත්වය ලබා දීම
- මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට අවශ්‍ය දත්ත ලබා දිම
- ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන් පැවරී ඇති වගකීම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම
- විශේෂ දිස්ත්‍රික් සංවර්ධන රැස්වීම් සඳහා අමාත්‍යාංශයෙන් සහභාගී වූ අතිරේක ලේකම්වරුන් සඳහා දත්ත ලබා දීම. (පුත්තලම,රත්නපුර,අනුරාධපුර)

**සැලසුම් අංශයේ කාර්ය මණ්ඩලය - 2014**

සැලසුම් අංශයේ 2014.01.01 දිනසිට 2014.12.31 දින දක්වා සේවයේ රැඳී සිටි නිලධාරීන්

- ජී.එම්.ආර්.ඩී. අපොන්සු (අධ්‍යක්ෂ - සැලසුම්)
- එච්.ඒ.ආර්.පී.ප්‍රනාන්දු (සහකාර අධ්‍යක්ෂ)
- කේ.ඒ.ජී.දිල්රුක්ෂි (සහකාර අධ්‍යක්ෂ)
- ඩබ්.පී.එච්. විජේසිංහ (සංවර්ධන සහකාර)
- ඒ.බී.එම්.ජේ.සී.බන්ඩාර (සංවර්ධනසහකාර)
- පී.පී. ගොඩගම (සංවර්ධන නිලධාරී)
- යූ.ජේ.පී. ප්‍රනාන්දු (සංවර්ධන නිලධාරී)
- යූ.එස්.මද්දුමගේ(සංඛ්‍යාලේඛණ සහකාර)
- ඊ.ඩී.මධුරි තරංගා කුමාරි (සංවර්ධන නිලධාරී)
- ඩී.ජී.ඒ.පී ගුණරත්න (සංවර්ධන නිලධාරී)
- චන්දන ලක්මාල් (කාර්යාල කාර්ය සහායක)

2014.01.01 දිනසිට 2014.12.31 දින දක්වා සේවයට පැමිණි නිලධාරීන් - නැත.
2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා සේවයෙන් ඉවත්ව ගිය නිලධාරීන්

- ජී.ඒ.ටී.ඩී. පෙරේරා (සංවර්ධන නිලධාරී)

<u>ගිණුම් අංශය- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය</u>

1. 2014 වර්ෂයේ වාර්ෂික විසර්ජන පනත මඟින් ශීර්ෂ අංක 171 යටතේ මෙම අමාත්‍යාංශය වෙත වැඩසටහන් 02 ක් යටතේ අදාල ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් රු.8,177,671,740.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර දී තිබූ අතර 2014 වර්ෂය අවසානයේදී එයින් රු.8,108,322,359.00 ක වියදමක් දරා තිබුණි. ඒ අනුව සමස්ත මූල්‍ය ප්‍රගතිය 99% ක් වේ.
ඊට අදාල විස්තර පහත පරිදි වේ.

| වැඩසටහන | ව්‍යාපෘතිය | වෙන්කර දී ඇති ප්‍රතිපාදන | දරණ ලද වියදම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1.<u>මෙහෙයුම්</u> | | | | |
| i) | <u>අමාත්‍ය කාර්යාලය</u> | | | |
| | පුනරාවර්තන | 68,441,537.00 | 68,441,537.00 | 100% |
| | ප්‍රාග්ධන | 15,960,765.00 | 4,999,519.00 | 31.3% |
| ii) | පරිපාලන හා ආයතන සේවා | | | |
| | පුනරාවර්තන | 208,520,526.00 | 208,420,017.00 | 99.95% |
| | ප්‍රාග්ධන | 4,906,699,912.00 | 4,905,996,678.00 | 99.98% |
| 2. <u>සංවර්ධන</u> | | | | |
| iii) | උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වැඩි දියුණු කිරීම සඳහා | | | |
| | පුනරාවර්තන | 812,819,000.00 | 812,608,000.00 | 99.97% |
| | | 663,000,000.00 | 659,000,000.00 | 99.4% |
| | ප්‍රාග්ධන | 1,502,230,000.00 | 1,448,856,608.00 | 96.4% |
| iv) | උසස් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති | | | |
| මුළු ප්‍රතිපාදන හා වියදම | | 8,177,671,740.00 | 8,108,322,359.00 | 99% |

2. **මෙහෙයුම් වැඩසටහන -**

වැඩසටහන 2 - පරිපාලන හා ආයතන සේවා

මේ යටතේ 2014 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.4,906,699,912.00 ක් වූඅතර සමස්ත වියදම රු.4,905,996,678.00 ක් වේ.

- ❖ මෙම වියදමින් රු. 4,537,791,297.00 ක මුදලක් විශ්වවිද්‍යාල නේවාසිකාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වැයකර ඇති අතර එම ප්‍රමාණය සමස්ත වියදමින් 92% ක් වේ.
- ❖ විශ්වවිද්‍යාල සඳහා තේරී පත්වුන නවක සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන් අදියර කිහිපයක් 2014 වර්ෂයේදී ක්‍රියාත්මක වූ අතර මේ සඳහා රු. 265,630,215.00 ක වියදමක් දරන ලදී.

3. **සංවර්ධන වැඩසටහන**

ව්‍යාපෘතිය 3 - උසස් අධ්‍යාපනයේ ගුණාත්මක වැඩිදියුණු කිරීම් සඳහා ආයතනික සහාය

| | ඇස්තමේන්තු මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදන | දරන ලද වියදම |
|---|---|---|
| (i) ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය | | |
| පුනරාවර්තන වියදම් | 525,000,000.00 | 525,000,000.00 |
| ප්‍රාග්ධන වියදම් | 250,000,000.00 | 250,000,000.00 |
| (ii) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය | | |
| පුනරාවර්තන වියදම් | 122,334,000.00 | 122,123,000.00 |
| ප්‍රාග්ධන වියදම් | 300,000,000.00 | 296,000,000.00 |
| (iii) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | | |
| පුනරාවර්තන වියදම් | 165,485,000.00 | 165,485,000.00 |
| ප්‍රාග්ධන වියදම් | 113,000,000.00 | 113,000,000.00 |

ව්‍යාපෘතිය 4 - උසස් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති

- ❖ මේ සඳහා වෙන්කර ඇති සමස්ත ප්‍රතිපාදන රු. 1,502,230,000.00 ක් වූ අතර එයින් රු. 1,448,856,608.00 ක මුදලක් වැය කරන ලදී.

වැය විස්තරය පහත සඳහන් පරිදි වේ.(රුපියල් වලිනි)

| | |
|---|---|
| ➢ Tsunami Rehabilitation Project | 72,000,000 |
| ➢ Higher Education for 21st Century Project (HETC) | 964,995,952 |
| ➢ South Eastern University Development Project (SEUDP) | 253,607,497 |
| ➢ SATREPS Project for Development of Pollution Control & Environment Restoration Technologies of Waste Landfill Sites | 88,812,613 |
| ➢ Improvement of Japanese Language Learning of University Of Kelaniya& University of Sabaragamuwa | 42,730,491 |
| ➢ Building Research Excellence in Wildlife & Human Health in Sri Lanka | 17,615,744 |
| ➢ Erasmus Mundas Action 2 Lot 9, Expert Exchange by Promoting Quality Education, Research & Training in South and South East Asia | 756,965 |
| ➢ Norwegian Programme for Capacity Building in Higher Education & Research Development (NORHED) Project | 8,337,346 |

**4. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

වෙන්කර ඇති ප්‍රමාණය රු. 5,000,000.00
වියදම් කර ඇති ප්‍රමාණය රු. 4,829,160.00

වියදම් විස්තර පහත පරිදි වේ.

| ණය වර්ගය | ලබා දුන් නිලධාරීන් සංඛ්‍යාව | මුදල |
|---|---|---|
| ආපදා ණය | 42 | 4,372,160 |
| පාපැදි ණය | 02 | 12,000 |
| උත්සව අත්තිකාරම් | 81 | 405,000 |
| විශේෂ අත්තිකාරම් | 16 | 40,000 |
| | | **4,829,160** |

අත්තිකාරම් ගිණුම් සැසඳීම් වාර්තා කාර්තු වශයෙන් පිළියෙල කරන ලද අතර මුදල් රෙගුලාසි 506 ඩී ප්‍රකාර අවසාන ගිණුම විගණකාධිපති වෙත නියමිත දිනට ප්‍රථම ඉදිරිපත් කර ඇත.

5. **මාසික ගිණුම් සාරාංශ**

මාසික ගිණුම් සාරාංශ නියමිත දිනට ප්‍රථම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

6. **බැංකු සැසඳුම් සකස් කිරීම**

මාසික බැංකු සැසඳුම් යාවත්කාලීනව මාසිකව පිළියෙල කර අදාල අංශ වෙත ඉදිරිපත් කර ඇත.

7. **විගණන විමසුම්**

2014 වර්ෂය තුළ අමාත්‍යාංශය වෙත විගණන විමසුම් 09 ක් ලැබී ඇති අතර 2014.12.31 වන විට එයින් 08 කට පිලිතුරු සපයා ඇත.

8. **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ**

2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කාලානුරුපීව නිම කර ඇත.

9. **විසර්ජන ගිණුම**

2014 වර්ෂයේ වාර්ෂික විසර්ජන ගිණුම නියමිත දිනට ඉදිරිපත් කර ඇත.

## මාධ්‍ය අංශය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව ආසියාවේ දැනුම් කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමේ පැහැදිලි ඉදිරි දැක්මක් යටතේ කටයුතු කරන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් සඳහා මාධ්‍ය ඒකකය වෙතින් සුවිශේෂී දායකත්වයක් සැපයිණි. ඒ අනුව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතිනවිශ්වවිද්‍යාල, ආයතන, විදේශ ව්‍යාපෘතිආදියෙහි සිදු වූ සංවර්ධන කාර්යයන්, නව හඳුන්වාදීම්, අලුත් වැඩසටහන් හි සමාරම්භක හා ඇතුළු විශේෂ අවස්ථාවන්හි මාධ්‍ය ආවරණ කටයුතු මෙන් ම මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු ද අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය විසින් සිදුකරනු ලැබීය.

ප්‍රධාන වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සෘජු අධීක්ෂණය යටතේ පැවති විශ්වවිද්‍යාල 15 ද උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින විශ්වවිද්‍යාල දෙක ද ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ද මාධ්‍ය ප්‍රචාරණ කටයුතු මෙන් ම සම්බන්ධීකරණ කටයුතු ද මෙම අංශයෙන් ආවරණය කරන ලදි.

එමෙන් ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ඉතිහාසයේ ප්‍රථම වතාවට අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ වෙබ් අඩවියක්, ෆේස්බුක් පිටුවක් මාධ්‍ය අංශය මඟින් නිර්මාණය කොට නිසි පරිදි යාවත්කාලීන කරමින් පවත්වාගෙන යන ලද අතර අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය ද නිසි පරිදි යාවත්කාලීන කරමින් අමාත්‍යාංශය හෝ ඊට සම්බන්ධ ප්‍රවෘත්ති, දිනපතා පුවත්පත්වල පළවන ප්‍රවෘත්ති සහ ඡායාරූප මෙන් ම වීඩියෝ දර්ශන ද ඇතුළත් කරමින් යාවත්කාලීන කිරීම සිදු කරන ලදි.

'සත්‍ය වේගවත්ව-ආදර්ශනය කර ගනිමින් එදින පුවත් එදින ම අඩුම තරමේ වෙබ් අඩවිවලවත් ප්‍රචාරය කිරීමේ ඉලක්කය මාධ්‍ය ඒකකයේ නිලධාරීන් සියල්ල තුළ විය. අනෙකුත් අමාත්‍යාංශ මාධ්‍ය ඒකක සමඟ සංසන්දනයේ දී එකී අමාත්‍යාංශවල මාධ්‍ය ඒකක නොලැබූ ප්‍රගතියක් ඉතා කෙටි කාලයක් තුළ ළඟා කරගැනීමට මාධ්‍ය අංශයට හැකියාව ලැබුනේ ද ඒ අනුව ය.

අමාත්‍යාංශය හා ඊට සම්බන්ධ සියලු ම ආයතනයන්හි හා ඒ යටතේ ක්‍රියාත්මක අනෙකුත් ව්‍යාපෘති පිළිබඳ දිනපතා සහ සති අන්ත පුවත්පත්වල පළවන පුවත් අඩංගු ප්‍රවෘත්ති සහ ලිපි අඩංගු ලිපි ගොනුවක් සකස් කොට එය අමාත්‍යවරයාට, නියෝජ්‍ය අමාත්‍යවරයාට සහ ලේකම්වරයාට එමඟින් අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් පිළිබඳ දෛනිකව ඔවුන් දැනුවත් කිරීම මඟින් තීරණ ගැනීම කඩිනම් කිරීමට දායක වීමේ හැකියාව ලැබුණි.

**2014 වසරේදී මාධ්‍ය ඒකකය විසින් ආවරණය කර ප්‍රචාරය කළ ක්‍රියාකාරකම්**

- නායකත්ව පුහුණු පාඨමාලාව ආරම්භයේ පටන් අවසානය දක්වා ඡායාරූප, වීඩියෝ සහ ශබ්ද පටිගත කිරීම, මාධ්‍ය වෙත ලබාදීම, මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු සහ ප්‍රචාරණ කටයුතු.- හොරණ, දියතලාව, ගන්නොරුව, බූවැලිකඩ යන නායකත්ව පුහුණු මධ්‍යස්ථානවල කටයුතු එමඟින් ආවරණය කරන ලදි.

- ඩිජිටල් යුගය කරා අධ්‍යාපනය පරිවර්තනය (Transforming education for the digital age) (ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක ඇකඩමිය ජනවාරි 09)

- ජනවාරි නවවන දින පැවැති "Institute of Applied Statistics Sri Lanka Induction of the president "

- 2016 ජනවාරි 16 දින පැවැති "Unstoppable Sri Lanka 2020 Analyzing Development"වැඩමුළුව

- ත්‍රිකුණාමලය, පූනෑව, මින්නේරිය හා අනුරාධපුරය නායකත්ව පුහුණු වැඩසටහන් නිරීක්ෂණ චාරිකාවන්

- කිලිනොච්චිහි පිහිටි යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂි පීඨය විවෘත කිරීම සහ ඉංජිනේරු පීඨය විවෘත කිරීමේ උත්සවය

- විශ්වවිද්‍යාල සිසුන්ගේ තොරතුරු තාක්ෂණ නිපුණතා පරීක්ෂණය - ත්‍යාග ප්‍රදානෝත්සවය

- මහාචාර්ය ධර්මා ද සිල්වා අභිනන්දන උළෙල සහ මහාචාර්ය ධර්මා ද සිල්වාගේ කළමණාකරණ අධ්‍යාපනය, ගොලීයකරණය, ව්‍යාපාර, අපනයනය, අලෙවිකරණ ක්‍රම පිලිබඳ වාර්තා, රචනා සහ දේශන ඇතුළත් ග්‍රන්ථය හඳුන්වා දීම

- ග්‍රාමීය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (RED)

- නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාණිජ්‍ය හා කළමනාකරණ පීඨය විවෘත කිරීම

- නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාණිජ්‍ය හා කළමනාකරණ පීඨය විවෘත කිරීමේ උත්සවය

- විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සිසු දරු දැරියන්ගේ කුසලතා එළිදක්වන කවිතා චිත්‍ර තරඟය විවෘත කිරීම

- කවිතා අවසන් තරඟාවලිය හා උත්සවය

- SAITM කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන

- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, උසස් අධ්‍යාපනයේ නායකත්වය පිළිබඳ කලාපීය වැඩමුළුව - ආසියාව සඳහා වූ පොදු රාජ්‍ය මණ්ඩලීය මාධ්‍ය කේන්ද්‍රය සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

- කින්ස්බරි හෝටලයේ පැවැති "AACSB international advanced quality management education worldwide through accreditation leadership and value added services" වැඩමුළුව

- හොරණ ශ්‍රීපාලි මණ්ඩපයේ සිසු දරු දැරියන්ගේ චිත්‍ර තරඟය විවෘත කිරීම

- Menasa Learning Providers Conference 2014

- රාජගිරිය ආයුර්වේද සිසුන්ගේ නේවාසිකාගාර පරීක්ෂා කිරීම හා ඔවුන්ට නේවාසිකාගාර ව්‍යාපෘතිය යටතේ නේවාසිකාගාර ලබාදීම පිළිබඳ තීරණගැනීමේ සාකච්ඡාව

- වෙසක් දිනය නිමිති කොට ගෙන පූජ්‍ය මාවරලේ භද්දිය හිමි විසින් අමාත්‍යංශ පරිශ්‍රයේදී සිදුකළ ධර්ම දේශනාව

- විශ්වවිද්‍යාල සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා තරඟයේ ජයග්‍රාහකයන්ගේ ත්‍යාග ප්‍රදානෝත්සවය

- දෙරටේ උසස් අධ්‍යාපන කටයුතු සංවර්ධනය සඳහා භූතාන් තානාපතිතුමා සහ අමාත්‍යවරයා අතර පැවති සාකච්ඡාව

- දෙරටේ උසස් අධ්‍යාපන කටයුතු සංවර්ධනය සඳහා වියට්නාම් තානාපති සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයා අතර පැවති ඓතිහාසික සාකච්ඡාව

- අන්තර්ජාතික ආයුර්වේද අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවය

- සත්වන"Tourism outlook conference" සහ තුන්වන "Tropical coastal and Island Tourism Conference"

- නායකත්ව පුහුණු පාඨමාලාවට අමාත්‍යවරයාගේ සහභාගීත්වය -ගන්නෝරුව,තලාතුඔය, බූවැලිකඩ කඳවුරු

- සංස්කෘතික කටයුතු අමාත්‍යංශය මඟින් මෙහෙය වූ ජාතික සාහිත්‍ය කලා ප්‍රසාදිනී උළෙල

- දැනුම පදනම් කර ගත් ආර්ථික විද්‍යාව සහ සාර්ක් කලාපයේ ආර්ථික වර්ධනය පිළිබඳ වැඩමුළුව

- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය

2014 වර්ෂය තුළ මාධ්‍ය අංශයේ සේවය කොට ඉවත්ව ගිය සාමාජිකයින් හා ඔවුන් ඉටු කළ කාර්යයන්

1. ආර්.ඩීකේසර ජයසිරි - සංවර්ධන සහකාර - පුවත්පත් සඳහා වාර්තා සැකසීම
2. ගයාන් ඉද්දමල්ගොඩ - සංවර්ධන සහකාර - පුවත්පත් සඳහා වාර්තා සැකසීම, පුවත්පත් සමඟ සම්බන්ධීකරණ කටයුතු
3. වානක දුහුල්වල -කාර්යාල කාර්ය සහායක (තාවකාලික)

## කවිතා Talent ව්‍යාපෘතිය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

**01.පරමාර්ථ** :- ක්ෂිතිජයෙන් එහා කුසලතා පිරි නිර්මාණශීලී උගත් පරපුරක් දැයට දායාද කිරිම.

**02.අරමුණු** :- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවත්නා විශ්වවිද්‍යාල සහ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන අති දක්ෂ විද්‍යාර්ථීන්ගේ කලා කුසලතා සංවර්ධනයට, ප්‍රදර්ශනයට එළිදැක්වීමට හා ඇගයිමට ලක්කර ඔවුන් ජාතික හා ජාත්‍යාන්තර තලයට ගෙන ඒම.

**03. ව්‍යාපෘති ආරම්භය:-** කවිතා ව්‍යාපෘතිය 2011 වසරේ සැළසුම් කරන ලදී.

**3.1.** 2012 වසරේ ඉල්ලුම්පත් කැඳවීම් කරන ලද අතර 2013 වසරේ ප්‍රථම අවසන් තරඟාවලිය සහ සම්මාන උළෙල නෙළුම් පොකුණ රඟහලේ දී පවත්වන ලදී.

**3.2.** එය අංශ 07ක් යටතේ (සිංහල මාධ්‍ය තරඟ 27ක්, දමිළ මාධ්‍ය තරඟ 27ක් = 54 ලෙස) පැවති අතර චිත්‍ර හා ඡායාරූප යන අංශ 02 භාෂා භේදයකින් තොරව තරඟ 02ක් ඇතුලත් විය. මුළු තරඟ සංඛ්‍යාව 56 කි.

**04. දෙවන සම්මාන උළෙල:-**

දෙවන සම්මාන උළෙල සහ අවසාන තරඟාවලිය 2014 වසරේ දී බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී.ප්‍රථම වසරේදී මෙන්ම මෙම වසරේදීත් සිංහල හා දමිළ අවසන් තරඟාවලි 02ක් හා සම්මාන උළෙල 02ක් දින දෙකක් තුළ පැවැත්විණි. දෙවන සම්මාන උළෙලේ දී ප්‍රථම වටයේ පැවති ඇතැම් තරඟ අංශ ඉවත් කිරිමට සිදුවිය.එයට හේතු වුයේ ඇතැම් තරඟ අංශ සඳහා සිසුන්ගේ වැඩි ප්‍රතිචාරයක් නොවිමයි.

- මෙම වැඩසටහන් ආරම්භ කිරිමට පෙර 2013 වසරට අදාළ ගෙවීම් කිරිම සඳහා වවුචර්පත් හා එයට අදාල ලිපි ලේඛන පිළියෙල කිරිමේ කටයුතු සිදුකරනු ලැබු අතර සිංහල මාධ්‍ය පස්වන තරඟවය සහ දමිළ මාධ්‍ය තෙවන තරඟවටය සඳහා වු පෙර සුදානම් වීම් මෙම කාලය තුළ සිදු විය.තරඟකරුවන් දැනුවත් කිරිම,ඔවුන්ට අවශ්‍ය ශාලා පහසුකම්, ආහාරපාන, නවාතැන් පහසුකම්, ආදිය මේ කාලය තුළ දී සංවිධානය කිරිමට සිදු විය.

2014.01.01 සිට 2014.01.31 දින දක්වා කවිතා Talent තරඟාවලියේ සිංහල මාධ්‍ය පස්වන තරඟවටය සහ හා දමිළ මාධ්‍ය තෙවන තරඟවටයට අදාළ වැඩසටහන් පැවැත්විණි. මෙහි දී සිංහල මාධ්‍ය සංගීත, නර්තන, චිත්‍ර පුහුණු වැඩමුළු පැවැත්වුණි.

තවද දමිළ මාධ්‍ය සංගීත පුහුණු, වාදන වැඩමුළු පැවැත්වුණි. මෙම වැඩමුළු පවත්වන ලද්දේ මහරගම ජාතික අධ්‍යාපන ආයතනය, නාරහේන්පිට චිත්‍රසේන කලායතනය, චිත්‍ර වැඩමුළු සඳහා දෙහිවල සත්ත්වෝද්‍යානය තෝරා ගන්නා ලදී.

මෙහි දමිළ මාධ්‍ය තෙවන තරඟවටය සහ සිංහල මාධ්‍ය පස්වන තරඟවට රූගත කරන ලද්දේ බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේදී ය.

- **පෙබරවාරි** මාසය තුළ පස්වන තරඟවටයේ වැඩසටහන් රූගත කිරිම් සිදු කළ අතර, නිවේදන පුහුණු වැඩමුළු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලදී.චිත්‍ර පුහුණු වැඩමුළු සහ තරඟකරුවන්

තෝරා ගැනීම මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී සහ බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේ දී පැවැත්විණි. තවද මේ සඳහා සහභාගී වූ විනිසුරුවරුන්ට සහ අධ්‍යක්ෂකවරුන්ට ගෙවීම් සිදු කිරීමට අදාළ සියලු කටයුතු එම මස අවසාන වන විට සිදු විය.

- 2014.03.01 සිට 2014.03.31 දක්වාසිංහල මාධ්‍ය සංගීත අංශයේ හයවන තරඟවටයට අදාළ පුහුණු වැඩමුළු බුදවත්ත කලායතනයේ දී පැවැත්වූ අතර, බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේ රූගත කිරීම් සඳහා වේදිකාව නිර්මාණය කර විදුලි ආලෝකකරණය කිරීම සිදු කරන ලදී.ජනනැටුම් අවසාන තරඟාවලියට අදාළ රූගත කිරීම් කටයුතු සිදු කරන ලදී. ඡායාරූප වැඩමුළුවක් පුරහල පරිශ්‍රයේ දී සංවිධානය කර තිබුණි. සිංහල මාධ්‍ය සංගීත හයවන තරඟවටයට අදාළ රූ ගත කිරීම් බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේ දී පැවැත්වීමට කටයුතු කෙරිණි. එදිනම ඡායාරූප වැඩමුළුවක් බම්බලපිටිය ඡායාරූප පාසලේ දී පැවැත්විණි.

  දමිළ මාධ්‍ය සංගීත, නර්තන, හාස්‍ය, ජනනැටුම් තරඟ සඳහා පුහුණු වැඩමුළු මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවැත්වීමට කටයුතු යොදා තිබූ අතර ආහාරපාන , නවාතැන් පහසුකම් සපයන ලද්දේ මහරගම ජාතික අධ්‍යාපන ආයතනය මගිනි.බත්තරමුල්ල අපේගම පරිශ්‍රයේ දී දමිළ මාධ්‍ය හතරවන තරඟවටයට අදාළ සංගීත, හා නර්තන තරඟවට රූ ගත කිරීම් සිදු කරන ලදී.සිංහල හා දමිළ මාධ්‍ය අවසාන මහා තරඟාවලිය සඳහා ආරාධනාපත්‍ර, සහතික පත්‍ර, මුද්‍රණය කිරීම.තරඟකරුවන් සඳහා ලබාදීමට නියමිත කුසලාන සහ සම්මාන සෑදීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම හා එම ආයතන වෙත භාර දීම.අවසාන මහා තරඟාවලියට අදාලව ගෙවීමට නියමිතව තිබූ අත්තිකාරම් මුදල් ගෙවීමට කටයුතු කිරීම සහ අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සිදු විය.ඒවා අමාත්‍යාංශ ප්‍රධානීන් වෙත ඉදිරිපත් කිරීම හා අනුමත කරවා ගැනීම මෙම කාලයේ දී කළ කාර්යයන් ලෙස දැක්විය හැක.මෙම සියලුම කාර්යයන් දමිළ මාධ්‍ය වැඩසටහන සඳහා ද උපයෝගී කර ගන්නා ලදී.

- 2014.04.01 දින සිට 2014.04.30 දින දක්වා දින දමිළ මාධ්‍ය නිවේදන, හාස්‍ය උත්පාදක තරඟ රූගත කිරීම් බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේ දී සිදු කෙරුණු අතර සිංහල මාධ්‍ය සංගීත අංශයේ අවසන් පූර්ව තරඟවටයට අදාළ පෙර පුහුණුවීම් වැඩමුළු මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී පවත්වන ලදී.

  සිංහල මාධ්‍ය සංගීත හා නර්තන අවසන් පූර්ව තරඟ වැඩසටහන් බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේ දී පැවැත්විණි. තවද අවසාන තරඟාවලියට අදාලව පැවැත්වීමට නියමිතව තිබූ අවසාන මහා තරඟාවලිය සහ සම්මාන උළෙල සඳහා අවශ්‍ය කටයුතු මෙම මාසය තුළ සිදු කිරීමට සැළසුම් කරන ලදී.

  අවසාන මහා තරඟාවලිය බණ්ඩාරණායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී මැයි මස 22 දින හා 24 දින පැවැත්වීමට කටයුතු යොදා තිබූ අතර, චිත්‍ර හා ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීමට ද කටයුතු සම්පාදනය කරන ලදී. ඒ සඳහා ශාලා පහසුකම් වෙන් කරවා ගැනීමට හැකි වූයේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ ජේ.ඩී.ඒ.පෙරේරා ශාලාවයි. එම චිත්‍ර මවුන්ට් කිරීම, තරඟකරුවන්ගේ තොරතුරු එකතු කර ගැනීම, චිත්‍ර හා ඡායාරූප ප්‍රදර්ශනය සඳහා වෙනම ආරාධනා පත්‍රයක් සකස් කිරීම, ඡායාරූප තෝරා ගැනීම, ප්‍රවාහන පහසුකම් ආදී විවිධ කටයුතු කිරීමට මෙම කාලය තුළ සිදු විය.

  ආරාධිත අමුත්තන් සඳහා ආරාධනාපත් යැවීම, ශාලාවේ ආසන වෙන් කිරීම, අවසරපත් ලබා දීම හා මුද්‍රණය කිරීම,වාහන අවසරපත් සකස් කිරීම, ආයතනික නිලධාරීන් සඳහා රාජකාරි හැඳුනුම්පතක් නිර්මාණය කිරීම, චිත්‍ර,ඡායාරූප හා අවසාන තරඟාවලියට අදාල Catalog (සමරුකලාප) ආදිය

නිර්මාණය කිරිම සහ ඒවා මුද්‍රණය කිරිම ආදියත් සියලුම ප්‍රධාන ආරාධිතයින්ගේ සහ අංශ ප්‍රධානින්ගේ නිවේදනයන් ලබා ගැනිමත් මෙම කාලය තුළ ඉටු කිරිමට තිබු කාර්යයන් ලෙස දැක්විය හැකිය.

- 2014.05.01 දින සිට 2014.05.31 දින දක්වා කාලය තුළ දී අවසාන තරඟාවලිය සහ සම්මාන උළෙලට අදාල කාර්යයන් සිදු කරන ලදී.එහි දී තරඟාවලියට සහභාගි වන සියලුම සිසුන්ගේ නාම ලේඛනයක්, එයට සහභාගී වන ආරාධිත අමුත්තන්ගේ ලේඛනයක්, සහභාගී සෙසු සියලුම නිලධාරින්ගේ සහ සමාජිකයින්ගේ ලේඛනයක් පිළියෙළ කිරිම. ආරාධනාපත්, පුවත්පත් දැන්විම් සහ ප්‍රචාරණය සඳහා අවශ්‍ය කටයුතු සැළසිම.

ආහාරපාන, තරඟකරුවන්ට අවශ්‍ය නවාතැන් පහසුකම් සළසාදිම, ඔවුනට ලබාදිමට නියමිතව තිබු ත්‍යාග මුදල් සඳහා අවශ්‍ය කටයුතු සළසා ගැනිම කාර්යයන් බෙදා අදාල නිලධාරින් වෙත පැවරිම ආදි කටයුතු සිදු කරන ලදී.

තවද තරඟකරුවන්ට අවශ්‍ය මුල්‍ය පහසුකම් සළසා දිම, මෙම වැඩසටහන් හා සම්බන්ධ වන ආයතනයන් සඳහා ගෙවිම් කිරිමට කටයුතු සිදු කිරිම, අත්තිකාරම ගෙවිම, ප්‍රවාහන පහසුකම් සළසා ගැනිම, අදාල ආයතන මගින් මිල ගණන් කැඳවා ඒවා ප්‍රසම්පාදන අංශය වෙත ලබා දී ආයතන තෝරා ගැනිම.

සාහිත්‍ය අංශයේ තේරිපත් වු තරඟකරුවන්ගේ නිර්මාණ කෘති මුද්‍රණය කිරිම සිදු කෙරිණි. එම නිර්මාණ කෘති ආරාධිත අමුත්තන් සඳහා බෙදා දිමට අදාලව අවශ්‍ය කටයුතු සම්පාදනය කිරිම මේ කාලයේ දී සිදු විය.

චිත්‍ර හා ඡායාරූප ප්‍රදර්ශනට අදාල කටයුතු සිදු කරනු ලැබු අතර එම ආයතනය වෙත ගොස් අදාල නිර්මාණ ප්‍රදර්ශනය සඳහා සකස් කිරිම සිදු විය. සිංහල හා දමිළ මාධ්‍ය අවසාන තරඟාවලියට අදාල පුහුණු වැඩමුළු මහරගම ජාතික අධ්‍යාපන ආයතනය, බුදවත්ත කලායතනයේ දී පැවැත්වුණි. සිංහල මාධ්‍ය අවසාන මහා තරඟාවලියේ ගායනා අංශයෙන් ඉදිරිපත් කරන ලද සංගීත ත්‍රිත්ව ගායනා පුහුණුවිම් අජිත් සවුන්ඩ්ස්හි දී පැවැත්විණි.

2014.05.16,17 යන දිනයන්හිදි චිත්‍ර ප්‍රදර්ශනය සඳහා සුදානම් විමත් 2014.05.18 සහ 2014.05.19 දෙදින චිත්‍ර ප්‍රදර්ශනය දෘශ්‍ය කලා පීඨයේ ප්‍රදර්ශනය කරන ලදී.

අවසාන තරඟාවලියට අදාලව වේදිකාව නිර්මාණය සහ ආලෝකකරණව කිරිම බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී සිදු විය.2014.05.21 අවසන් මහා තරඟාවලියේ සිංහල මාධ්‍ය පෙර පුහුණු වැඩසටහන් බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විම.2014.05.22 සිංහල මාධ්‍ය අවසාන මහා තරඟාවලිය සහ සම්මාන උළෙල පැවැත්විම.2014.05.23 දමිළ මාධ්‍ය පෙර පුහුණු වැඩසටහන් පැවැත්විම.2014.05.24 දමිළ මාධ්‍ය අවසාන මහා තරඟාවලිය සහ සම්මාන උළෙල පැවැත්විම.

කවිතා තරඟාවලියේ සහ සම්මාන උළෙල සඳහා පසුවිපරමක් කිරිම හා සම්මාන දිනාගත් විද්‍යාර්ථීන් ඇගයිමට ලක් කිරිම මෙහිදී සිදුවිය.2014/2015 කවිතා තරඟාවලියට අදාල මුලික සැළසුම් සකස් කිරිම ද සිදු විය.2014/2015 කවිතා සම්මාන උළෙල සහ තරඟාවලියට අදාල මුලික වැය

ඇස්තමේන්තු සකස් කර ඒවා අධීක්ෂණය කිරිමට අදාල නිලධාරින් වෙත පැවරිම.විශ්වවිද්‍යාල හා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන මට්ටමින් චිත්‍ර සහ ඡායාරූප ප්‍රදර්ශනය හා සංගීත වැඩසටහනක් පැවැත්විම පිළිබඳ සාකච්ඡා සිදු කිරිම.අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමක් පවත්වා 2014/2015 කවිතා වැඩසටහන පිළිබඳව සැළසුම් සකස් කිරිම. තවද තරඟ පැවැත්විමට අදාල අනෙකුත් සැළසුම් සකස් කිරිම හා අදාල ස්ථාන තෝරා ගැනිම මේ අතර සිදු විය. චිත්‍ර සහ ඡායාරූප තරඟ අංශය සඳහා ඉදිරිපත් වූ විද්‍යාර්ථීන්ට නැවත එම නිර්මාණ භාර දීමට කටයුතු කිරිම.

සියලුම විශ්වවිද්‍යාල සහ උසස් තාක්ෂණ ආයතනයන්හි සිටින කවිතා වැඩසටහන් සම්බන්ධිකරණ නිලධාරින් සමග සාකච්ඡා කොට 2014/2015 කවිතා Talent වැඩසටහනේ මූලික තරඟ වැඩසටහන් සම්බන්ධිකරණ කටයුතු සිදු කිරිමට සැළසුම් කිරිම.

## ශිෂ්‍ය කටයුතු අංශය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ශිෂ්‍ය කටයුතු අංශය ශිෂ්‍ය කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශකවරයෙක්, සංවර්ධන නිලධාරියෙක් හා කළමනාකරණ සහකාරවරියක් යන නිලධාරීන්ගෙන් සමන්විත කුඩා අංශයකි. මෙම අංශයේ මූලික අරමුණ වන්නේ සියළුම විශ්වවිද්‍යාලවල හා උසස් තාක්ෂණ ආයතනවල ශිෂ්‍ය සුභසාධනය ඉහළ නැංවීම සම්බන්ධයෙන් කටයුතු සිදු කර ගෙන යාම වන අතර, මෙම අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද නායකත්ව හැකියාව සහ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා ද 2014 වර්ෂයේදී සක්‍රීය කාර්යය භාරයක් ඉටුකරන ලදී.

2014 වර්ෂය සඳහා ශිෂ්‍ය කටයුතු අංශය මගින් සිදුකරන ලද කාර්යයන් පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.

### 1. නායකත්ව හැකියාව සහ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන 2014/2015

2014/2015 අධ්‍යයන වර්ෂ සඳහා විශ්වවිද්‍යාල සඳහා බඳවා ගනු ලබන සිසුන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මාසය දක්වා අදියර හතරකින් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා අමාත්‍යාංශයේ ශිෂ්‍ය කටයුතු අංශය ආරම්භයේ සිට අවසානය දක්වාම සක්‍රිය දායකත්වයක් දරන ලදී.

නායකත්ව පුහුණු මධ්‍යස්ථාන සඳහා තෝරාගත් ශිෂ්‍ය නාමලේඛන අන්තර්ජාලයට මුදාහැරීමත් සමඟ ශිෂ්‍යයන්ගෙන් ලැබෙන ගැටළු සඳහා පිළිතුරු දීම ශිෂ්‍ය කටයුතු අංශයේ එක් අංගයක් වන අතර, ශිෂ්‍ය ගැටළු හැකි උපරිමයෙන් විසඳීමට කටයුතු කරන ලදි.

නායකත්ව පුහුණු වැඩසටහන සම්බන්ධව ප්‍රධාන වශයෙන් ශිෂ්‍ය කටයුතු අංශයට පහත සඳහන් කාර්යයන් සම්බන්ධීකරණය කිරීමේ කටයුතු පැවරී ඇත.

#### i. දේශන සඳහා සම්පත් දායකයින් තෝරා ගැනීම.

නායකත්ව පුහුණු වැඩසටහනට අදලාව ඉතිහාසය, ගෝලීයකරණය, වෘත්තීය මාර්ගෝපදේශනය, විශ්වවිද්‍යාල අධ්‍යාපනය වශයෙන් දේශන 5ක් සහ වෛද්‍යවරුන් විසින් විශේෂ දේශන පවත්වනු ලැබේ.

මෙම දේශන සඳහා සම්පත්දායකයින් සියළුම විශ්වවිද්‍යාල නියෝජනය වන පරිදි තෝරා ගනු ලැබුනු අතර, 2014 ජුනි 26 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී විශේෂ වැඩමුළුවක් හා පුහුණු සැසිවාරයක් පවත්වා උක්ත මාතෘකා පිළිබඳ විශේෂ පුහුණුවක් සම්පත් දායකයන් වෙත ලබා දෙන ලදී.

මෙම සම්පත් දායකයින් සියළුම ශිෂ්‍ය පුහුණු මධ්‍යස්ථාන සඳහා ආරාධිත දේශන සඳහා යොදවා ගත් අතර සම්බන්ධීකරණ කටයුතු හා අත්‍යවශ්‍ය වෙනස්කම් අවශ්‍ය අවස්ථාවලදී සිදු කරන ලදී.

#### ii. භාෂා පරිවර්තකයන් තෝරා ගැනීම

2014/2015 නායකත්ව පුහුණු වැඩසටහන සඳහා පුහුණු මධ්‍යස්ථාන 3 කදී සිංහල හා දමිල මාධ්‍ය සිසුන් දෙපිරිසම සහභාගී වූ අතර දමිල මාධ්‍ය සිසුන් සඳහා සිංහල භාෂාවෙන් සිදු කරන සියළු ක්‍රියාකාරකම් දමිල භාෂාවෙන් ක්‍රියාත්මක කිරීමේදී භාෂා පරිවර්තකයින්ගේ සහය ලබා ගත යුතුයි.

මේ සඳහා පලපුරුද්ද සහ සුදුසුකම් සහිත භාෂා පරිවර්තකයන් බඳවා ගැනීම හා ඔවුන් සම්බන්ධීකරණය මෙම අංශය මගින් සිදුකරන ලද තවත් කාර්යයකි.

**iii.** <u>සංස්කෘතික වැඩසටහන</u>

නායකත්ව පුහුණු වැඩසටහනෙහි සෑම ශිෂ්‍ය පුහුණු මධ්‍යස්ථානයකම දිනකට එක බැගින් දින 3ක් සංස්කෘතික වැඩසටහනක් පවත්වනු ලැබේ. මේ සඳහා සංගීත, නැටුම් ආදී වශයෙන් සංස්කෘතික කණ්ඩායම් සිංහල, දෙමළ හා මුස්ලිම් අංගයන් තෝරාගෙන පවත්වනු ලැබිණ. මෙම කණ්ඩායම් නිසි පරිදි අදාල පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කිරීම හා ඔවුන් සම්බන්ධීකරණය ද මෙම අංශයට පැවරී ඇත.

මෙම සියළු කටයුතු සඳහා ගෙවීම් කිරීම සඳහා අදාල වවුචර් පත් සියල්ල සකස් කර ජ්‍යෙෂ්ඨ උපදේශක කීර්ති මාවැල්ලගේ මහතාගේ නිර්දේශය සහිතව ගෙවීම් කිරීම සඳහා යොමු කරනු ලැබේ.

**2.** <u>විශ්වවිද්‍යාල ශිෂ්‍ය නේවාසිකාගාරවල අවශ්‍යතා සපුරාලීම.</u>

i) සියළුම විශ්වවිද්‍යාලවල ශිෂ්‍ය සුභසාධන අංශ භාර නිලධාරින් හා අදාළ වෙනත් නිලධාරින් අමාත්‍යාංශය වෙත කැඳවා ඔවුන් සමඟ මසකට වරක් සාකච්ඡා කොට ඒ ඒ විශ්වවිද්‍යාලවල නේවාසිකාගාර අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු කිරීම. මේ සඳහා විශ්වවිද්‍යාල වලින් හෝ අමාත්‍යාංශයෙන් අරමුදල් ලබා දීමට යම් ක්‍රමවේදයක් සැලසුම්කිරීම.

ii) සියළුම නේවාසිකාගාර වලට සිසුන්ගේ අවශ්‍යතා වලට සරිලන සේ රූපවාහිණී යන්ත්‍රයක් බැගින් හා නේවාසිකාගාර උපපාලකවරුන්ට පරිගණකයක් බැගින් ලබා දීමට කටයුතු කිරීම.

**3.** <u>මහපොළ ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර ගෙවීම</u>

i) සියළුම විශ්වවිද්‍යාලවල ශිෂ්‍යාධාර හෝ මහපොළ මුදල් නොලබන එහෙත් යම් ආධාර මුදලක් ලැබිය යුතු සිසුන් සඳහා යම් ආධාර මුදලක් ලබා දීමට සැලසුම් සකස් කිරීම. (දැනට මේ සම්බන්ධයෙන් පිහිටුවා ඇති අරමුදල තවදුරටත් ශක්තිමත් කිරීම හා එය ශක්තිමත් කිරීමට විශ්වවිද්‍යාල මට්ටමින් සාකච්ඡා කර සුදුසු ක්‍රියාකාරකම් සිදු කිරීම)

ii) සෑම විශ්වවිද්‍යාලයකම සිසුන් සඳහා ගෙවනු ලබන ශිෂ්‍යාධාර හා මහපොළ ගෙවීම් වලදී ඇති දුෂ්කරතා වේ නම් ඒවා මඟහරවා සියළුම සරසවි වල විධිමත් ක්‍රමයකට සකස් කරනු ලබන කාලසටහනකට අනුව ගෙවීම් සිදුකිරීමට කටයුතු යෙදීම.

**4.** <u>කලා කටයුතු</u>

i) විශ්වවිද්‍යාල පනතේ සඳහන් පරිදි සෑම විශ්වවිද්‍යාලයකම කලා සංසද පිහිටුවීම, ඒවා යාවත්කාලීන කිරීම හා ඒවාට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ මෙන්ම මානව සම්පත්ද ලබා දී ඒවා සක්‍රීයව පවත්වා ගෙන යාම.

ii) ඒ ඒ විශ්වවිද්‍යාල මට්ටමින් ඒ සඳහා සුදුසු අයුරු අතුරු ව්‍යවස්ථා සම්පාදනය කොට ඒ මගින් විවිධ කලා කටයුතු වලට අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**5. ශිෂ්‍ය ගැටළු හා විනය කටයුතු**

i) විශ්වවිද්‍යාලවල විවිධ ශිෂ්‍ය කටයුතු, ශිෂ්‍ය ඉල්ලීම් මෙන්ම ශිෂ්‍ය ගැටළු සම්බන්ධව ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි උපකුලපතිවරුන්, පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරිවරුන්, ශිෂ්‍ය උපදේශකවරුන්, විවිධ ශිෂ්‍ය සංවිධාන වල නියෝජිතවරුන්, ශිෂ්‍ය සංගම් නියෝජිතවරුන් කැඳවා ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා පවත්වා අවශ්‍ය විසඳුම් ලබා දීමට කටයුතු කිරීම.

ii) විශ්වවිද්‍යාල ශිෂ්‍ය විනය ගැටළු හා ශිෂ්‍ය උද්ඝෝෂණ මෙන්ම සිසුන්ගේ විවිධ අහිතකර ක්‍රියාකාරීත්වයන් පිළිබඳව ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ උපදෙස් පරිදි අවස්ථෝචිත අයුරින් කටයුතු කිරීම.

iii) අවශ්‍ය වන අවස්ථා වලදී සිසුන්ගේ දෙමාපියන්/ භාරකරුවන් කැඳවා සිසුන්ගේ කටයුතු පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම.

**6. විශ්වවිද්‍යාල වල අධ්‍යයන පාඨමාලා හා අදාළ වෙනත් කටයුතු**

i) විශ්වවිද්‍යාල වල දැනට පවත්වා ගෙන යනු ලබන අධ්‍යයන පාඨමාලා වර්තමාන ආර්ථික ලෝකයට කොතරම් දුරට ගැළපේද යන්න විශ්වවිද්‍යාල වල උපකුලපතිවරුන්, සනාථන සභා නියෝජිතවරුන් හා විද්වතුන් සමඟ සාකච්ඡා පවත්වා එම අදහස් හා තොරතුරු මෙන්ම ඊට ආනුශාංගික වූ විවිධ ගැටළු සම්බන්ධව ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා හා ලේකම්තුමා දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

**7. උසස් තාක්ෂණ ආයතන කටයුතු**

i) උසස් තාක්ෂණ ආයතනවල ශිෂ්‍ය සුභසාධනයට අදාළව පවත්නා අඩුපාඩු සොයා බලා අවශ්‍යතාව පරිදි අවශ්‍යතා සපුරාලමින් සුභසාධන කටයුතු විධිමත් පරිදි පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.

ii) ශිෂ්‍ය විනය කටයුතු මෙන්ම ශිෂ්‍ය ගැටළු සම්බන්ධයෙන් උසස් තාක්ෂණ ආයතන වල අධ්‍යක්ෂවරුන්, දේශකවරුන්, අධ්‍යක්ෂ ජනරාල් මෙන්ම සිසුන්ගේ දෙමාපියන් කැඳවා ඔවුන් සමඟ සාකච්ඡා කොට ඒ සඳහා සුදුසු විසඳුම් ලබා දීම.

iii) ශිෂ්‍ය ප්‍රශ්න හා ඔවුන්ගේ විවිධ ඉල්ලීම් සම්බන්ධයෙන් ශිෂ්‍ය ක්‍රියාකාරීන් ශිෂ්‍ය සංගම් නිලධාරීන් කැඳවා ඔවුන් සමඟ සාකච්ඡා පවත්වා ඒවා සඳහා සුදුසු විසඳුම් ලබා දීම.

iv) සියළුම විශ්වවිද්‍යාල හා උසස් තාක්ෂණ ආයතනවල සිසුන්ගේ සුභසාධනය, අධ්‍යයන කටයුතු මෙන්ම ඔවුන්ට ඇති වන විවිධ දුෂ්කරතා හා විවිධ ගැටළු සම්බන්ධයෙන් සෑම අවස්ථාවකම ඉදිරිපත් වී විශ්වවිද්‍යාල/ උසස් තාක්ෂණ ආයතන ප්‍රජාව, සිසුන් අදාළ වන විවිධ රාජ්‍ය ආයතන හා පුද්ගලයින් සමඟ මෙන්ම ශිෂ්‍ය දෙමාපියන් සමඟ නිරන්තර සහසම්බන්ධතා පවත්වා ගනිමින් සියළු ගැටළු වලට හා ප්‍රශ්න වලට විසඳුම් සෙවීම මෙම අංශයේ මුඛ්‍ය පරමාර්ථය වේ.

<u>අභ්‍යන්තර විගණන අංශය- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය</u>

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින උසස් අධ්‍යාපන ආයතන සඳහා අභ්‍යන්තර විගණන වැඩ සටහන සැලසුම් කර ක්‍රියාත්මක කිරීම මෙම අංශය මගින් සිදුවේ.

මෙම අංශයේ කාර්යභාරය අමාත්‍යාංශ ලේකම්ගේ සෘජු අධීක්ෂණය යටතේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ඉටු කරනු ලැබේ.

2014 වර්ෂයේ අභ්‍යන්තර විගණන අංශයේ සේවය කරන ලද කාර්ය මණ්ඩලය

1. කේ.වී.එස්. ද සිල්වා මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක,ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය, 1 පන්තිය
2. එම්.ඒ.ඒ.සී.පී. අල්විස් මිය - සංවර්ධන නිලධාරි
3. සුමේධා කුමාරි අරටුවාව මෙනවිය - පරිගණක සහකාර

2014 වර්ෂයේදි අභ්‍යන්තර විගණන අංශය මඟින් ඉටු කරන ලද කාර්ය භාරය :-

1. විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම:-

කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(1) අනුව අමාත්‍යාංශයේ විගණන කමිටුව පිහිටුවා ඇති අතර 2014 වසර තුළදි කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

සභාපති - ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා,ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
සාමාජික - ඒ.එන්.හපුගල මහතා, අධ්‍යක්ෂ, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
සාමාජික - ඩබ්.ඩී. දුෂ්මන්ත මහතා, ප්‍රධාන ගණකාධිකාරි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
නිරීක්ෂණ සාමාජික - වී.ඩී. සීතා මහත්මිය, විගණන අධිකාරි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
කැඳවුම්කරු - කේ.වි.එස්.ද සිල්වා මහත්මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

ඉහත නිලධාරීන්ට අමතරව කමිටු රැස්වීම් සඳහා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, අධ්‍යක්ෂවරුන් හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ප්‍රධානින් හා ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්ද සහභාගි කරවා ගැනේ.

2014.04.02, 2014.07.07, 2014.10.03, 2014.12.05 යන දිනයන්හිදි කමිටුව අවස්ථා 4 කදි රැස්වූ අතර, අභ්‍යන්තර විගණන වාර්තා, විගණකාධිපති වාර්තා, පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේ වාර්තා හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශයන්ද සැලකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාල පද්ධතියේ පවතින දුර්වලතා හා ඌනතා මග හැරීමට හා වැඩි දියුණු කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදි.
විගණන හා කළමනාකරණ කමිටුව මගින් පහත සඳහන් අංශයන්හි පවතින අඩුපාඩු පිළිබඳ සාකච්ඡා කර, නිවැරදි කිරීම සඳහා උපදෙස් හා මගපෙන්වීම් ලබා දෙන ලදී.

i. විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල ස්ථාවර වත්කම් ලේඛන සකස් කිරීම හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත දිනට නිම කිරීම.

ii. විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීම් ප්‍රමාද වී ඇති අවස්ථා සොයා බලා ක්‍රියා කිරීම.

iii. උසස් අධ්‍යාපන ආයතනවල උපායශීලි සැලැස්ම යාවත්කාලීන කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරිම හා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම ප්‍රමාද වූ අවස්ථා පිළිබඳව කටයුතු කිරීම.

iv. උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු පසුවිපරම් කිරීම. මේ යටතේ එම ආයතනවල විගණන කමිටු ඵලදායිව පැවැත්වීම, වාර්ෂික විගණන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම හා අභ්‍යන්තර විගණන කටයුතුවල ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කර අවශ්‍ය උපදෙස් ලබා දීම.

v. විගණකාධිපති වාර්තා මගින් පෙන්වාදී ඇති, වාර්ෂික මූල්‍ය ප්‍රකාශවල ඇති ගිණුම්කරණ දෝෂයන් නිවැරදි කිරීම්වල ප්‍රගතිය නියාමනය කිරීම.

vi. අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින ව්‍යාපෘතිවල වාර්ෂික අයවැය ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳව සමාලෝචනය කිරීම.

2. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයට අදාලව,

i. අම්පාර උසස් තාක්ෂණ ආයතනයේ මූල්‍ය කළමනාකරණ කටයුතු පිළිබඳව විශේෂ විමර්ෂණ පැවැත්වීම.

ii. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ ගිණුම්කරණ කටයුතු සඳහා හඳුන්වා දී ඇති ගිණුම්කරණ පැකේජය පිළිබඳව පද්ධති විගණනයන් සිදු කිරීම.

iii. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ පිළිතුරු පත්‍ර ඇගයීමේ ක්‍රියාවලිය පිළිබඳව පද්ධති විගණනයන් සිදු කිරීම.

iv. සියලුම උසස් තාක්ෂණ ආයතනවල අධ්‍යක්ෂවරුන්, ලේඛකාධිකාරිවරුන් භාගණකාධිකාරිවරුන් සඳහා එම ආයතනවල මූල්‍ය කළමනාකරණ අඩුපාඩු මගහැර ගැනිම හා පාලන පිළිවෙත් ශක්තිමත් කිරීම සඳහා මග පෙන්වීම් ලබා දීමට පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

3. අහිතකර විගණන මතයන් ප්‍රකාශ කර ඇති , පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, විවෘත විශ්වවිද්‍යාලය හා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය යන ආයතනවල විගණන මතය සඳහා බලපා ඇති කරුණු විශ්ලේෂණය කර අදාල නිවැරදි කිරීමේ කටයුතු සඳහා මග පෙන්වීම් ලබා දීම හා ප්‍රගතිය සමාලෝචනය කිරීම.

## ලේකම් කාර්යාලය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

අමාත්‍යාංශයේ ලේකම්වරයා යටතේ සෘජුව ක්‍රියාත්මක වන ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුලදී ඉටු කරන ලද කාර්යන් පහත පරිදි වේ.

- ලේකම් කාර්යාලය වෙත දිනපතා පැමිණෙන සේවාලාභීන් හා අමුත්තන්ගේ අවශ්‍යතා ඉටුකර දීම හා ලේකම්තුමා වෙත යොමු කිරීම.
- ලේකම්/ලේකම් කාර්යාලය වෙත දිනපතා ලැබෙන ඊමේල්, ෆැක්ස්, අතින් හා තැපැල මගින් ලැබෙන ලිපි හා ආරාධනා පත්‍ර ප්‍රමුඛතාවය අනුව සටහන් කිරීම හා ලේකම්තුමා දැනුවත් කිරීම හා පිළිතුරු යැවීම.
- දිනපතා ලේකම්තුමාගේ රාජකාරී දිනපොත මෙහෙයවීම ලේකම්තුමා විසින් පවරන ලිපි සැකසීම සහ ඊමේල් පණිවුඩ යැවීමට කටයුතු කිරීම.
- ගරු ඇමතිතුමා, විශ්වවිද්‍යාල සහ අනෙකුත් ආයතන සමග සාකච්ඡා සම්බන්ධීකරණය කිරීම.
- ලේකම්තුමාගේ අවශ්‍යතාවය පරිදි වෙනත් ආයතන හා සාකච්ඡා සම්බන්ධීකරණය කිරීම, අවශ්‍ය ලිපි ලේඛණ සූදානම් කරදීම හා එහි පසුවිපරම් කටයුතු කිරීම.
- අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සාරාංශගත කර ලේකම්තුමා මගින් ගරු ඇමතිතුමා වෙත ඉදිරිපත් කිරීම හා තීරණ පිළිබඳව පසුවිපරම් කිරීම.
- සාර්ක් සමුළුවේ සියලු සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම
- මාසිකව පැවැත්වෙන ප්‍රතීතනය සහ තත්ව සහතික කිරිමේ ස්ථාවර කමිටු රැස්වීමට ලේකම් කාර්යාලය නියෝජනය කරමින් සහභාගී වීම. රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල සඳහා ලැබෙන අයදුම්පත් පිළිබඳ ලේකම්තුමා දැනුවත් කිරිම හා එයට අදාළ ලිපි ගොනු ලේකම්තුමාගේ පරිශිලනය කිරිම සඳහා යාවත්කාලීන කිරීම
- සතිපතා පැවැත්වෙන අමාත්‍ය මණ්ඩල රැස්වීමට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ගොනුව අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් ලැබුණු විගස එය සාරාංශ ගත කොට ලේකම්තුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරිමෙන් අනතුරුව ගරු අමාත්‍යතුමා වෙත යොමු කිරීම
- UNESCO සාකච්ඡා හා සම්මන්ත්‍රණ වලට අදාල සියලු සම්බන්ධීකරණ කටයුතු
- නීති ගැටළු සම්බන්ධ කාරණා සඳහා අවශ්‍ය හදිසි ලියකියවිලි සකස් කිරීම.
- විශ්වවිද්‍යාල ආචාරවරුන්ගේ සමිති සම්මේලනය සම්බන්ධ ලිපි ගොනුව යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබෙන ලිපි සඳහා අවශ්‍ය කටයුතු කිරිම හා පිළිතුරු ලිවිම.
- විදේශ ශිෂ්‍යත්ව සඳහා පල වන දැන්වීම් පිළිබඳ සොයා බැලිම අවබෝධතා ගිවිසුම් හා එම තොරතුරු යාවත්කාලීන කිරීම.

- අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ වැඩසටහන් වලට අදාල ලිපිගොනු පවත්වාගෙන යාම.

- ලේකම් කාර්යාලය වෙත දිනපතා ලැබෙන පුවත්පත් මඟින් අමාත්‍යාංශයට අදාල පුවත් සාරාංශගත කොට ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීම.

- ලේකම් කාර්යාලය වෙත ලැබෙන ලිපි ලිපිගොනු පරිගණක ගතකර ලේකම්තුමා වෙත යොමු කිරීම හා එම ලිපි අදාල මාණ්ඩලික නිලධාරීන් වෙත යොමු කිරීම

- ලේකම් කාර්ය මණ්ඩලයේ බඩු වට්ටෝරු පොත් යාවත්කාලීන කිරීම.

- අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල තීරණ, ජනාධිපති කාර්යාලයෙන් යොමු කරන ලිපි, පනත් සහ ව්‍යවස්ථා වලට අදාල ලිපිගොණු යාවත්කාලින කොට පවත්වාගෙන යාම

- ලේකම් කාර්යාලයේ කටයුතු සඳහා අවශ්‍ය මුදල් අත්තිකාරම් ලබා ගැනීම හා පියවීම.

**2014.12.31 දින වන විට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් කාර්යාලයේ සේවය කරන ලද කාර්ය මණ්ඩලය**

| | |
|---|---|
| චාරිකා ලියනආරච්චි | ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් |
| කේ.දමිත එරන්ද ජීවක පෙරේරා | සංවර්ධන නිලධාරී III |
| එම්.එල්.එන්. සංජීවනී | සංවර්ධන නිලධාරී III |
| එම්.ඩී.එච්. ප්‍රනාන්දු | සංවර්ධන නිලධාරීIII |
| යෂීමා කල්හාරි දසනායක | සංවර්ධන නිලධාරී |
| ඩබ්.වී. මධූෂා ප්‍රසාදිනී | කළමනාකරණ සහකාර (NODES) |
| යෂිකා ලියනආරච්චි | පරිගණක යෙදුම් සහකාර (කැලණිය විශ්වවිද්‍යාලය) |
| බුද්ධික සමීර කල්දේරා | කාර්යාල සේවක සේවය (NODES) |
| තුෂාර සම්පත් ධර්මසේන | කාර්යාල සේවක සේවය |

**ලේකම් කාර්යාලයේ 2014 වසරේ ජනවාරි මස පළමු දින සිට 2014 වසරේ දෙසැම්බර් මස 31වන දින දක්වා ලේකම් කාර්යාලයේ සේවය කර පසුව වෙනත් අංශ සඳහා අභ්‍යන්තර ස්ථාන මාරු ලද හා අලුතින් ස්ථිර පත්වීම ලද සේවකයින්ගේ තොරතුරු පහතින් දැක්වේ.**

- ඒ.එස්.එම්. ද අල්විස් මෙනෙවිය, සංවර්ධන නිලධාරී - 2014.01.28 වන දින ලේකම් කාර්යාලයේ සේවයෙන් තොරතුරු තාක්ෂණ අංශයට අභ්‍යන්තර ස්ථාන මාරු කර ඇත.

- යෂීමා කල්හාරි දසනායක මෙනෙවිය, සංවර්ධන නිලධාරී - 2014.03.31 වන දින ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ සිට උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරු කර ඇත.

- එම්.ඩී.එච්. ප්‍රනාන්දු මහත්මිය, සංවර්ධන නිලධාරී - 2014.08.20 වන දින සිට අමාත්‍යාංශයේ නීති අංශය වෙත අභ්‍යන්තර ස්ථාන මාරු කර ඇත.

**ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් ඉටු කරන ලද විශේෂ වැඩසටහන්**

01. SIIIP - Solutions, Ideas, innovation, Invention and Products

විසඳුම්, අදහස්, නවෝත්පාදන, නව සොයා ගැනීම් හා නිෂ්පාදන වැඩසටහන

මෙම වැඩසටහන උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල හා උසස් තාක්ෂණ ආයතනයන්හි අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විවිධ නවෝත්පාදන කුසලතාවයන් සංවර්ධනය කිරීම සඳහා නිර්මාණය කරන ලද වැඩසටහනකි. තරඟයක් ලෙස සංවිධානය කර ඇති මෙම වැඩසටහනේ අභිමතාර්ථය වන්නේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සතු නවෝත්පාදන හා නිර්මාණශීලී කුසලතා අභිප්‍රේරණය කරවීමයි.

02. AACSB සමුළුව - The Association to Advance Collegiate School of Business

කළමනාකරණ අධ්‍යයනයේ ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ AACSB ආයතනය හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව කරන ලද වැඩමුළුව

මෙහි අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වල කළමනාකරණ අධ්‍යයන උපාධි පාඨමාලා ලොව පිළිගත් ඉහළ ගුණත්වයෙන් යුතු පිළිගැනීමක් සහිත උපාධියක් මෙරට සිසුන්ට ලබා දීමට කටයුතු කිරීමයි. ඒ අනුව AACSB ආයතනයේ කළමනාකාරණ අධ්‍යයනය පිළිබඳ මූලිකාංග හා තත්වයන් මෙරට විශ්වවිද්‍යාල වල අනුගමනය කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දීමයි.

03. UNESCO සමුළුව - උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව තහවුරු කිරීම පිළිබඳ කලාපීය වැඩමුළුවට සමගාමීව ආසියා පැසිෆික් කලාපයේ උසස් අධ්‍යයන සුදුසුකම් පිළිගැනීම මැයෙන් වූ කලාපීය කමිටුවේ 13 වන සැසියට සත්කාරකත්වය සැපයීම.

මෙම අවස්ථාවට විදේශ රටවලින් නියෝජිතයින් 60 දෙනෙකු පමණ සහභාගී වූ අතර දේශීය වශයෙන් පුද්ගලයින් සිය දෙනෙකු පමණ සහභාගී විය. මෙහි මූලික අරමුණු අතර උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිගැනීමේ ක්‍රියාදාමය සහ එහිලා මුහුණපෑමට සිදුවූ අභියෝග පිළිබඳව, විදේශ රටවල සුදුසුකම් පිළිගැනීම සඳහා වූ මූලික මෙවලම් පිළිබඳව අවබෝධය ප්‍රවර්ධනය කිරීම එනම් ජාතික සුදුසුකම් රාමුව National Qualification Framework (NQF), ජාතික තොරතුරු මධ්‍යස්ථානය National Information center (NIC) සහ උපාධි තොරතුරු සහතිකපත්‍ර යනාදියයි.

04. SAARC සමුළුව - සාර්ක් කලාපීය දැනුම පාදක ආර්ථිකයක් සහ ආර්ථික වර්ධනය සඳහා වූ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නවෝත්පාදන පිළිබඳව වැඩමුළුව

පාකිස්ථානයේ ඉස්ලාමාබාද් නුවර පිහිටි සාර්ක් මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඒකාබද්ධව සංවිධානය කරන ලදී. සාර්ක් කලාපීය සියලුම රටවල උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නවෝත්පාදන පිළිබඳව සාකච්ඡා වූ අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඒ ඒ රටවල සිදුකෙරෙන නවෝත්පාදන පිළිබඳව ඇගයීමක් සහ පවතින ප්‍රතිපත්ති වැඩසටහන් පිළිබඳව තුලනාත්මක ඇගයීමක් සිදුකිරීම තුලින් කාලාපීය නවෝත්පාදන ක්ෂේත්‍රයේ පවතින ගැටලු, ඒ සඳහා ඉදිරිපත් කෙරෙන නව විසිඳුම්, කලාපීය වශයෙන් එක්ව සිදුකළ හැකි තීන්දු තීරණ ගැනීම් සහ ප්‍රතිපත්ති පිළිබඳව සාකච්ඡාවට භාජනය විය.

<u>නායකත්ව හැකියාව හා ධනාත්මක ආකල්ප වර්ධනය පිළිබඳ ව්‍යාපෘතිය</u>

පාසල් අධ්‍යාපනය අවසන් කොට උසස් අධ්‍යාපනය ආරම්භ කිරීමට සැරසෙන සිසුන්ගේ **න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව තුළින් නායකත්ව හැකියාව, කණ්ඩායම් හැඟීම සහ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම මෙම පුහුණු පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වේ.** මෙරටේ අනාගත නායකත්වය ගොඩනැගෙනුයේ උසස් අධ්‍යාපනය ලබන්නා වූ තරුණ තරුණියන්ගෙනි. උසස් අධ්‍යාපනය ලබන කාලයේදීත් ඉන් අනතුරුවත් උපාධිධාරීන්ගේ සමාජ භූමිකාව තුළත් ඔවුන් හට විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදුවේ. එම අභියෝග ජයගෙන අනාගතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය නිර්මාණශීලී පෞරුෂයන් බිහිකිරීම උසස් අධ්‍යාපනයේ අරමුණ වේ. එම අරමුණ සඵල කරගැනීමට උසස් අධ්‍යාපනය ලබන දරු දැරියන්ගේ මානසික සූදානම, කාල කළමනාකරණය, නිවැරදි තීරණ ගැනීම, ධෛර්යය සම්පන්න බව, සංවාදශීලී බව, කණ්ඩායම් හැඟීම, අන්‍යන්ගේ අදහස් වලට ගරු කිරීම ආදී පෞරුෂ ගුණාංග වැඩිදියුණු කල යුතුය. මේ සඳහා සැලසුම් කල නායකත්ව පුහුණු පාඨමාලාව තුළින් ළඟාකර ගැනීමට අපේක්ෂා කරනු ලබන  අරමුණු කිහිපයක් පහතින් දක්වා ඇත.

- ☆ නායකත්ව ගුණාංග වර්ධනය කිරීම
- ☆ සමාජ විනය හැඩ ගැස්වීම
- ☆ නිපුණතා සංවර්ධනය කිරීම
- ☆ අභියෝග ජය ගැනීමට අවශ්‍ය මානසික සූදානම ඇති කිරීම
- ☆ නිවැරදි සමාජ අපේක්ෂාවන් ජනිත කිරීම
- ☆ වෘත්තීය මාර්ගෝපදේශනය ලබාදීම සහ
- ☆ මානසික සමතුලිතතාවය වර්ධනය කිරීම.

ඉහත කී අරමුණ ඉටුකර ගැනීම සඳහා පවත්වනු ලබන නායකත්ව පුහුණු පාඨමාලාව නේවාසික පාඨමාලාවක් වන අතර එය සිංහල හා දමිල මාධ්‍යයන්ගෙන් දින 21 ක් පුරා පැවැත්වේ. විවිධ ක්ෂේත්‍ර පිළිබඳව දැනුම හා අත්දැකීම් වලින් පරිපූර්ණ වූ සම්පත් දායකත්වයක් ඇතිව සැලසුම් කර ඇති, මෙම පාඨමාලාව දේශන, සාකච්ඡා, සාමූහික ක්‍රියාකාරකම් සහිත විවිධ සන්නිවේදන මාධ්‍යයන් උපයෝගී කරගනිමින් අවශ්‍ය දැනුම සහ පුහුණුව සහභාගී වන්නන්ට ලබාදෙනු ඇත.

සමාලෝචිත වසරේ දී පැවැත්වූ නායකත්ව හැකියාව හා ධනාත්මක ආකල්ප වර්ධනය පුහුණු පාඨමාලාවේ අන්තර්ගතය සැකෙවින් මෙසේය.

- ශාරීරික අභ්‍යාස - ඇවිදීම/ දිවීම, ඇඟ උණුසුම් කිරීමේ ව්‍යායාම සහ මාංශ පේශීන් වර්ධනය කිරීමේ ව්‍යායාම හඳුන්වාදීම.
- සාමූහික සරඹ.
- සන්ධ්‍යා ක්‍රීඩා - පාපන්දු, අත්පන්දු, පැසිපන්දු, දැල්පන්දු සහ ක්‍රිකට් ආදී ක්‍රීඩා කටයුතු වල නිරත වීම.
- සංස්කෘතික හා විවිධ ක්‍රියාකාරකම් - සිසු සිසුවියන්ගේ කලා රසාස්වාදය හා මානසික සුවය සඳහාත් සහජ දක්ෂතා හා හැකියාවන් ඉදිරිපත්කිරීම සඳහාත් විවාද තරඟ/ ගායන/ නර්ථන/ නාට්‍ය වැනි ක්‍රියාකාරකම් සඳහා සාමූහිකව හෝ තනි තනිව ඉදිරිපත්කිරීමට අවස්ථාව ලබා දේ.
- නේවාසිකාගාර පිළිවෙත් හා පෞද්ගලික සනීපාරක්ෂාව.
- සමාජීය සිරිත් විරිත්.
- ගැටුම් කළමනාකරණය.
- නායකත්ව ගුණාංග වර්ධනය පිළිබඳ න්‍යායාත්මක ඉගැන්වීම් හා ප්‍රායෝගික ක්‍රියාකාරකම්, ප්‍රජා සත්කාරක වැඩසටහන්, සාමූහික ක්‍රියාකාරකම්, අවස්ථානුකූලව තීරණ ගැනීම්, ක්ෂණික කණ්ඩායම් ක්‍රියාකාරකම්.
- ආත්ම විශ්වාසය වර්ධනය කිරීම.
- ලිංගික ගැටලු හා පවුල් සංවිධානය.
- ප්‍රථමාධාර.
- නීතිය හා මූලික මිනිස් අයිතිවාසිකම්.
- උපදේශණය, වෘත්තීය මාර්ගෝපදේශණය
- සංස්කෘතික චාරිකා.
- සමාලෝචනය හා සමීක්ෂණය.

නායකත්ව පුහුණු ව්‍යාපෘතියේ කටයුතු දැනට අමාත්‍යාංශයේ සේවයේ යොදවා ඇති කාර්යය මණ්ඩලය මඟින් නොයෙක් අපහසුතා මැද ඉටු කරමින් සිටින අතර, මෙම ව්‍යාපෘතිය සඳහා වෙනම කාර්යය මණ්ඩලයක් අනුමත කර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව අතිරේක ලේකම් (පාලන හා මුදල්) කාර්යාලය මඟින් මෙම ව්‍යාපෘතියේ සියලුම සංවිධාන කටයුතු, පරිපාලන හා මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර, ශිෂ්‍ය කටයුතු අංශය මඟින් මෙම වැඩසටහන සඳහා අවශ්‍ය සම්පත් දායකයින් තෝරා ගැනීම, ඔවුන් පුහුණු මධ්‍යස්ථානවලට යෙදවීම හා ඔවුන්ගේ දීමනා ගෙවීම් නිර්දේශ කිරිමේ කටයුතු ඉටු කරනු ලැබේ. ක්‍රීඩා හා කුසලතා සංවර්ධන අංශය මඟින් ගරු ඇමතිතුමාගේ හා නියෝජ්‍ය ඇමතිතුමාගේ අධීක්ෂණ චාරිකා සංවිධානය කරනු ලබන අතර, තොරතුරු තාක්ෂණ අංශය විසින් සියලුම සිසු සිසුවියන් එක් එක් පුහුණු මධ්‍යස්ථාන වලට ඒවායේ ධාරිතාව අනුව අනුයුක්ත කිරීම කරනු ලැබේ. මෙම වැඩසටහනට අදාල සියලු භාණ්ඩ හා සේවා සැපයුම්හි ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන අංශයෙන්ද, සිසු සිසුවියන්ට ටීෂර්ට්, ට්‍රැක් බොටම්, කැප් අත්පොත් ඇතුළු මුද්‍රිත ද්‍රව්‍ය බෙදාහැරීම සහ සම්පත් දායකයන්ගේ ප්‍රවාහන පහසුකම් ආදිය පිළිබඳ සියලු කටයුතු පාලන අංශය මඟින්ද ඉටු කරනු ලැබේ. මෙම වැඩසටහනට අදාල සියලු බිල්පත් නිරවුල් කිරීම් හා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම පිළිවෙලින් ආයතන අංශය, ගිණුම් අංශය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

විසින් කරනු ලැබේ. නොකඩවා ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත මෙම ව්‍යාපෘතියේ 2015 වර්ෂයට අදාල මූලික කටයුතු 2014 වර්ෂයේ අගභාගයේදී සිදු කරනු ලැබීය.

සිසු සිසුවියන් 23,500 ක ප්‍රමාණයකට නේවාසිකව සති තුනක පුහුණුවක් ලබා දීම අවශ්‍ය බැවින්ද ඒ සඳහා අදාල ධාරිතාවයෙන් යුත් නේවාසික පුහුණු මධ්‍යස්ථාන වෙනත් රජයේ ආයතනවල නොමැති බැවින්ද, නේවාසිකාගාර සඳහා වන ක්ෂය වීම් පිළිබඳව නොසලකා එම නේවාසික පුහුණු මධ්‍යස්ථාන ඒවායේ සියලු සම්පත් සමඟ  ලබා දීමට යුධ, ගුවන් හා නාවික හමුදාධිපතිවරුන් එකඟ වූ බැවින් ද මෙම පුහුණුව එම පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වීමට තීරණය වී ඇත.

ඒ අනුව 2013 වර්ෂයේදී මෙම වැඩසටහන පුහුණු මධ්‍යස්ථාන 20 කදී අදියරයන් 4 ක් යටතේ ක්‍රියාත්මක කරන ලද අතර එහි අදියර 02 ක් 2014 වර්ෂයේ කිරිමට සිදුවිය. 2014 වසර අවසානයේදි පැවැත්වූ නායකත්ව පුහුණු පාඨමාලාව 2014.09.07 දින ආරම්භ වූ අතර එයද  අදියර 4කින් පැවැත්විමට සිදුවිය ඒ සඳහා සහභාගිවූ සිසුන් සංඛ්‍යාව නායකත්ව පුහුණුවට තෝරාගත් සිසුන් සංඛ්‍යාවෙන් 80%කි. සහභාගිවූ මුළු සිසුන් සංඛ්‍යාව 18740 කි. නායකත්ව පුහුණුව පැවැත්වූ මධ්‍යස්ථාන 20 සහ ඒවාට අනුයුක්ත කල හා සහභාගි වූ සිසුන් සංඛ්‍යාව පහත සටහන මඟින් දක්වා ඇත.

## නායකත්ව පුහුණුව - 2014

| | පුහුණු මධ්‍යස්ථානය | නායකත්ව පුහුණුව සඳහා තෝරාගත් සිසුන් ප්‍රමාණය | | | | | සහභාගි වූ සිසුන් ප්‍රමාණය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | I අදියර | II අදියර | IIII අදියර | IV අදියර | එකතුව | I අදියර | II අදියර | III අදියර | IV අදියර | එකතුව | සහභාගි වූ ප්‍රතිශතය % |
| 1 | යුධ හමුදා පුහුණු පාසල, මාදුරු ඔය | 750 | 919 | 665 | 665 | 2,999 | 688 | 540 | 579 | 585 | 2,392 | 79.75 |
| 2 | පාබල හමුදා පුහුණු මධ්‍යස්ථානය, මින්නේරිය | 800 | 988 | 635 | 523 | 2,946 | 652 | 680 | 458 | 471 | 2,261 | 76.74 |
| 3 | සටන් පුහුණු පාසල - අම්පාර | 550 | 632 | 481 | - | 1663 | 430 | 558 | 425 | - | 1,413 | 84.96 |
| 4 | ප්‍රගුණ හා සැහවුණු වෙඩිකරු පුහුණු පාසල - දියතලාව | 155 | 185 | 121 | - | 461 | 120 | 137 | 96 | | 353 | 76.57 |
| 5 | යුධ හමුදා හට කාර්යය සම්පාදන විද්‍යාලය - ත්‍රිකුණාමලය | 600 | 646 | 451 | - | 1,697 | 462 | 566 | 371 | - | 1,399 | 82.43 |
| 6 | සන්නද්ධ බලකා පුහුණු මධ්‍යස්ථානය - කලත්තෑව, ගල්කුලම, අනුරාධපුරය | 200 | 238 | 152 | - | 590 | 133 | 176 | 133 | - | 442 | 74.91 |
| 7 | කාළතුවක්කු හමුදා පුහුණු පාසල - මින්නේරිය | 215 | 237 | 166 | 176 | 794 | 150 | 181 | 151 | 164 | 646 | 81.36 |
| 8 | ශ්‍රී ලංකා යුධ ඉංජිනේරු පුහුණු පාසල - තුන්කම, ඇඹිලිපිටිය | 330 | 431 | 362 | - | 1,123 | 250 | 277 | 322 | | 849 | 75.60 |
| 9 | සංඥා පුහුණු පාසල - බූවැලිකඩ,මහනුවර | 235 | 297 | 174 | - | 706 | 180 | 223 | 154 | | 557 | 78.89 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | පාබල හමුදා රෙජිමේන්තු පුහුණු පාසල - බූස්ස, ගාල්ල | 350 | 412 | 340 | - | 1,102 | 234 | 270 | 280 | - | 784 | 71.14 |
| 11 | ඉංජිනේරු සේවා වෘත්තීය පුහුණු පාසල - තලාව, අනුරාධපුර | 170 | 241 | 153 | - | 564 | 127 | 170 | 131 | - | 428 | 75.88 |
| 12 | සේවා බලකා පුහුණු පාසල - තිසාවැව | 263 | 361 | 254 | - | 878 | 201 | 247 | 202 | - | 650 | 74.03 |
| 13 | යුධ උපකරණ පුහුණු පාසල - හොරණ ,දොඹගොඩ | 293 | 331 | 335 | - | 959 | 218 | 212 | 217 | - | 647 | 67.46 |
| 14 | විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු පුහුණු පාසල - ගන්නොරුව, මහනුවර | 292 | 380 | 277 | - | 949 | 220 | 253 | 214 | - | 687 | 72.39 |
| 15 | යුධ හමුදා පොලිස් පුහුණු පාසල - ගිරිතලේ, පොළොන්නරුව | 296 | 405 | 192 | - | 893 | 315 | 278 | 130 | - | 723 | 80.96 |
| 16 | ශ්‍රී ලංකා යුධ හමුදා පොදුසේවා බලකා පුහුණු පාසල - කුට්ටිගල, පදනංගල, ඇඹිලිපිටිය | 202 | 275 | 111 | - | 588 | 160 | 200 | 88 | - | 448 | 76.19 |
| 17 | ශ්‍රී ලංකා නාවික හමුදා පුහුණු පාසල - බූස්ස, ගාල්ල | 440 | 542 | 413 | - | 1,395 | 360 | 385 | 355 | - | 1100 | 78.85 |
| 18 | ශ්‍රී ලංකා නාවික හමුදා පුහුණු පාසල - තලාතුඔය,මහනුවර | 295 | 381 | 230 | - | 906 | 231 | 258 | 211 | - | 700 | 77.26 |
| 19 | ශ්‍රී ලංකා ගුවන් හමුදා පාසල - දියතලාව | 580 | 768 | 485 | - | 1,833 | 431 | 550 | 451 | - | 1432 | 78.12 |
| 20 | ශ්‍රී ලංකා නාවික හමුදා පුහුණු පාසල - පූනෑව | - | 627 | 530 | - | 1,157 | - | 412 | 417 | - | 829 | 71.65 |
| | **එකතුව** | 7,016 | 9,296 | 6,527 | 1,364 | 23,080 | 5,562 | 6,573 | 5,385 | 1,220 | 18,740 | 80.00 |

මේ සඳහා රුපියල් මිලියන 304 ක පමණ මුදලක් වැය දරා ඇති අතර මෙම වැඩසටහනට සහභාගි වූ සිසු සිසුවියන්ට පුහුණු කාලය තුලදී සිදුකරන ක්‍රියකාරකම් සඳහා යොදා ගැනීම පිණිසත්, විශ්වවිද්‍යාලය තුල දෛනික ශාරීරික සුවතා හා ක්‍රීඩා වැඩසටහන් සඳහා යොදා ගැනීම පිණිසත්, ටීෂර්ට් හා ට්‍රැක් බොටම් දෙක බැගින් නොමිලයේ ලබා දී ඇත. සමස්ත වැඩසටහන සඳහා 2014 වර්ෂයේ වැය දරණ ලද වියදම පහත පරිදි වේ.

**2014 වර්ෂය තුළදී නායකත්ව පුහුණු වැඩසටහන සඳහා දරණ ලද වියදම් පිළිබඳ විස්තර**


| **කාරණය** | **දරණ ලද වියදම** |
|---|---|
| ටී ෂර්ට්, ට්‍රැක්බොටම් හා අත්පොත් සඳහා | 43,461,880.00 |
| පුහුණු මධ්‍යස්ථාන වල වියදම් | |
| යුධ හමුදාව සඳහා | 183,657,064.54 |
| නාවික හමුදාව සඳහා | 34,644,267.00 |
| ගුවන් හමුදාව සඳහා | 1,2881,746.07 |
| | **274,644,957.61** |
| ලිපි සැකසීම හා තැපැල් කිරිම සඳහා | 746,054.68 |
| මුද්‍රණ කටයුතු | 4,667,791.56 |
| පුහුණු මධ්‍යස්ථාන කටයුතු අධීක්ෂණය සඳහා නිල සංචාර වියදම් | 1,577,877.10 |
| | |
| සම්පත්දායකයින් සඳහා ගෙවීම් | 5,232,767.60 |
| භාෂණ පරිවර්තනවියදම් | 3,219,000.00 |
| | |
| කලාශිල්පීන්ගේ වියදම් | 7,804,800.00 |
| මාධ්‍ය කටයුතු සඳහා | 4,641,301.68 |
| | |
| ප්‍රවාහන වියදම් | 712,966.00 |
| වෙනත් වියදම් | 724,752.27 |
| **එකතුව** | **303,972,268.50** |

**<u>නායකත්ව පුහුණුව සඳහා යොමු කළ සිසුන් සංඛ්‍යාව/ පුහුණු මධ්‍යස්ථාන වෙත වාර්තා කළ සිසුසිසුවියන්ගේ සංඛ්‍යාව/ වාර්තා නොකරන ලද සිසුසිසුවියන්ගේ සංඛ්‍යාව</u>**

| | යොමු කළ යුතු සිසුන් සංඛ්‍යාව | වාර්තා කළ සිසුසිසුවියන් සංඛ්‍යාව | වාර්තා නොකළ සිසුසිසුවියන් සංඛ්‍යාව | වාර්තා කල ප්‍රතිශතය |
|---|---|---|---|---|
| ගැහැණු | 13,954 | 11,878 | 2076 | 85.12% |
| පිරිමි | 9,126 | 6,862 | 2264 | 75.19% |
| එකතුව | 23,080 | 18,740 | 4340 | 80.00% |

ඉහත තොරතුරු අනුව මෙම වැඩසටහනට වැඩිපුර සහභාගී වී ඇත්තේ සිසුවියන්ය. එය සහභාගී වූ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස 63% කි. සිසුන්ගේ පැමිණීම 37% කි. සමස්ථ සහභාගිත්ව ප්‍රතිශතය 80.00 % ක් වේ.

**<u>නායකත්ව පුහුණුව - 2014 , සහභාගිත්ව ප්‍රතිශතය</u>**




**<u>සිසු දරු දැරියන් මෙම වැඩසටහනට සහභාගී නොවීමට බලපෑ කරුණු</u>**

- මේ සඳහා සහභාගී වීම විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අනිවාර්ය නොවීම
- CIMA, AAT, Chartered වැනි විභාග මෙම නායකත්ව පුහුණු වැඩසටහන පැවති දිනවල පැවතීම.
- Z ලකුණු අගය අඩුවීම මත තමන් කැමති පාඨමාලාවට නොතේරෙන සිසු සිසුවියන් තම Z ලකුණු අගය වැඩි කරගෙන තම අපේක්ෂිත පාඨමාලාව හැදෑරීම සඳහා නැවත වරක් උසස් පෙළ විභාගයට ඉදිරිපත් වීම.

  උදාහරණ : භෞතික විද්‍යාව සඳහා තේරී පත්වී ඇති සිසුන් වෛද්‍ය විද්‍යාව හැදෑරීමේ අපේක්ෂාවෙන් නැවත විභාගයට ඉදිරිපත් වීම.

## විසි එක්වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (එච්.ඊ.ටී.සී. ව්‍යාපෘතිය)

## උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

| | |
|---|---|
| කාල සීමාව | : වසර 5 1/2 |
| මූල්‍ය දායකත්වය | : ලෝක බැංකුව |
| මුළු ව්‍යාපෘති අගය | : ඇමරිකානු ඩොලර් මිලියන 40 |
| ණය අංකය | : 4686 එල්. කේ. |
| ව්‍යාපෘති ආරම්භය | : 2010 නොවැම්බර් 1 |
| ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම | :2015 දෙසැම්බර් 31 |
| ණය ප්‍රදානයේ නිමාව | : 2016 ජූනි 30 |

**ව්‍යාපෘති ඉලක්කය:**

මෙම ව්‍යාපෘතියේ ඉලක්කය වන්නේ සාධාරණ සමාජ හා ආර්ථික සංවර්ධන අවශ්‍යතා හා ගැලපෙන ගුණාත්මක බවින් ඉහළ උසස් අධ්‍යාපන සේවාවන් සැපයීම සඳහා උසස් අධ්‍යාපන පද්ධතියේ ද, ආයතනවල ද, මානව සම්පත්වල ශක්‍යතාව ප්‍රවර්ධනය කිරීමයි.

**ව්‍යාපෘති අරමුණු:**

- ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ආයතනික රාමුවක් ගොඩනැඟීම
- විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ආර්ථික හා සමාජමය අදාළත්වයත්, ගුණාත්මක බවත් වැඩිදියුණු කිරීම
- විකල්ප උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය නඟා සිටුවීම සඳහා පදනමක් දැමීම
- උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවිධාන ශක්තිය හා මානව සම්පත් වඩා ශක්තිමත් කිරීම සහ අධීක්ෂණ හා අගැයුම් කටයුතු ද, ප්‍රතිපත්ති විග්‍රහයන් හා තොරතුරු බෙදාහැරීමද ප්‍රවර්ධනය කිරීම

**ව්‍යාපෘති සංරචක**

1. උසස් අධ්‍යාපනය සඳහා ප්‍රතිමාන ආයතනගත කිරීම
2. ගුණාත්මක බවින් ඉහළ ඉගැන්වීම් හා ඉගෙනීම් ප්‍රවර්ධනය කිරීම
3. විකල්ප උසස් අධ්‍යාපනය වඩා ශක්තිමත් කිරීම
4. මානව සම්පත් සංවර්ධනය, අධීක්ෂණය හා අගැයීම, අධ්‍යයන හා සන්නිවේදන කටයුතු

**2014 වසරේ භෞතික ප්‍රගතිය**

## 1 වැනි සංරචකය : උසස් අධ්‍යාපනය සඳහා ප්‍රතිමාන ආයතනගත කිරීම

### 1.1 උප සංරචකය : ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව ගොඩනැඟීම

- 2009-2012 කාලය තුළ අධ්‍යයන ක්ෂේත්‍රයේ විද්වතුන්ගෙන් ද, තාක්ෂණික හා වෘත්තීය ක්ෂේත්‍රවල විශේෂඥයන්ගෙන් ද සැදි ජාතික කමිටුවක් විසින් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව සකස් කරනු ලැබ, මුද්‍රණය කරන ලදී.
- සියලු විශ්වවිද්‍යාල විසින් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව වහා ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් 5/2013 අංක දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.
- 2014 දී උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ප්‍රතිඵල පාදක අධ්‍යාපනය හා ශිෂ්‍ය පාදක හැදෑරීම ප්‍රවර්ධනය කිරීම පිළිබඳ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය අන්තර්ගත කිරීම සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව සමාලෝචනය කරන ලදී.
- පවත්නා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව යාවත්කාලීන කොට සියලු අදාළ පාර්ශවයන් හමුවේ අනුමත කරගන්නා ලදී. එහි අවසන් පිටපත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත.

### 1.2 උප සංරචකය: උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බව තහවුරු කිරීමේ පද්ධතියක් ගොඩනැඟීම

- ආයතනික සමාලෝචනවල දෙවැනි වටය විශ්වවිද්‍යාල 12ක සම්පූර්ණ කරන ලදී. නිර්දේශ කර ඇති පරිදි, ඉතිරි විශ්වවිද්‍යාල 3 සමාලෝචනය කිරීමට අපේක්ෂා කරන්නේ සංශෝධිත ආයතන සමාලෝචන මාර්ගෝපදේශය යටතේ ය. එසේ 2 වටයේ සමාලෝචනයට ලක් වී නැති විශ්වවිද්‍යාල 3 වෙත ගොස්, දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
- ආයතනික සමාලෝචන අත්පොත සංශෝධනය කොට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් අනුමත කරන ලදී. එය ඉදිරි ආයතන සමාලෝචනවලදී භාවිතා කිරීම සඳහා 2015 මැයි 12 දින එළිදක්වන ලදී.
- විෂය සමාලෝචනය හා පාඨමාලා සමාලෝචන අත්පොත සංශෝධනය කෙරෙමින් පවතී.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමත මාර්ගෝපදේශ පරිදි සියලු විශ්වවිද්‍යාලවල අභ්‍යන්තර ගුණාත්මක බව තහවුරු කිරීමේ ඒකකයන් නීතිගත කිරීමට පියවර ගනිමින් පවතී. අභ්‍යන්තර ගුණාත්මක බව තහවුරු කිරීමේ ඒකකයන් යළි පණ ගැන්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින්මේ චක්‍රලේඛය නිකුත්කිරීම අපේක්ෂා කෙරේ.
- ගුණාත්මක බව තහවුරු කිරීමේ වැටසටහන්වල ප්‍රතිලාභීන් අතර සමීක්ෂණයක් සිදු කරන ලදී. එහි වාර්තාව ලියැවෙමින් පවතී.
- විකල්ප උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා අත්පොතක් සකසන ලදී.
- උසස් තාක්ෂණ ආයතන 11ක ආයතනික සමාලෝචනය සිදුකරන ලදී. ඒවා නම්, කොළඹ, මහනුවර, ගාල්ල, යාපනය, අම්පාර, ත්‍රිකුණාමලය, දෙහිවල, මඩකලපුව, බදුල්ල, කුරුණෑගල හා කෑගල්ල යන ප්‍රදේශවල උසස් තාක්ෂණ ආයතනයි.

## 2 වැනි සංරචකය : ගුණාත්මක බවින් ඉහළ ඉගැන්වීම් හා ඉගෙනීම් ප්‍රවර්ධනය කිරීම

## 2.1 උප සංරචකය : විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන

රු.මිලියන 721 වටිනාකමින් යුත් විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදානවල ක්‍රියාකාරිත්වය 2014 අවසානයේදී නිමා විය. එහි මූල්‍ය ප්‍රගතිය 94%කි. මූල්‍ය ගනුදෙනු අවසන් කිරීම සඳහා සියලු විශ්වවිද්‍යාලවලට 2015 මාර්තු 31 දින දක්වා මාස 3ක කාලයක් ලබාදෙන ලදී.

**(අ) තොරතුරු තාක්ෂණ කුසලතා වැඩිදියුණු කිරීම**

- 2012/2013 වසර සඳහා විශ්වවිද්‍යාල සිසුන් අතර තොරතුරු තාක්ෂණ කුසලතා පරීක්ෂණ විශ්වවිද්‍යාල පහළොවකපවත්වන ලදී. එහි මූලික හා අතරුමැදි පරීක්ෂණවල ප්‍රතිඵල නිකුත් කොට සහතික පත් ප්‍රදානය කරන ලදී.
- ඉහත පරීක්ෂණවල ඊළඟ වටය සියලු විශ්වවිද්‍යාලවල පැවැත්වීමට කටයුතු කෙරෙමින් පවතී.

**(ආ) ඉංග්‍රීසි භාෂා නිපුණතා වැඩිදියුණු කිරීම**

- 2012/2013 වසර සඳහා විශ්වවිද්‍යාල සිසුන් අතර ඉංග්‍රීසි භාෂා නිපුණතා පරීක්ෂණයේ කියැවීම, ලිවීම, සවන්දීම හා කථන පරීක්ෂණ විශ්වවිද්‍යාල පහළොවක පවත්වන ලදී. එහි ප්‍රතිඵල නිකුත් කොට සහතික පත් ප්‍රදානය කරන ලදී.
- ඉහත පරීක්ෂණවල ඊළඟ වටය සියලු විශ්වවිද්‍යාලවල පැවැත්වීමට කටයුතු කෙරෙමින් පවතී.

**(ඇ) කලා සිසුන් සඳහා නව්‍යකරණ සංවර්ධන ප්‍රදාන**

- විශ්වවිද්‍යාලවල කලා සිසුන්ගේ සේවා නියුක්තිය පිළිබඳ ගැටළුවලට පිළියම් යෙදීම අරමුණු කරගෙන විශ්වවිද්‍යාල කලා පීඨ 11ක පාඨමාලා 17ක් සඳහා දෙන ලද විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන දෙවැනි වටය තවදුරටත් ක්‍රියාකාරීව පවතී.
- මේ යටතේ සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා නිපුණතා හා තොරතුරු තාක්ෂණ කුසලතා ද, මෘදු කුසලතා ද වැඩිදියුණු කිරීමේ කටයුතු තවදුරටත් සිදුවේ.

**(ඈ) බාහිර උපාධි පාඨමාලා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රදාන**

- බාහිර උපාධි පාඨමාලා වැඩසටහන යටතේ බාහිර උපාධි පාඨමාලාවල උපාධිධාරීන්ගේ රැකියා නියුක්තියට අදාළ නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා, ව්‍යාපෘතිය විසින් විවෘත විශ්වවිද්‍යාලය හැර අන් සියලු විශ්වවිද්‍යාලවලට රු. මිලියන 260ක ප්‍රදාන ලබා දී ඇත.
- 2010 ඔක්තෝබර් මස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම නිකුත් කළ 932 චක්‍රලේඛය මගින් නිර්දේශ කරන ලද පුළුල් ප්‍රතිසංස්කරණ සමුදායක ආදේශය ප්‍රවර්ධනය කරන අරමුණින් මේ වැඩසටහන 2012 වසරේදී අරඹන ලදී.
- ඒ යටතේ සිදුවන ක්‍රියාකාරකම්වල යොමුව වූයේ පාලනය හා කළමනාකරණය සහ පාඨමාලාවල අදාළ බව හා ගුණාත්මක බව ද වැඩිදියුණු කිරීම, හැදෑරුම් සහායක පද්ධති හා හැදෑරුම් සම්පත් වැඩිදියුණු කිරීමට ද, උපාධි පිරිනමන විශ්වවිද්‍යාල හා බාහිර පුහුණු ආයතන අතර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමට ද පියවර ගැනීම ය.
- බාහිර උපාධි පාඨමාලාසහ බාහිර පුහුණු ආයතන සඳහා ගුණාත්මන සමාලෝචන අත්පොත් දෙකක් පළ කොට ඇත.

**2.2 උප සංරචකය : ගුණාත්මක බව හා නවෝත්පාදන සඳහා ප්‍රදාන**

- මේ ප්‍රදාන ක්‍රමයේ 1 හා 2 කවුළු යටතේ රු. මිලියන 945ක් වටිනා ප්‍රදාන 40ක් විශ්වවිද්‍යාලවලට ලබා දී ඇත. එසේ දී ඇත්තේ උපාධි පාඨමාලාවල ගුණාත්මක බව හා අදාළ බව වැඩි දියුණු කොට, පාඨමාලා යළි සකසා, 21 වන සියවසේ ශ්‍රම වෙළඳපොලට සරිලන උපාධිධාරීන් බිහිකිරීම සඳහා අවශ්‍ය යටිතළ පහසුකම් සැපයීමට ය.
- මේ ප්‍රදාන ක්‍රමයේ 3 වන කවුළුව යටතේ පශ්චාත් උපාධි ආයතන හා පීඨ 7කට රු. මිලියන 210ක් වටිනා ප්‍රදාන ලබා දී ඇත. ඒ යටතේ පර්යේෂණ දර්ශනවේදී /දර්ශනපති උපාධි 19ක් හා ආචාර්ය උපාධි 41ක් ක්‍රියාත්මක ව පවතී.
- මේ ප්‍රදාන ක්‍රමයේ 4 වන කවුළුව යටතේ පර්යේෂණ වාණිජකරණ ව්‍යාපෘති 11ක් සඳහා රු. මිලියන 110ක් ලබා දී ඇති අතර, එමඟින් රටට ආර්ථික හා සමාජීය ඵලදායිතාවක් ගෙන එන පරිදි විශ්වවිද්‍යාල හා කර්මාන්ත ක්ෂේත්‍රය අතර පවත්නා සම්බන්ධතාවක් ගොඩනඟමින් පවතී.

**3 සංරචකය: විකල්ප උසස් අධ්‍යාපනය වඩා ශක්තිමත් කිරීම**

**3.1 උප සංරචකය : ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනය නවීකරණය කිරීම**

- උසස් තාක්ෂණ ආයතන සඳහා අධ්‍යයන රාමුවක් ගොඩනඟන ලදී.
- පාඨමාලා 12ක පාඨමාලා උපදේශන කමිටු පිහිටුවන ලදී.
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ නායකත්ව හා ගුණාත්මක බව සංවර්ධනය කිරීමේ මධ්‍යස්ථානය ගොඩනැඟීමේ කාර්යය, ඒ සඳහා නිර්දේශිත ඉඩමේ අයිතිය පැවරීමේ ප්‍රශ්නයක් හේතුවෙන් පමා විය. ඒ වෙනුවට උසස් තාක්ෂණ ආයතනය විසින් එය දෙහිවල උසස් තාක්ෂණ පරිශ්‍රයේ පිහිටුවීමට සැළසුම් කොට, මේ වන විට එය ඉදිකිරීමේ කොන්ත්‍රාත්ගිවිසුම් අත්සන් කොට ඇත.
- උසස් තාක්ෂණ ආයතන සඳහා රු. මිලියන 30ක් වටිනා නූතන දැනුම් සම්පත් සපයා ඇත.
  /

**3.2 උප සංරචකය: විකල්ප උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශයෙහි කලාපීය සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම**

- රු. මිලියන 97.8ක් වටිනා තංගල්ල උසස් තාක්ෂණ ආයතන ගොඩනැගිල්ල නිමකොට භාර දෙන ලද අතර, එහි මේ වන විටදෙවැනි වසරේපාඨමාලාපැවැත්වෙමින් පවතී.
- රු. මිලියන 128.8ක් වටිනා රත්නපුර උසස් තාක්ෂණ ආයතන ගොඩනැගිල්ල නිමකොට භාර දෙන ලද අතර, එහි මේ වන විටදෙවැනි වසරේ පාඨමාලාපැවැත්වෙමින් පවතී.
- රු. මිලියන 120ක් වටිනා වවුනියා උසස් තාක්ෂණ ආයතන ගොඩනැගිල්ල නිමකොට භාර දෙන ලද අතර, එහි මේ වන විටපළමු වසරේ පාඨමාලාපැවැත්වෙමින් පවතී.
- තංගල්ල හා රත්නපුර උසස් අධ්‍යාපන ආයතනවලට ලීබඩු හා උපකරණ සැපයීම නිම කොට ඇත. වවුනියා ආයතනයේ ලී බඩු හා උපකරණ ප්‍රසම්පාදනය කෙරෙමින් පවතී.
- තෝරාගත් උසස් තාක්ෂණ ආයතන 6ක් නවීකරණය කිරීම සඳහා රු. මිලියන 31.5ක් වටිනා උපකරණ හා ලීබඩු සපයන ලදී.

**4. සංරචකය : මානව සම්පත් සංවර්ධනය, අධීක්ෂණය හා අගැයීම, අධ්‍යයන හා සන්නිවේදන කටයුතු**

***4.1 උප සංරචකය : මානව සම්පත් සංවර්ධනය***

**(අ) උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා පශ්චාත් උපාධි ප්‍රදාන**

- විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලයට පිරිනමන ලද දර්ශනපති/ආචාර්යඋපාධි ශිෂ්‍යත්ව 170ක අධ්‍යයන කටයුතු සිදුකෙරෙමින් පවතී.
- ඉන් දර්ශනපති/ආචාර්යඋපාධි 66ක් නිම කර ඇත.

- ඔවුන්ගේ පර්යේෂණ ලේඛන 388ක් ප්‍රකාශන සඳහා පිළිගෙන ඇත.
- ඔවුන්ගෙන් 163 දෙනෙකු පර්යේෂණ ලේඛන භාර දී, පිළිගැනීම අපේක්ෂාවෙන් සිටිති.
- 94දෙනෙක් විදේශ සම්මේලනවලට ද. 41 දෙනෙක් ජාතික සම්මේලනවලටද සහභාගී වූහ.
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලයට පිරිනමන ලද ශාස්ත්‍රපති උපාධි ශිෂ්‍යත්ව 68 ක්‍රියාත්මක ව පවතී.

**(ආ) උසස් අධ්‍යාපන ආයතනවල කාර්යමණ්ඩලය සඳහා කෙටිකාලීන පුහුණු වැඩසටහන්**

- විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලයේ 2328ක්, පරිපාලන කාර්ය මණ්ඩලයේ 745ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 335ක් සඳහා කෙටිකාලීන පුහුණුව ලබාදෙන ලදී.
- විවිධ විෂයයන් සඳහා පුහුණු අත්පොත් 39ක් සකසා ඇත.
- සියලු විශ්වවිද්‍යාලවල කාර්යමණ්ඩල පුහුණු කිරීමේ මධ්‍යස්ථාන සංවර්ධනය කරන ලදී.
- මේ මධ්‍යස්ථානවල අධ්‍යයන කාර්යමණ්ඩලයේ 1522 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලා 45ක් පවත්වන ලදී.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා අධ්‍යාපන අංශයක් පිහිටුවන ලදුව, ක්‍රියාත්මක ව පවතී.
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ 606ක් ද, අනධ්‍යයන කාර්යමණ්ඩලයේ 407ක් ද පුහුණු කරන ලදී.

### *4.2 උප සංරචකය - අධීක්ෂණය හා අගැයුම් කටයුතු, ප්‍රතිපත්ති විග්‍රහයන් හා සන්නිවේදන කටයුතු*

- ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු සිදුකෙරෙමින් පවතී.
- 2013දී සංශෝධනය කරන ලද මූල්‍ය වාර්තාකරණ ආකෘති භාවිතා කරමින් වාර්තාකරණය සිදු කෙරේ. විශ්වවිද්‍යාලීය ව්‍යාපෘති කාර්යමණ්ඩලයේ ශක්‍යතා වර්ධනය සඳහා අධීක්ෂණ චාරිකා ද, මූල්‍යකරණය හා වාර්තාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් ද සිදු කරන ලදී.
- ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය කිරීමේ වැඩපිළිවෙළක් ගොඩනගා ඇත. කාලීන ප්‍රසම්පාදන සමාලෝචන සිදුකරන ලද අතර, ක්ෂේත්‍ර චාරිකා මගින් ප්‍රායෝගික ලෙස ගැටළුවලට විසඳුම් හා උපදෙස් සැපයිණි. විශ්වවිද්‍යාලීය ව්‍යාපෘති කාර්යමණ්ඩලයට නොකඩවා ප්‍රසම්පාදන පුහුණුව ලබා දෙන ලදී. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ලිහිල් කිරීම මඟින් ක්‍රියාකාරකම්වල අවහිරතාවලට පිළියම් යොදන ලදී.
- විශ්වවිද්‍යාලවල ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ විභාග, ගුණාත්මක හා නවෝත්පාදන ප්‍රදාන, බාහිර උපාධි ප්‍රදාන, කලා සිසුන් සඳහා නව්‍යකරණ සංවර්ධන ප්‍රදාන සහ පශ්චාත්උපාධි සඳහා ශිෂ්‍යත්ව ප්‍රදාන ක්‍රියාත්මක වෙමින් පවතී. ඒවායෙහි මූල්‍යමය, භෞතික හා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මැනීමට වාර්තාකරණ ක්‍රමවේද සකස් කොට ඇත.
- සියලු විශ්වවිද්‍යාලවල 2014 උපාධිධාරීන් සඳහා රැකියා නියුක්ති සමීක්ෂණ පවත්වන ලද අතර, එහි වාර්තා සැකසෙමින් පවතී.
- ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ 2013 ඩිප්ලෝමාධාරීන් සඳහා රැකියා නියුක්ති සමීක්ෂණය පවත්වා, එහි වාර්තාව නිම කොට ඇත.
- 2013 උපාධිධාරීන්ගේ මෘදු කුසලතාවලට අදාළව සේවා තෘප්තිය මැනීම සඳහා සමීක්ෂණයක් පවත්වන ලද අතර, එහි දත්ත විශ්ලේෂණය කෙරෙමින් පවතී.

**ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය**

66.5 %

**ව්‍යාපෘතියේ මූල්‍යමය ප්‍රගතිය**

රු. මිලියන 2,947.80

58.49%

## ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලීය සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 1 බී

ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලීය සංවර්ධන ව්‍යාපෘතිය - අදියර1-බී, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල සමඟ 2011.12.20 වන දින අත්සන් තබන ලද අංක 836 දරණ ණය ගිවිසුම යටතේ සංස්ථාපනය කරන ලදි. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලයේ යටිතල පහසුකම් තවදුරටත් වැඩි දියුණු කිරීමය. මේ සඳහා රජයේ දායකත්වය ඉදිකිරීම් කටයුතු, පරිපාලන වියදම් හා රජයේ අනිකුත් බදු ද ඇතුලත්ව දළ වශයෙන් රුපියල් මිලියන 448 කි.

කලා හා සංස්කෘතික පීඨය, අරාබි හා ඉස්ලාම් අධ්‍යන පීඨය, වාණිජ හා කලමණාකරණ පීඨය සහ ව්‍යවහාර විද්‍යා පීඨය යන පීඨ 4 කින් සමන්විත අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ කටයුතු අදියර 1- බී යටතේ පුළුල් කිරීමෙන් සමාජීය සහ ආර්ථිකමය සංවර්ධනය කිරීමෙහිලා මූලික කර්ථව්‍යට දායක වේ. එමඟින් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම මූලික වේ.

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලය මඟින් පිරිනමන ලද උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- ප්‍රාදේශීය හා ජාතික අවශ්‍යතාවය මත රැකියා ඉල්ලුමට සරිලන පරිදි උපාධි වැඩසටහන් හඳුන්වා දීම.
- ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සංඛ්‍යාව වැඩි දියුණු කිරීමට අවශ්‍ය අධ්‍යන හා ගොඩනැගිලි සංවර්ධනය සඳහා වූ අනෙකුත් යටිතල පහසුකම් දියුණු කිරීම.

ණය අරමුදල් ප්‍රතිපාදන විස්තර පහත වගුවෙහි දැක්වේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ/අංක | අයිතම | කුවේට් අරමුදලෙන් ප්‍රතිපාදන | | | ඒකාබද්ධ අරමුදලෙන් ප්‍රතිපාදන | | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු. මිලියන |
| | | ප්‍රතිපාදන කුවේට් ඩිනාර් | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය % | රු. මිලියන | % | රු. මිලියන | |
| 1 | ඉදිකිරීම් කටයුතු | 1,700,000.00 | 90% | 805.56 | 10% | 89.51 | 895.06 |
| 2 | බාහිර කටයුතු | 450,000.00 | 90% | 213.24 | 10% | 23.69 | 236.93 |
| 3 | ලී බඩු හා උපකරණ | 320,000.00 | 80% | 151.63 | 20% | 37.91 | 189.54 |
| 4 | උපදේශක සේවා | 200,000.00 | 100% | 94.77 | 0 | 0 | 94.77 |
| 5 | අසම්භාව්‍ය බැරකම් | 330,000.00 | 90% | 156.37 | 10% | 17.37 | 173.75 |
| **මුළු එකතුව** | | **3,000,000.00** | | **1,421.57** | | **168.48** | **1,590.05** |
| **මුළු මුදලෙන් 12% ක එකතු කල වටිනාකම මත බදු මුදලක් ඒකාබද්ධ අරමුදලෙන්** | | | | | | | **190.81** |
| **මුළු මුදලෙන් 2% ක ජාතික ගොඩනැගිලි බද්ධ ඒකාබද්ධ අරමුදලෙන්** | | | | | | | **31.80** |
| **මුළු එකතුව** | | | | | | | **1,812.66** |

- පරිපාලන වියදම් රු. මිලියන 57.00

අදියර1 - බී යටතේ කිරීමට නියමිත යටිතල පහසුකම් සංවර්ධන කටයුතු පහත පරිදි වේ.

| අ/අංක | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ගත මුළු පිරිවැය | කොන්ත්‍රාත් කාලය මාස |
|---|---|---|---|
| 01 | ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා වූ ගොඩනැගිලි සංකීර්ණය - ඔලුවිල් | 302 | 18 |
| 02 | ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා වූ ගොඩනැගිලි සංකීර්ණය - සමන්තුරේ | 130 | 18 |
| 03 | අධ්‍යාපන වැඩසටහන් මධ්‍යස්ථානය - ගල්කිස්ස | 69 | 12 |
| 04 | ජල විද්‍යාගාර ගොඩනැගිල්ල - ඔලුවිල් | 252 | 18 |
| 05 | කාර්ය මණ්ඩල සඳහා වූ නිල නිවාස - ඔලුවිල් | 168 | 12 |
| 06 | පොදු භෝජනාගාරය | 70 | 9 |
| 07 | ශ්‍රවණාගාරය | 200 | 15 |
| 08 | ක්‍රීඩා පිටිය හා ක්‍රීඩා සංකීර්ණය කටයුතු පුළුල් කිරීම - ඔලුවිල් | 70 | 8 |

ව්‍යාපෘතිය සමග 2012.12.05 දින අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව ඉහත සඳහන් කොන්ත්‍රාත් කටයුතු සඳහා උපදේශක සේවාවන් සපයනු ලබනුයේ ඇවන්ඩ් ගාඩ් ආයතනය විසිනි.

ඉහත සංවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා පිරිනමන ලද කොන්ත්‍රාත් හා සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

| **ගිවිසුම් අංකය** | **ව්‍යාපෘතියේ නම** | **ගිවිසුම් ප්‍රකාර වටිනාකම රු. (වැට් හැර)** | **කොන්ත්‍රාත්කරු ගේ නම** | **ගිවිසුම් අත්සන් කරන ලද දිනය** |
|---|---|---|---|---|
| SEUDP/CW/01 | ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා වූ ගොඩනැගිලි සංකීර්ණය - ඔලුවිල් | 263,886,708.60 | එඩ්වර්ඩ් සහ ක්‍රිස්ටි | 05.06.2014 |
| SEUDP/CW/02 | ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා වූ ගොඩනැගිලි සංකීර්ණය - සමන්තුරේ | 117,558,557.00 | සෙන්ට්‍රල් සප්ලයර්ස් | 30.05.2014 |
| SEUDP/CW/03 | අධ්‍යාපන වැඩසටහන් මධ්‍යස්ථානය - ගල්කිස්ස | 64,850,953.00 | පන්තිල සිවිල් ඉන්ජිනියර්ස් | 30.05.2014 |
| SEUDP/CW/04 | ජල විද්‍යාගාර ගොඩනැගිල්ල - ඔලුවිල් | 263,334,385.00 | ඩැරින්ටන් කන්ස්ට්‍රක්ෂන් | 30.10.2014 |
| SEUDP/CW/05 | කාර්ය මණ්ඩල සඳහා වූ නිල නිවාස - ඔලුවිල් | 173,129,132.00 | එඩ්වර්ඩ් සහ ක්‍රිස්ටි | 30.10.2014 |

ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලීය සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 1- බී පහත සඳහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විතය.

| **තනතුරු** | **සේවක සංඛ්‍යාව** |
|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂක | 1 |
| * ව්‍යාපෘති ඉංජිනේරු | 1 |
| ** ව්‍යාපෘති ගණකාධිකාරී | 1 |
| ව්‍යාපෘති ලේකම් | 1 |
| *** වැඩබිම් සම්බන්ධීකාරක | 1 |
| කළමනාකරණ සහකාරක/ගිණුම් සහකාරක | 1 |
| **** කාර්යාල කාර්ය සහයක | 1 |
| රියදුරු | 1 |

* සෝමනාත් ගමගේ මහතා 2013 ජුනි මස 13 දින සිට ව්‍යාපෘති ඉංජිනේරු ලෙස සේවය කරනු ලැබේ.

** ඩබ්ලිව්.ඩී.එල් දුෂ්මන්ත මහතා 2013 නොවැම්බර් මස 25 දින සිට ව්‍යාපෘති ගණකාධිකාරී ලෙස සේවය කරනු ලැබේ.

*** ඩී. එම් රංජිත් බණ්ඩාර මහතා වැඩබිම් සම්බන්ධීකාරක ලෙස පත්වීම් ලැබ ඇත්තේ 2013 ජනවාරි මස 01 වන දින වන අතර ඔහු 2014.12.31 දින ඉල්ලා අස්වී ඇත.

**** එච්.එම්. ප්‍රියන්ත විජය බණ්ඩාර මහතා කාර්යාල කාර්ය සහයක ලෙස පත්වීම් ලැබ ඇත්තේ 2014 දෙසැම්බර් මස 01 වන දින සිටය.

සෙසු නිලධාරීන් සියළු දෙනා ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලීය සංවර්ධන ව්‍යාපෘතිය - අදියර1- බී යටතේ 2012 සැත්තැම්බර් මස 01 දින සිට අදාල තනතුරු වල සේවය කරනු ලැබේ.

**ශ්‍රී ලංකා අග්නිදිග විශ්ව විද්‍යාලීය සංවර්ධන ව්‍යාපෘතිය - අදියර1- බී**

**2014 වර්ෂය සඳහා වූ වියදම් සාරංශය**

| විස්තරය | එකතුව |
|---|---|
| කාර්යාල ගොඩනැගිලි කුලී සහ ඒ සම්බන්ධ වියදම් | **1,272,450.76** |
| කාර්යාල ගෘහභාණ්ඩ | **0.00** |
| කාර්යාල උපකරණ | **646,496.00** |
| විදුලිය | **468,153.32** |
| ජල බිල්පත් | **7,060.78** |
| සන්නිවේදනය | **153,094.84** |
| කාර්‍ය මණ්ඩල වැටුප් | **5,000,705.83** |
| අතිකාල දීමනා සහ සංයුක්ත දීමනා | **247,000.25** |
| ප්‍රවාහන | **1,504,505.99** |
| ලිපි ද්‍රව්‍ය අවශ්‍යතා | **211,024.00** |
| පුවත්පත් හා දැන්වීම් | **11,950.00** |
| මුද්දර ගාස්තු | **54,758.72** |
| වැඩබිම් නඩත්තු හා අළුත්වැඩියා කටයුතු | **85,070.80** |
| කාර්‍ය මණ්ඩල පුහුණු වැඩසටහන් | **859,439.44** |
| පොත් හා ප්‍රකාශන | **0.00** |
| ආරක්ෂක වියදම් | **0.00** |
| අධීක්ෂණ හා ඇගයීම් කටයුතු | **268,880.41** |
| අනෙකුත් වියදම් | **3,325.00** |
| උපදේශක සේවා ගාස්තු :දේශීය* | **6,577,801.97** |
| ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා වූ ගොඩනැගිලි සංකීර්ණය - සමන්තුරේ | **34,571,947.29** |
| අධ්‍යාපන වැඩසටහන් මධ්‍යස්ථානය - ගල්කිස්ස | **24,809,638.48** |
| ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා වූ ගොඩනැගිලි සංකීර්ණය - ඔලුවිල් | **90,349,643.15** |
| ජල විද්‍යාගාර ගොඩනැගිල්ල - ඔලුවිල් | **48,978,877.00** |
| කාර්ය මණ්ඩල සඳහා වූ නිල නිවාස - ඔලුවිල් | **34,075,826.40** |
| **මුළු එකතුව** | **250,157,650.43** |

| | |
|---|---|
| උපදේශක සේවා ගාස්තු (විදේශීය ඇ.ඩො.) | **26,462.21** |

2014 වර්ෂයේ ව්‍යාපෘතිය විසින් කරනු ලබන මූලික කටයුතු පහත පරිදි වේ

- මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම
- ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- ප්‍රසම්පාදන ලේඛණ සැකසීම
- ප්‍රසම්පාදන හා තාක්ෂණික කමිටු රැස්වීම් පවත්වා අදාල නිර්දේශ හා අනුමැතියන් ලබා ගැනීම
- ප්‍රසම්පාදන හා තාක්ෂණික කමිටු රැස්වීම් පැවැත්වීට අදාල වාර්තා සැකසීම
- කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලේඛණ සැකසීම සහ ඊට අදාල කටයුතු
- 2013 අවසන් ගිණුම් පිලියෙල කිරීම
- විසර්ජන ගිණුම් පිලියෙල කිරීම
- 2014 ප්‍රගති වාර්තා පිලියෙල කිරීම
- මාසික ගිණුම් සාරංශ පිලියෙල කිරීම
- වාර්ෂික අයවැය වාර්තා පිලියෙල කිරීම
- ව්‍යාපෘතියෙහි විස්තර ව්‍යාපෘති කළමණාකරන හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ දත්ත සමුදායෙහි යාවත්කාලීන කිරීම
- වියදම් ප්‍රතිපූර්ණ කිරීමේ ලියකියවිලි සැකසීම
- භාණ්ඩ සමීක්ෂණ රැස්වීම් පැවැත්වීම
- ඇස්තමේන්තු වාර්තා සැකසීම
- අමාත්‍යංශය විසින් නියම කරන ලද සියළු වාර්තා දත්ත නිසි වේලාවට ලබා දීම

දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය (EKSP)

**දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය යටතේ ලැබුණු ආධාර පහත සදහන් පරිදි අංශ 03 ක් යටතේ භාවිතා කරන ලදී.**

**1. ඉදිකිරීම් සහ අලුත්වැඩියා කිරීම්**

| උසස් තාක්‍ෂණ ආයතනය | කාර්යය | නිමකරන ලද දිනය | අනුමත අවසාන ගෙවීම |
|---|---|---|---|
| දෙහිවල | තාප්පය අලුත්වැඩියා කිරීම සහ ඉදි කිරීම | 2014-03-04 | 3,901,090.00 |
| | කාන්තා නේවාසිකාගාරය අලුත්වැඩියා කිරීම | 2014-02-04 | 5,282,630.00 |
| | අභ්‍යන්තර මාර්ග පිළිසකර කිරීම | 2014-02-14 | 4,984,079.00 |
| | ගල් වැටියක් ඉදි කිරීම | 2014-02-14 | 2,148,300.00 |
| | තුන් මහල් ගොඩනැගිල්ලක් උපදේශන ශාලාව, පොත්හල සහ ගබඩාවක් බවට හැරවීම සහ  අලුත්වැඩියා කිරීම | 2013-12-18 | 2,651,390.00 |
| | පුස්තකාලය අලුත්වැඩියා කිරීම | 2013-12-04 | 1,638,100.00 |
| | පරිපාලන ගොඩනැගිල්ල සහ දේශන ශාලාව අලුත්වැඩියා කිරීම | 2014-05-02 | 5,430,434.64 |
| | පරිපාලන ගොඩනැගිල්ල හා දේශන ශාලාවේ විදුලි පරිපථ කටයුතු | 2014-05-02 | 1,084,421.60 |
| | කාන්තා නේවාසිකාගාරයේ  විදුලි පරිපථ කටයුතු | 2014-03-12 | 506,140.00 |
| | දෙමහල් ආරක්ෂක ගොඩනැගිල්ක් සහ දෘඩාංග විද්‍යාගාරයක් ඉදි කිරීම | 2014-03-12 | 3,901,355.00 |
| | | | |
| ගාල්ල | පාපැදි නැවතුම් ස්ථානය සහ තාප්පය ඉදි කිරීම | 2014-03-04 | 1,887,844.91 |
| | වායු සමීකරණ සැපයීම | 2014.03.19 | 1,369,237.30 |
| | තාප්පය ඉදි කිරීම | 2014-03-04 | 784,368.77 |
| | අභ්‍යන්තර මාර්ග පිළිසකර කිරීම | 2014-02-04 | 585,367.20 |
| | උසස් තාක්ෂණ ආයතනයේ අලුත්වැඩියා කටයුතු | 2014-05-04 | 3,858,274.37 |
| | වැඩහල් ගොඩනැගිල්ලේ යකඩ දැල් කවුළු සැපයීම සහ සවිකරීම | 2014-03-04 | 1,591,524.20 |
| | | | |
| කුරුණෑගල | සිවිලිම ඉදි කිරීම | 2013-12-22 | 948,400.00 |
| | | | |
| ත්‍රීකුණාමලය | ආපනශාලාව සහ පොදු ශාලාව ඉදි කිරීම | 2014-04-19 | 3,682,582.51 |
| | පවත්නා ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම | 2014-02-22 | 1,894,052.00 |
| | | | |

| | | | |
|---|---|---|---|
| <u>ගම්පහ</u> | කාර්ය මණ්ඩල විවේකාගාර හා පුස්තකාලය බෙදා වෙන් කිරීම හා ගබඩා කාමරයක් ඉදි කිරීම | 2014-03-27 | 2,413,271.15 |
| | තාප්පය ඉදි කිරීම | 2014-03-27 | 3,369,861.00 |
| | උසස් තාක්ෂණ ආයතනයට ජල සැපයුම | 2014-02-12 | 1,277,685.00 |
| | පැරණි ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම ( ආපන ශාලාව ) | 2014-04-03 | 2,534,968.48 |
| | | | |
| <u>යාපනය</u> | ආපන ශාලාව ඉදි කිරීම | 2014-05-24 | 5,312,655.00 |
| | | | |
| <u>මහනුවර</u> | කාර්ය මණ්ඩල විවේකාගාර කුටි හා පුස්තකාලය සඳහා බෙදුම් ආවාර (Fixing Partition) සැපයීම සහ සවිකරීම | 2014-03-21 | 1,170,281.10 |
| | දැනට පවතී ජනේල සඳහා යකඩ දැල් කවුළු හා තරප්පුපෙළ සැපයීම සහ සවිකරීම | 2014-04-27 | 1,777,927.40 |
| | යෝජිත විදුලි උත්පාදක යන්ත්‍ර කාමරය සහ ට්‍රාන්ස්ෆෝමර කාමරය ඉදි කිරීම | 2014-04-27 | 1,816,083.54 |
| | විදුලි පරිපථ සවි කිරීම | 2014-04-30 | 8,046,558.76 |
| | මහනුවර උසස් තාක්ෂණ ආයතනය අලුත්වැඩියා කිරීම | 2014-04-30 | 972,093.31 |
| | | | |
| <u>කෑගල්ල</u> | ගල් වැටියක් ඉදි කිරීම | 2014-05-28 | 4,829,821.00 |
| | | | |
| <u>කොළඹ</u> | කි.වො 64ක සූර්ය බලතාපක යන්ත්‍රය සැපයීම සහ සවි කිරීම | 2014-04-10 | 13,340,000.00 |
| | | වැයකරන ලද මුදල | **94,990,797.22** |

දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය (EKSP) මඟින් ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ (2014-01-01/2014-12-31)

| අයිතම අංකය | විස්තරය | ප්‍රමාණය | මුළු මුදල වැට් බදු රහිතව (රු) |
|---|---|---|---|
| 1 | පරිගණක (HP ProDesk 400 GI Business PC) | 1,000 | 89,970,000.00 |
| 2 | DCP 650 VA UPS | 1,200 | 5,604,000.00 |
| 3 | Epson K100 Inkjet පරිගණක මුද්‍රණ යන්ත්‍රය | 100 | 2,107,500.00 |
| 4 | ලැප්ටොප් පරිගණක | 335 | 30,252,175.00 |
| 5 | බහු මාධ්‍ය ප්‍රක්ෂේපක (Multimedia Projector) | 125 | 7,412,500.00 |
| 6 | ඡායා පිටපත් යන්ත්‍ර | 36 | 4,176,000.00 |
| එකතුව | | | **139,522,175.00** |